# කාර්ය සාධන වාර්තාව

# 2025

## ශ්‍රී ලංකා පොලීසිය

# 2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# ශ්‍රී ලංකා පොලීසිය

# වැය ශීර්ෂ අංකය - 225

අන්තර්ගතය


| | |
|---|---|
| පරිච්ඡේදය 01 | ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය |
| පරිච්ඡේදය 02 | ප්‍රගතිය හා ඉදිරි දැක්ම |
| පරිච්ඡේදය 03 | වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය |
| පරිච්ඡේදය 04 | කාර්ය සාධන දර්ශක |
| පරිච්ඡේදය 05 | තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය |
| පරිච්ඡේදය 06 | මානව සම්පත් පැතිකඩ |
| පරිච්ඡේදය 07 | අනුකූලතා වාර්තාව |

# පටුන


පරිච්ඡේදය 01 ........................................ 1

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........................................ 1

1.1 හැඳින්වීම ........................................ 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු ........................................ 3

1.3 ප්‍රධාන කාර්යයන් ........................................ 5

1.4 සංවිධාන සටහන ........................................ 6

1.5 ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන අංශ ........................................ 7

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනගත අරමුදල් ........................................ 10

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ........................................ 10

පරිච්ඡේදය 02 ........................................ 11

ප්‍රගතිය හා ඉදිරි දැක්ම ........................................ 11

ප්‍රගතිය - 2025 ........................................ 11

2.1 අපරාධ, මත්ද්‍රව්‍ය අපරාධ, සුරාබදු හා වෙනත් වැරදි ........................................ 11

2.1.1 බල අපරාධ ........................................ 11

2.1.1 (අ) කාන්තාවන්ට එරෙහි බල අපරාධ ........................................ 15

2.1.1 (ආ) ළමයින්ට එරෙහි බල අපරාධ ........................................ 17

2.1.1 (ඇ) ශරීරය පිළිබඳ වැරදි ........................................ 19

2.1.1 (ඈ) දේපළ පිළිබඳ වැරදි ........................................ 20

2.1.1 (ඉ) ගොදුරු විරහිත වැරදි ........................................ 21

2.1.2 සුළු අපරාධ ........................................ 22

2.1.2 (අ) පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ ........................................ 22

2.1.2 (ආ) කාන්තාවන්ට සහ ළමයින්ට එරෙහි සුළු අපරාධ ........................................ 25

2.1.2 (ඇ) ළමා හා කාන්තා හිංසනය සහ අපරාධ නිවාරණ වැඩසටහන් ........................................ 29

2.1.2 (ඈ) දේපළ වලට එරෙහි සුළු අපරාධ ........................................ 29

2.1.3 මත්ද්‍රව්‍ය අපරාධ ........................................ 32

2.1.4 සුරාබදු වැරදි ........................................ 35

2.1.5 ව්‍යවස්ථාපිත වැරදි ........................................ 38

2.1.6 දුරාචාරය සම්බන්ධ දූෂණ වැරදි ........................................ 40

2.1.7 අපරාධ විමර්ශනය සහ නිවාරණ සඳහා නව තාක්ෂණික ක්‍රමවේදයන්හි දායකත්වය ........................................ 41

2.2 පොලිස් විශේෂ කාර්ය බලකා වැටලීම් ........................................ 42

2.3 විවිධ පැමිණිලි ........................................ 44

2.4 රිය අනතුරු ........................................ 46

2.4.1 අධිවේගී මාර්ග ආශ්‍රිත රිය අනතුරු ........................................ 46

2.4.2 රිය අනතුරු වැළැක්වීමේ ක්‍රියාමාර්ග ........................................................................................46
2.4.3 රථවාහන වැරදි සඳහා දඩපත් මගින් හා අධිකරණයෙන් උපයා දෙන ලද ආදායම ..................................48
2.5 වෙනත් මහජන සේවාවන් ........................................................................................48
2.5.1 මහජන පැමිණිලි විසඳීමේ විශේෂිත සේවා ........................................................................................49
2.5.2 නිෂ්කාශන වාර්තා........................................................................................50
2.5.3 ප්‍රජා පොලිස් සේවය ........................................................................................50
2.5.4 මහජන සාමය කළමනාකරණය ........................................................................................51
2.6. පොලිස් වෛද්‍ය සේවාව........................................................................................51
2.6.1 පොලිස් නිලධරයන්ගේ මරණ ........................................................................................52
2.7 බඳවා ගැනීම්, උසස් කිරීම් සහ ස්ථාන මාරු කිරීම්. ........................................................................................52
2.8 භෞතික සම්පත් සංවර්ධනය. ........................................................................................54
2.8.1 ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම්. ........................................................................................54
2.8.2 පොලිස් ස්ථාන, පොලිස් කොට්ඨාස හා මුරකුටි ආරම්භ කිරීම. ........................................................................................55
2.8.3 ශ්‍රී ලංකා පොලීසිය සතු වාහන. ........................................................................................56
2.8.4 වෙනත් භෞතික සම්පත්. ........................................................................................58
2.8.5 ඉඩම් සහ ගොඩනැගිලි පරිහරණය. ........................................................................................58
2.8.6 භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ ප්‍රගතිය. ........................................................................................59
2.9 ශ්‍රී ලංකා පොලීසියේ ඉදිරි ඉලක්ක........................................................................................61
2.9.1 අපරාධ විමර්ශනය හා මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ ඉදිරි ඉලක්ක. ........................................................................................61
2.9.2 රිය අනතුරු වැළැක්වීම සම්බන්ධ ඉදිරි ඉලක්ක. ........................................................................................62
2.9.3 මානව සම්පත් සංවර්ධනය සම්බන්ධ ඉදිරි ඉලක්ක. ........................................................................................63
2.9.4 භෞතික සම්පත් සංවර්ධන ඉලක්ක. ........................................................................................64
2.9.5 නව තාක්ෂණය භාවිත කිරීමේ ඉදිරි ඉලක්ක. ........................................................................................65
පරිච්ඡේදය 03 ........................................................................................ 67
වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ........................................................................................ 67
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ........................................................................................67
3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........................................................................................68
3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ........................................................................................69
3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් ........................................................................................70
3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ........................................................................................70
3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........................................................................................70
3.8 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ........................................................................................71
3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........................................................................................72

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව ........................................................................................................73

පරිච්ඡේදය 04 ........................................................................................................ 85

කාර්ය සාධන දර්ශක ........................................................................................................ 85

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ........................................................85

පරිච්ඡේදය 05 ........................................................................................................ 86

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ........................................................ 86

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු ........................................................86

පරිච්ඡේදය 06 ........................................................................................................ 92

මානව සම්පත් පැතිකඩ ........................................................................................................ 92

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........................................................................................................92

6.2 ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය. 95

6.3 මානව සම්පත් සංවර්ධනය ........................................................................................................96

පරිච්ඡේදය 07 ........................................................................................................ 103

7.1 අනුකූලතා වාර්තාව ........................................................................................................103

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

1865 අංක 16 දරන පොලිස් ආඥා පනත මගින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා පොලිස් සේවය, බ්‍රිතාන්‍ය පාලන සමයේ එනම් **1866 සැප්තැම්බර් මස 03** වන දින සිය නිල කටයුතු ආරම්භ කරන ලදී. එදා සිට මේ දක්වා වසර **159** කට අධික අභිමානවත් ඉතිහාසයක් සතු ශ්‍රී ලංකා පොලීසිය, මෙරට නීතිය හා සාමය සුරක්ෂිත කිරීමේ ප්‍රධාන වගකීම අඛණ්ඩව ඉටු කරනු ලබයි.

ජන ජීවිතයේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ පුළුල් මෙහෙවර යටතේ ශ්‍රී ලංකා පොලීසිය පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කරයි.

- **අපරාධ මර්දනය හා නිවාරණය:** සමාජ සාමය සහ යහපැවැත්ම තහවුරු කිරීම.
- **මත්ද්‍රව්‍ය හා දූෂණ මර්දනය:** මත් උවදුර මැඩලීම සහ විෂමාචාර වැළැක්වීම.
- **මහජන සේවය:** රථ වාහන පාලනය, පරිසර ආරක්ෂණය සහ ප්‍රභූ ආරක්ෂාව සැපයීම.
- **හදිසි ප්‍රතිචාර:** 119 හදිසි ඇමතුම් සේවාව සහ මහජන පැමිණිලි විමර්ශනය.
- **පරිපාලන සහාය:** නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම ඇතුළු අනෙකුත් මහජන සේවාවන්.

ආයතනික කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක වන විධිමත් නිල ධූරාවලිය පොලිස්පතිවරයාගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙහෙයවනු ලැබේ. සංවිධානාත්මක ව්‍යුහයේ ඉහළින්ම ක්‍රියාත්මක වන තනතුර වන පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ව්‍යුහයේ අනෙකුත් තනතුරු ක්‍රියාත්මක වන අතර, ඒ අනුව පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, පොලිස් අධිකාරී, සහකාර පොලිස් අධිකාරී, ප්‍රධාන පොලිස් පරීක්ෂක, පොලිස් පරීක්ෂක, උප පොලිස් පරීක්ෂක, මහ සැරයන්, පොලිස් සැරයන්, පොලිස් සැරයන් රියදුරු, පොලිස් කොස්තාපල්, පොලිස් කොස්තාපල් රියදුරු ලෙස නිල ධූරාවලිය ඉහල සිට පහළට ක්‍රියාත්මක වේ.

මෙම නිල ධූරාවලිය ආයතනගත ව්‍යුහයක් මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, එම ව්‍යුහය ප්‍රධාන වශයෙන් ජනතාව සමග සෘජුවම සම්බන්ධ වන ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස සහ එම ප්‍රාදේශීය කොට්ඨාස වල රාජකාරි සඳහා පරිපාලනමය හා සහයෝගාත්මක සේවාවන් සපයනු ලබන ක්‍රියාකාරී කොට්ඨාස ලෙස වර්ග දෙකකට බෙදා දැක්විය හැකිය.

ප්‍රාදේශීය කොට්ඨාස ව්‍යුහයේ ඉහළින්ම පළාත් නියෝජනය වන අතර, එහි කටයුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු යටතේ ක්‍රියාත්මක වේ. පළාතට අයත් සෑම දිස්ත්‍රික්කයක් භාරවම නියෝජ්‍ය පොලිස්පතිවරයකු පත් කර ඇති අතර, ඔහු යටතේ පවතින දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස කිහිපයකට බෙදා පාලනය කෙරේ. එබඳු ප්‍රාදේශීය පොලිස් කොට්ඨාසයක් භාරව කොට්ඨාස භාර නිලධාරී ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වරයකු හෝ පොලිස් අධිකාරී වරයකු පත් කර ඇති අතර, එබඳු ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස 47 ක් දිවයින තුළ ක්‍රියාත්මක වේ. එම ප්‍රාදේශීය පොලිස් කොට්ඨාසයක් පොලිස් දිස්ත්‍රික්ක කිහිපයකට බෙදා එම දිස්ත්‍රික්කයක් සහකාර පොලිස් අධිකාරී වරයකු යටතට පත් කොට ඇති අතර, එබඳු පොලිස් දිස්ත්‍රික්කයකට පොලිස් ස්ථාන කිහිපයක් ඇතුළත් කොට ඇත. මෙවැනි පොලිස් දිස්ත්‍රික්ක 199 ක් දිවයින තුළ පිහිටා ඇති අතර, 2025.12.31 දිනට එම පොලිස් දිස්ත්‍රික්ක වලට අයත් පොලිස් ස්ථාන 608 ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ.

සියලු පොලිස් ස්ථාන, මූලස්ථාන පොලිස් ස්ථාන හා සාමාන්‍ය පොලිස් ස්ථාන ලෙස වර්ග කොට සෑම පොලිස් ස්ථානයක්ම විවිධ මට්ටම් යටතේ ශ්‍රේණිගත කොට ඇත. ඒ අනුව A1 ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 82 ක්ද, A2 ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 103 ක්ද, A3 ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 142 ක්ද, B ශ්‍රේණියේ පොලිස් ස්ථාන 152 ක්ද, C ශ්‍රේණියේ පොලිස් ස්ථාන 75 ක්, සහ D ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 54 ක්ද ලෙස 2025.12.31 දිනට එම පොලිස් ස්ථාන 608 ශ්‍රේණිගත කර ඇත. මූලස්ථාන පොලිස් ස්ථානයක් භාරව ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු සහ අනෙකුත් පොලිස් ස්ථාන භාරව ස්ථානාධිපති වරයෙකු ලෙස ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු හෝ පොලිස් පරීක්ෂකවරයෙකු පත්කොට ඇති අතර ඔවුන් විසින් තමන් යටතේ සේවය කරන පොලිස් පරීක්ෂකවරුන්, පොලිස් සැරයන්වරුන් සහ පොලිස් කොස්තාපල්වරුන් මගින් සෘජුවම මහ ජනතාව වෙත පොලිසියේ සේවාවන් ක්‍රියාත්මක කරනු ලබයි.

පොලීසියේ කාර්යභාරයට අදාල විවිධ විෂයයන් සම්බන්ධයෙන් ද නිල ධූරාවලියක් ක්‍රියාත්මක වේ. ඒ අනුව අපරාධ, මත්ද්‍රව්‍යය අපරාධ, රථ වාහන, ප්‍රභූ ආරක්ෂාව, විශේෂකාර්ය බලකාය, සහයක සේවා, ප්‍රවර්තන ආදී විෂයයන් භාරව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුන් පත්කොට ඇති අතර ඔවුන් යටතේ දිසාවන් ලෙස විෂයයන් එකක් හෝ කිහිපයක් එක් කොට එබඳු දිසාවක් භාරව නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු පත් කර ඇත. එම දිසාවන් යටතට ගැනෙන ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස 77 ක් 2025.12.31 දින වන විට ක්‍රියාත්මකව පවතින අතර එම කොට්ඨාස භාරව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු හෝ පොලිස් අධිකාරීවරයෙකු, අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කොට අදාළ කොට්ඨාසයේ පරිපාලන කටයුතු ක්‍රියාත්මක කෙරේ.

ශ්‍රී ලංකා පොලීසිය සතු විශේෂිත අංශයක් වන විශේෂ කාර්ය බලකාය ද සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබන කොට්ඨාසයකි. විවිධ වැටලීම් මගින් දූෂණ හා අපරාධ මර්දනය සඳහා කාර්යක්ෂම දායකත්වයක් ශ්‍රී ලංකා පොලීසිය වෙත ලබා දෙන විශේෂ කාර්ය බලකාය සතු නිලධරයන් සංඛ්‍යාව 7606 කි.

පොලිස් රාජකාරී සඳහා අවශ්‍ය විවිධ විශේෂඥ දැනුම ලබා ගැනිම සඳහා සහයක සේවාවක් ද, ක්‍රියාත්මකව පවතින අතර ඒ යටතේ වෛද්‍ය, හෙද, ඉංජිනේරු, සූපවේදී, කාර්මික, තොරතුරු තාක්ෂණය වැනි විශේෂිත සේවාවන් සඳහා 1078 ක නිලධරයන් සංඛ්‍යාවක් සුවිශේෂී රාජකාරියක නියැලී සිටී. මීට අමතරව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන්, සැලසුම් සේවයේ නිලධරයන් සහ රජයේ විවිධ සේවාවන්ට අයත් ගණකාධිකාරී, පරිපාලන නිලධාරී, භාෂා පරිවර්තක, සංවර්ධන නිලධාරී, කළමනාකරණ සහකාර, කාර්යාල කාර්ය සහයක වැනි දෙපාර්තමේන්තුගත නොවන තනතුරු වලට අයත් නිලධරයන් සහ අපරාධ විද්‍යාඥ, පර්යේෂණ නිලධාරී, සංවර්ධන සහකාර නිලධාරී සහ විවිධ කම්කරු වෘත්තීන්ට අයත් දෙපාර්තමේන්තුගත නිලධරයන්ද ඇතුළත් සිවිල් කාර්යමණ්ඩල නිලධරයන් 6206 දෙනෙකු පොලිස් රාජකාරී සඳහා සුවිශේෂී සහයක් ලබා දෙමින් සේවයේ යෙදී සිටී.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු



**දැක්ම**

අපරාධ සහ ප්‍රචණ්ඩත්වය
පිළිබඳව බියකින් තොරව
විශ්වාසයෙන් යුතුව
ජීවත් වීමට හැකි සාමකාමී
පරිසරයක් බිහි
කිරීම.

**මෙහෙවර**

සැමට සමාන,
කිසිවෙකුටත්
අගතියකින් තොරව
අපරාධ සහ
ත්‍රස්තවාදය
වැළැක්වීමටත්, සාමය
ආරක්ෂා කරගැනීමටත්,
දිවයිනේ නීතිය
පවත්වාගෙන යාමට සහ
එය ක්‍රියාත්මක කිරීමටත්
ශ්‍රී ලංකා පොලීසිය
විශ්වාසයෙන් යුතුව ක්‍රියා
කිරීමට ඇප කැප වී සිටියි.

## අරමුණු

- ජාතික ආරක්‍ෂාව සුරක්‍ෂිත කිරීම.
- නීතිය හා සාමය පවත්වාගෙන යාම.
- අපරාධ නිවාරණය.
- මත්ද්‍රව්‍ය නිවාරණය.
- මාර්ග ආරක්‍ෂාව තහවුරු කිරීම.
- පරිසරය ආරක්‍ෂා කිරීම.
- සැමට සමානව, කිසිවකුට අගතියකින් තොරව මහජන මිත්‍රශීලී පොලිස් සේවයක් පවත්වාගෙන යාම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ජාතික ආරක්ෂාවට බලපාන තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය, බුද්ධි තොරතුරු බෙදා හැරීම හා විමර්ශනය සඳහා යොමු කිරීම.
- ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ක්‍රියා පිළිබඳ ව විමර්ශනය, නඩු පැවරීමට පියවර ගැනීම හා අධිකරණ ක්‍රියාවලියට සහාය වීම.
- මහජන සාමයට බාධාවන ක්‍රියා පිළිබඳ ව තොරතුරු ලබා ගැනීම, විමර්ශනය, අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම.
- වාර්තා වන විවිධ පැමිණිලි කඩිනමින් විමර්ශනය කිරීම, විසඳීම, විසඳීම සඳහා බලධාරී ආයතන වෙත යොමු කිරීම, අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම.
- ව්‍යවස්ථාපිත බලතල ප්‍රකාරව ක්‍රියාකරමින් දිවයින තුළ නීතිය හා සාමය පවත්වාගෙන යාම.
- අපරාධ නිවාරණය සඳහා නිසි පියවර ගැනීම.
- අපරාධකරුවන් පිළිබඳ පරිපාලනය.
- අපරාධ හා වැරදි (ගෝලීය අපරාධ ද ඇතුළත්ව) පිළිබඳ විමර්ශනය, නඩු පැවරීම හා ඉදිරි අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම.
- අපරාධ විමර්ශනය සඳහා නවීන තාක්‍ෂණය හා විද්‍යාත්මක ක්‍රමවේද භාවිතා කිරීම සහ අවස්ථානුකූලව දේශීය හා විදේශීය විශේෂඥ සහය ලබා ගැනීම.
- අවදානම් සහගත කණ්ඩායම් ඉලක්ක කරමින් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනයට යොමු කිරීම සඳහා අවශ්‍ය නෛතික පියවර ගැනීම.
- මත්ද්‍රව්‍ය වැරදි පිළිබඳ තොරතුරු ලබා ගැනීම, විමර්ශනය හා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම.
- නීතිවිරෝධී වත්කම් පිළිබඳ විමර්ශනයන් සිදු කිරීම හා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම.
- මාර්ග ආරක්‍ෂාව සුරක්ෂිත කිරීමට පියවර ගැනීම.
- රිය අනතුරු පිළිබඳ විමර්ශනය, නඩු පැවරීම හා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම.
- පාරිසරික තිරසර භාවය සඳහා අවශ්‍ය නිවාරණ හා නෛතික ක්‍රියාමාර්ග ගැනීම සහ ආපදා කළමනාකරණය සඳහා සහාය වීම.
- මහජන ආරක්‍ෂක කමිටු හා වෙනත් ක්‍රියාකාරකම් මඟින් මහජන සම්බන්ධතාවය වර්ධනය කර ගැනීම.
- පවත්නා දේශීය නෛතික ප්‍රතිපාදන වලට යටත්ව අන්තර්ජාතික සම්මුතීන් හා ගිවිසුම් වල බැඳියාවන් හා වගකීම් ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්තීන් වලට අනුකූලව ආර්ථික හා සාමාජීය ස්ථායිතාව තහවුරු කිරීම සඳහා සහය ලබා දීම.
- සුපිළිපන්න පොලිස් සේවාවක් සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් කළමනාකරණය කිරීම.

## 1.4 සංවිධාන සටහන



පොලිස්පති
ක්‍රියාකාරී කොට්ඨාස
ප්‍රාදේශීය කොට්ඨාස
ජ්‍යෙ.නි. පො.ප. පරිපාලන
නි.පො.ප. පොලිස් මූලස්ථානය
නි.පො.ප. ක්ෂේත්‍ර බලකා. මූලස්ථානය
නි.පො.ප. පර්යේෂණ සංවර්ධන හා තොරතුරු තාක්ෂණ දිසාව
අධ්‍යක්ෂ සිවිල් පරිපාලන
ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී ලංකා පොලීසිය
ජ්‍යෙ.නි.පො.ප. අපරාධ පරීක්ෂණ හා මූල්‍ය අපරාධ විමර්ශණ
නි.පො.ප. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
නි.පො.ප. මූල්‍ය අපරාධ විමර්ශණ
ජ්‍යෙ.නි.පො.ප. සහායක සේවා
නි.පො.ප. ප්‍රවර්ධන
නි.පො.ප. ප්‍රවාහන හා සංදේශ
නි.පො.ප. සුබසාධන
ජ්‍යෙ.නි.පො.ප. අපරාධ හා රථවාහන
නි.පො.ප. මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය
නි.පො.ප. මත්ද්‍රව්‍ය
නි.පො.ප. රථවාහන හා මාර්ග ආරක්ෂාව
නි.පො.ප. නාවික හා සංචාරක
ජ්‍යෙ.නි.පො.ප. ළමා හා කාන්තා කටයුතු
නි.පො.ප. ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන
නි.පො.ප. ප්‍රජා පොලිස් හා පරිසර ආරක්ෂණ
අණදෙන නිලධාරි විශේෂ කාර්ය බළකාය
නි.පො.ප. / ජ්‍යෙ.පො.අ. නියෝජ්‍ය අණදෙන නිලධාරි
නි.පො.ප. / ජ්‍යෙ.පො.අ. නියෝජ්‍ය අණදෙන නිලධාරි
ජ්‍යෙ.නි.පො.ප. විශේෂ ආරක්ෂක
නි.පො.ප. ජනාධිපති ආරක්ෂක
නි.පො.ප. අගමැති ආරක්ෂක
නි.පො.ප. විශේෂ ආරක්ෂක
ජ්‍යෙ.නි.පො.ප පුහුණු හා උසස් පුහුණු
නි.පො.ප. බඳවාගැනීම් හා පුහුණු දිසාව
විධායක අධ්‍යක්ෂ ජාතික පොලිස් අභ්‍යාස ආයතනය
මාණ්ඩලික නියෝජ්‍ය පොලිස්පති
නි.පො.ප. නීති
නි.පො.ප. විශේෂ කාර්යාංශය
නි.පො.ප. මානව සම්පත් කළමනාකරණ හා ජාත්‍යන්තර සබඳතා දිසාව
අධ්‍යක්ෂ ජනරාල් අපරාධයකින් උත්පාදිත දේ විමර්ශණ කොට්ඨාසය
ප්‍රධාන අභ්‍යන්තර විගණක ශ්‍රී ලංකා පොලීසිය
ජ්‍යෙ.නි. පො.ප. බස්නාහිර
නි.පො.ප. කොළඹ
නි.පො.ප. බස්නාහිර උතුර
නි.පො.ප. බස්නාහිර දකුණ
නි.පො.ප. කළුතර
නි.පො.ප. බස්නාහිර පළාත් රථවාහන
ජ්‍යෙ.නි. පො.ප. දකුණ
නි.පො.ප. ගාල්ල
නි.පො.ප. මාතර හම්බන්තොට
ජ්‍යෙ.නි. පො.ප. සබරගමුව
නි.පො.ප. රත්නපුර
නි.පො.ප. කෑගල්ල
ජ්‍යෙ.නි. පො.ප. ඌව
නි.පො.ප. බදුල්ල
නි.පො.ප. මොණරාගල
ජ්‍යෙ.නි. පො.ප. නැගෙනහිර
නි.පො.ප. ත්‍රිකුණාමලය
නි.පො.ප. අම්පාර
නි.පො.ප. මඩකලපුව
ජ්‍යෙ.නි. පො.ප. මධ්‍යම
නි.පො.ප. මහනුවර හා මාතලේ
නි.පො.ප. නුවරඑළිය
ජ්‍යෙ.නි. පො.ප. වයඹ
නි.පො.ප. කුරුණෑගල
නි.පො.ප. පුත්තලම
ජ්‍යෙ.නි. පො.ප. උතුරු මැද
නි.පො.ප. අනුරාධපුර හා පොළොන්නරුව
ජ්‍යෙ.නි. පො.ප. උතුර
නි.පො.ප. යාපනය
නි.පො.ප. වව්නියාව හා මන්නාරම
නි.පො.ප. කිලිනොච්චිය හා මුලතිව්

## 1.5 ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන අංශ

- ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ව්‍යුහය (2025.12.31 දිනට ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ප්‍රමාණය 47 කි.)



♦ ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස ව්‍යුහය (2025.12.31 දිනට ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස ප්‍රමාණය 77 කි.)



## ◆ විශේෂ කාර්ය බලකායේ ව්‍යුහය

- අණදෙන නිලධාරී - විශේෂ කාර්ය බලකාය (ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති / නියෝජ්‍ය පොලිස්පති)
  - නියෝජ්‍ය අණදෙන නිලධාරී පාලන (නියෝජ්‍ය පොලිස්පති)
    - අධ්‍යක්ෂවරුන් වි.කා.බ. පරිපාලන කොට්ඨාස (ජ්‍යෙ.පො.අ. / පො.අ.)
      - නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර පොලිස් අධිකාරීවරුන් වි.කා.බ. පරිපාලන කොට්ඨාස (පො.අ. / ස.පො.අ.)
        - ස්ථානාධිපතිවරුන් වි.කා.බ. පරිපාලන කොට්ඨාස (ප්‍ර.පො.ප. / පො.ප.)
          - උප ස්ථානාධිපතිවරුන් වි.කා.බ. පරිපාලන කොට්ඨාස (පො.ප.)
            - අංශ භාර / ඒකක භාර නිලධාරීන් (පො.ප. / උ.පො.ප)
        - පරිපාලන නිලධාරී (අධ්‍යක්ෂ පාලනගේ අධීක්ෂණය යටතේ)
          - ආයතන අංශය
  - නියෝජ්‍ය අණදෙන නිලධාරී මෙහෙයුම් (නියෝජ්‍ය පොලිස්පති)
    - කලාප අණදෙන නිලධාරීවරුන් (ජ්‍යෙ.පො.අ. / පො.අ.)
      - ප්‍රාදේශීය අණදෙන නිලධාරීවරුන් (ස.පො.අ.)
        - කඳවුර අණදෙන නිලධාරීවරුන් (ප්‍ර.පො.ප. / පො.ප.)
          - දෙවන කඳවුර අණදෙන නිලධාරීවරුන් (පො.ප.)
            - අංශ භාර / ඒකක භාර / කණ්ඩායම් භාර නිලධාරීන් (පො.ප. / උ.පො.ප)
    - අධ්‍යක්ෂවරුන් වි.කා.බ. විශේෂ මෙහෙයුම් ඒකක (ජ්‍යෙ.පො.අ. / පො.අ.)
      - නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර පොලිස් අධිකාරීවරුන් වි.කා.බ. විශේෂ මෙහෙයුම් ඒකක (පො.අ. / ස.පො.අ.)
        - ස්ථානාධිපතිවරුන් වි.කා.බ. විශේෂ මෙහෙයුම් ඒකක (ප්‍ර.පො.ප. / පො.ප.)
          - උප ස්ථානාධිපතිවරුන් වි.කා.බ. විශේෂ මෙහෙයුම් ඒකක (පො.ප.)
            - අංශ භාර / ඒකක භාර / කණ්ඩායම් භාර නිලධාරීන් (පො.ප. / උ.පො.ප)
  - ප්‍රධාන ගණකාධිකාරී
    - ගණකාධිකාරී වැටුප්
    - ගණකාධිකාරී ගෙවීම්
    - ගණකාධිකාරී ණය හා අත්තිකාරම්
  - අභ්‍යන්තර විගණක

## 1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනගත අරමුදල්

වගු අංක 01

| අනු අංකය | අරමුදලෙහි නම | 2025.12.31වන දිනට ශේෂය (රුපියල්) | |
|---|---|---|---|
| | | මුදල් ශේෂය | ස්ථාවර තැන්පතු ශේෂය |
| 1 | පොලිස් ත්‍යාග අරමුදල | 157,754,421.29 | 27,322,507,099.14 |
| 2 | පොලිස් අනුග්‍රහ අරමුදල | 57,579.43 | - |

මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී මුදල්

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

වගු අංක 02 විදේශ ආධාර ලබන ව්‍යාපෘති

| | | |
|---|---|---|
| 1 | අ) ව්‍යාපෘතියේ නම | ඉන්දියානු රජයේ ප්‍රධානයක් යටතේ උතුරු පළාතේ පොලිස් ස්ථාන සඳහා සිංගල් කැබ් රථ 134 ක් ලබා ගැනීම |
| | ආ) දායක නියෝජිතායතනය | ඩීසල් ඇන්ඩ් මෝටර් ඉන්ජිනියරින් පී.එල්.සී. |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | රු.මි 662.9 |
| | ඇ) ව්‍යාපෘති කාල සීමාව | 2025 - 2026 |

මූලාශ්‍රය - ප්‍රවාහන කොට්ඨාසය

# පරිච්ඡේදය 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## ප්‍රගතිය - 2025

## 2.1 අපරාධ, මත්ද්‍රව්‍ය අපරාධ, සුරාබදු හා වෙනත් වැරදි

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන අපරාධ, විමර්ශන කාර්යයන්හි පහසුව සඳහා බරපතල ගණයේ සහ බරපතල නොවන ගණයේ අපරාධ ලෙස වර්ග කෙරේ. මෙම බරපතල ගණයේ අපරාධ බල අපරාධ නැතහොත් ග්‍රහණ අපරාධ ලෙසද හඳුන්වනු ලබන අතර, එබඳු අපරාධ කාණ්ඩ 26 කට ඇතුළත් කොට ඇත.

බරපතල නොවන අපරාධ සුළු අපරාධ ලෙස හඳුන්වනු ලබන අතර, ඒවා පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ සහ දේපළ වලට එරෙහි සුළු අපරාධ ලෙස බෙදා දක්වනු ලැබේ.

තවද මෙම පරිච්ඡේදය යටතේ ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ විග්‍රහයට බඳුන් කෙරෙන අතර, එමගින් හෙරොයින් ඇතුළු නිද්‍රාජනක ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත. එමෙන්ම සුරාබදු වැරදි යටතේ නීති විරෝධී මත්පැන් සම්බන්ධ වැරදි ඇතුළත් කර ඇති අතර, විවිධ ව්‍යවස්ථාපිත පනත් මගින් තහනම් කරන ලද වැරදි සහ ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන දූරාචාර ක්ෂේත්‍රයට අයත් දූෂණ වැරදි ද මෙම පරිච්ඡේදය මගින් දක්වා ඇත.

### 2.1.1 බල අපරාධ

බල අපරාධ යනු දරුණු ගනයේ අපරාධයි. පෙර කී පරිදි මෙම අපරාධ ග්‍රහණ අපරාධ ලෙසද හඳුන්වනු ලබන අතර, දෙපාර්තමේන්තු නියෝග සී 2 මගින් වාර්තා කළ යුතු අපරාධ ලෙස හඳුන්වා දී ඇත. මෙබඳු අපරාධ කාණ්ඩ 26 ක් ලෙස බෙදා දක්වා ඇති අතර, 2025 වසරේ මෙම අපරාධ වල වාර්තා වීම් සහ විසඳීම් සම්බන්ධ ප්‍රගතිය 2023 හා 2024 වසර හා සංසන්දනාත්මකව පහත වගු සහ ප්‍රස්ථාර මගින් දක්වා ඇත.

වගු අංක 03

**බල අපරාධ වගුව**

| ග්‍රහණ අපරාධ | | 2023 | | | | 2024 | | | | 2025 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | අපහරණය | 573 | 503 | 70 | 88% | 598 | 517 | 81 | 86% | 618 | 539 | 79 | 87% |
| 2 | පැහැරගෙන යාම | 205 | 181 | 24 | 88% | 191 | 172 | 19 | 90% | 195 | 179 | 16 | 92% |
| 3 | ගිනි තැබීම හෝ පුපුරණ ද්‍රව්‍ය වලින් අනර්ථය සිදුකිරීම | 483 | 323 | 160 | 67% | 451 | 298 | 153 | 66% | 402 | 279 | 123 | 69% |
| 4 | රු50000 ට වැඩි අලාභ ඇති වන පරිදි සිදු කෙරෙන අනර්ථය | 321 | 260 | 61 | 81% | 411 | 330 | 81 | 80% | 361 | 304 | 57 | 84% |
| 5 | ගෙවල් බිඳීම | 12138 | 6057 | 6081 | 50% | 9135 | 4371 | 4764 | 48% | 9603 | 4638 | 4965 | 48% |
| 6 | බරපතල තුවාල සිදුකිරීම | 1457 | 1392 | 65 | 96% | 1348 | 1279 | 69 | 95% | 1635 | 1570 | 65 | 96% |
| 7 | අන්තරාදායක ආයුධවලින් (පිහි ආදිය) තුවාල කිරීම | 2275 | 2110 | 165 | 93% | 2185 | 2045 | 140 | 94% | 2260 | 2114 | 146 | 94% |
| 8 | මනුෂ්‍ය ඝාතනය | 573 | 526 | 47 | 92% | 555 | 514 | 41 | 93% | 536 | 499 | 37 | 93% |
| 9 | මනුෂ්‍ය ඝාතනයට තැත්කිරීම / සියපණ හානිකර ගැනීමට අනුබලදීම | 165 | 147 | 18 | 89% | 159 | 146 | 13 | 92% | 164 | 140 | 24 | 85% |

| | ග්‍රහණ අපරාධ | 2023 | | | | 2024 | | | | 2025 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 10 | ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට වැඩි) | 291 | 268 | 23 | 92% | 312 | 288 | 24 | 92% | 300 | 283 | 17 | 94% |
| 11 | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට අඩු) වින්දිතයාගේ කැමැත්ත ඇතිව | 1259 | 1219 | 40 | 97% | 1345 | 1298 | 47 | 97% | 1344 | 1278 | 66 | 95% |
| | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට අඩු) වින්දිතයාගේ කැමැත්ත නොමැතිව | 375 | 348 | 27 | 93% | 362 | 341 | 21 | 94% | 297 | 278 | 19 | 94% |
| 12 | නීති විරෝධී රැස්වීම / කැරළි කෝලාහලය | 18 | 17 | 1 | 94% | 11 | 11 | 0 | 100% | 23 | 22 | 1 | 96% |
| 13 | කොල්ලකෑම | 3150 | 1936 | 1214 | 61% | 2410 | 1609 | 801 | 67% | 2498 | 1621 | 877 | 65% |
| 14 | අස්වාභාවික වැරදි හා බරපතල ලිංගික අපයෝජනය | 675 | 637 | 38 | 94% | 675 | 645 | 30 | 96% | 646 | 609 | 37 | 94% |
| 15 | බලෙන් ලබා ගැනීම (යම් දේපළක් හෝ වටිනා ඇපයක් හෝ වටිනා ඇපයකට හැරවිය හැකිව අත්සන් කරනු ලැබූ හෝ මුද්‍රා තබනු ලැබූ යමක්) | 145 | 118 | 27 | 81% | 137 | 116 | 21 | 85% | 155 | 135 | 20 | 87% |
| 16 | රුපියල් 500000/- කට (රුපියල් පන් ලක්ෂයකට) වඩා වටිනාකමකින් යුතු සාපරාධී සාවද්‍ය පරිහරණය, සාපරාධී විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීම | 3875 | 1865 | 2010 | 48% | 4767 | 2657 | 2110 | 56% | 5869 | 2615 | 3254 | 45% |
| 17 | රුපියල් 50000 ට වැඩි වටිනාකම ඇති වැව්ලි ද්‍රව්‍ය සොරකම | 78 | 57 | 21 | 73% | 70 | 49 | 21 | 70% | 82 | 58 | 24 | 71% |
| | රුපියල් 50000 ට වැඩි වටිනාකම ඇති ගව සොරකම | 1682 | 1141 | 541 | 68% | 1258 | 818 | 440 | 65% | 1204 | 698 | 506 | 58% |
| | රුපියල් 50000 ට වැඩි වටිනාකම ඇති දේපළ සොරකම | 6968 | 4202 | 2766 | 60% | 5824 | 3400 | 2424 | 58% | 6359 | 3756 | 2603 | 59% |
| 18 | ව්‍යාජ මුදල් නෝට්ටු සන්තකය හා මුද්‍රණය | 82 | 75 | 7 | 91% | 49 | 40 | 9 | 82% | 33 | 29 | 4 | 88% |
| 19 | රාජ්‍ය විරෝධී අන්දමින් සිදු කෙරෙන වැරදි | 1 | 1 | 0 | 0% | 3 | 1 | 2 | 0% | 1 | 1 | 0 | 0% |
| 20 | ළමුන්ට කෲර ලෙස සැළකීම | 97 | 89 | 8 | 92% | 123 | 117 | 6 | 95% | 165 | 154 | 11 | 93% |
| 21 | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 24 | 24 | 0 | 100% | 18 | 16 | 2 | 89% | 21 | 19 | 2 | 90% |
| 22 | කුට්ටනය කිරීම හා තැනැත්තන් වෙළඳාම් කිරීම | 10 | 8 | 2 | 80% | 9 | 8 | 1 | 89% | 6 | 6 | 0 | 100% |
| 23 | පීඩාකාරී ආයුධ ආඥා පනත යටතේ ගැනෙන වැරදි | 143 | 134 | 9 | 94% | 133 | 132 | 1 | 99% | 97 | 95 | 2 | 98% |
| 24 | ස්වයංක්‍රීය ගිනි අවි හෝ රිපීටර් තුවක්කු ලඟතබා ගැනීම | 33 | 31 | 2 | 94% | 22 | 22 | 0 | 100% | 44 | 41 | 3 | 93% |

| | ග්‍රහණ අපරාධ | 2023 | | | | 2024 | | | | 2025 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 25 | හෙරෝයින්, කොකේන්, මෝෆීන් කිසියම් ප්‍රමාණයක් නිශ්පාදනය කිරීම වෙළඳාම් කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම හෝ හෙරොයින් ග්‍රෑම් 05ක් හෝ ඊට වැඩි, කොකේන් ග්‍රෑම් 02ක් හෝ ඊට වැඩි, මෝෆීන් ග්‍රෑම් 03ක් හෝ ඊට වැඩි, ඔපියම් ග්‍රෑම් 500ක් හෝ ඊට වැඩි මෙත්ඇම්පිටමින් නොහොත් අයිස් ග්‍රෑම්ස් 10 ක් හෝ ඊට වැඩි සහ ගංජා කිලෝ ග්‍රෑම් 05ක් හෝ ඊට වැඩි හා හෂීස් කිලෝ ග්‍රෑම් 01ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වූ අන්තරාදායක මත් ද්‍රව්‍ය ලඟ තබා ගැනීම. | 7685 | 7665 | 20 | 100% | 6410 | 6385 | 25 | 100% | 9135 | 9059 | 76 | 99% |
| 26 | පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම | 188 | 181 | 7 | 96% | 349 | 343 | 6 | 98% | 254 | 252 | 2 | 99% |
| | එකතුව | 44969 | 31515 | 13454 | 70% | 39320 | 27968 | 11352 | 71% | 44307 | 31271 | 13036 | 71% |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

(**සැ.යු.** මෙහි “විසඳූ” යන්න මගින් පොලීසිය විසින් විමර්ශන අවසන් කළ සංඛ්‍යාව, අධිකරණයේ විභාග වන සංඛ්‍යාව සහ අධිකරණය විසින් විභාග කොට අවසන් කළ සංඛ්‍යාව යන සියල්ල අදහස් වේ.)

ඉහත බල අපරාධ වගුව මගින් දක්වා ඇති නිරන්තර අවධානයට පාත්‍ර වන අපරාධ කිහිපයක වාර්තා වීම් සහ විසඳීම් පහත ප්‍රස්ථාර මගින් වැඩිදුරටත් විග්‍රහ කර ඇති අතර, වගුවෙහි සඳහන් කාල සීමාවට අදාළව අපරාධ වාර්තා වීමේ වෙනස්වීම්ද (උච්ඡාවචනයන්) ප්‍රස්ථාර මගින් විදහා දක්වා ඇත. උදාහරණ ලෙස පහත ගෙවල් බිඳීම් ප්‍රස්ථාරය ගතහොත් 2023 වසරේ වාර්තා වූ ගෙවල් බිඳීම් 12138 ට සාපේක්ෂව 2024 වසරේ 9135 ක් දක්වා 25 % කින් පහළ ගොස් ඇත. 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වසරේ 9603 ක් ලෙස 5 % කින්ද ඉහළ ගොස් ඇත.


මනුෂ්‍ය ඝාතනය
573
0%
526
555
514
-3%
536
499
-3%
2023 වර්ෂය
2024 වර්ෂය
2025 වර්ෂය
වාර්තා වූ
විසඳූ
උච්ඡාවචනය


ගෙවල් බිඳීම
12138
0%
6057
9135
4371
-25%
9603
5%
4638
2023 වර්ෂය
2024 වර්ෂය
2025 වර්ෂය
වාර්තා වූ
විසඳූ
උච්ඡාවචනය


ස්ත්‍රී දූෂණය (අවුරුදු 16 ට වැඩි)
291
268
0%
312
7%
288
300
283
-4%
2023 වර්ෂය
2024 වර්ෂය
2025 වර්ෂය
වාර්තා වූ
විසඳූ
උච්ඡාවචනය


ස්ත්‍රී දූෂණය (16 ට අඩු කැමැත්ත ඇතිව)
1259
1219
0%
1345
7%
1298
1344
1278
0%
2023 වර්ෂය
2024 වර්ෂය
2025 වර්ෂය
වාර්තා වූ
විසඳූ
උච්ඡාවචනය


ස්ත්‍රී දූෂණය (අවුරුදු 16 ට අඩු කැමැත්ත නොමැතිව)
0%
375
348
362
341
-3%
297
278
-18%
2023 වර්ෂය
2024 වර්ෂය
2025 වර්ෂය
වාර්තා වූ
විසඳූ
උච්ඡාවචනය


කොල්ලකෑම
3150
0%
1936
2410
1609
-23%
2498
4%
1621
2023 වර්ෂය
2024 වර්ෂය
2025 වර්ෂය
වාර්තා වූ
විසඳූ
උච්ඡාවචනය


බරපතල තුවාල සිදුකිරීම
1457
1392
0%
1348
1279
-7%
1635
1570
21%
2023 වර්ෂය
2024 වර්ෂය
2025 වර්ෂය
වාර්තා වූ
විසඳූ
උච්ඡාවචනය


සමස්ත එකතුව
44969
31515
0%
39320
27968
-13%
44307
31271
13%
2023 වර්ෂය
2024 වර්ෂය
2025 වර්ෂය
වාර්තා වූ
විසඳූ
උච්ඡාවචනය

## 2.1.1 (අ) කාන්තාවන්ට එරෙහි බල අපරාධ

පහත වගුව මගින් කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තාවීම් පසුගිය වසර තුනකට අදාළව සංසන්දනාත්මකව දක්වා ඇත. ඒ යටතේ 2023 සහ 2024 වසර දෙකට සාපේක්ෂව 2025 වසරේ කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තා වීමේ සහ එම අපරාධ විසඳීමේ ස්වභාවය හඳුනාගත හැක.

වගු අංක 04 **කාන්තාවන්ට එරෙහි බල අපරාධ වගුව**

| | වරද | 2023 | | | | 2024 | | | | 2025 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| **1** | මිනීමැරීම | **105** | **102** | **3** | **97%** | **104** | **101** | **3** | **97%** | **108** | **102** | **6** | **94%** |
| **2** | සියපණ හානිකර ගැනීමට අනුබල දීම | **0** | **0** | **0** | **0%** | **2** | **2** | **0** | **0%** | **0** | **0** | **0** | **0%** |
| **3** | මිනීමැරීමට තැත්කිරීම | **16** | **16** | **0** | **100%** | **13** | **13** | **0** | **100%** | **14** | **14** | **0** | **100%** |
| **4** | ස්ත්‍රී දූෂණය | **226** | **224** | **2** | **99%** | **220** | **219** | **1** | **100%** | **227** | **220** | **7** | **97%** |
| **5** | ව්‍යභිචාරය | **3** | **3** | **0** | **100%** | **5** | **5** | **0** | **100%** | **2** | **2** | **0** | **100%** |
| **6** | බරපතල තුවාල සිදු කිරීම | **221** | **221** | **0** | **100%** | **205** | **201** | **4** | **98%** | **207** | **206** | **1** | **100%** |
| **7** | පිහි ආදියෙන් තුවාල සිදුකිරීම | **96** | **96** | **0** | **100%** | **87** | **87** | **0** | **100%** | **67** | **67** | **0** | **100%** |
| **8** | අස්වාභාවික වැරදි/තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | **0** | **0** | **0** | **0%** | **3** | **3** | **0** | **100%** | **4** | **4** | **0** | **100%** |
| **9** | බරපතල ලිංගික අපයෝජනය | **37** | **37** | **0** | **100%** | **38** | **38** | **0** | **100%** | **35** | **33** | **2** | **94%** |
| **10** | අපහරණය | **2** | **2** | **0** | **100%** | **1** | **1** | **0** | **100%** | **3** | **3** | **0** | **100%** |
| **11** | පැහැරගෙනයාම | **44** | **44** | **0** | **100%** | **46** | **45** | **1** | **98%** | **36** | **36** | **0** | **100%** |
| **12** | කාමුක සංසර්ගය සඳහා ස්ත්‍රීන් සැපයීම | **0** | **0** | **0** | **0%** | **0** | **0** | **0** | **0%** | **4** | **4** | **0** | **100%** |
| **13** | තැනැත්තන් වෙළඳාම (කුට්ටනය) | **7** | **7** | **0** | **100%** | **4** | **4** | **0** | **100%** | **3** | **3** | **0** | **100%** |
| **14** | වෙනත් | **2** | **2** | **0** | **100%** | **5** | **5** | **0** | **100%** | **7** | **7** | **0** | **100%** |
| එකතුව | | **759** | **754** | **5** | **99%** | **733** | **724** | **9** | **99%** | **717** | **701** | **16** | **98%** |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

(**සැ.යු.** මෙහි "විසඳූ" යන්න මගින් පොලීසිය විසින් විමර්ශන අවසන් කළ සංඛ්‍යාව, අධිකරණයේ විභාග වන සංඛ්‍යාව සහ අධිකරණය විසින් විභාග කොට අවසන් කළ සංඛ්‍යාව යන සියල්ල අදහස් වේ. 2025 වසරේ ඉහත නිර්ණායක වලට අමතරව පොලීසිය විසින් සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇති නමුත් තවදුරටත් විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාවද විසඳූ යන්නට ඇතුළත් වේ.)

කාන්තාවන්ට එරෙහි බල අපරාධ වල අවදානයට ලක්කළ යුතු අපරාධ කිහිපයක වාර්තාවීම් හා විසඳීම් සම්බන්ධ සංසන්දනාත්මක විග්‍රහයක් සහ අපරාධ වාර්තාවීමේ වෙනස්කම් (උච්ඡාවචනයන්) පහත ප්‍රස්ථාර මගින් විදහා දක්වා ඇත.















## 2.1.1 (ආ) ළමයින්ට එරෙහි බල අපරාධ

ළමයින්ට එරෙහි බල අපරාධ කාණ්ඩ 15 ක් යටතේ පහත වගුව මගින් දක්වා ඇත. ඒ යටතේ වගුවෙහි සඳහන් වසර තුනට අදාළව එම අපරාධ වාර්තා වීම් සහ විසඳීම් වල ප්‍රගතිය සංසන්දනාත්මකව වගු අංක 05 මගින් විග්‍රහ කර ඇත.

වගු අංක 05

| වරද | | | 2023 | | | | 2024 | | | | 2025 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තාවූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | මිනී මැරුම | | 16 | 16 | 0 | 100% | 20 | 20 | 0 | 100% | 12 | 12 | 0 | 100% |
| 2 | සියපණ හානිකරගැනීමට අනුබල දීම | | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% |
| 3 | මිනී මැරීමට තැත්කිරීම | | 11 | 11 | 0 | 100% | 8 | 8 | 0 | 100% | 11 | 11 | 0 | 100% |
| 4 | ස්ත්‍රී දූෂණය | වයස අවු 16 ට අඩු කැමැත්ත ඇතිව | 1262 | 1254 | 8 | 99% | 1326 | 1318 | 8 | 99% | 1363 | 1345 | 18 | 99% |
| | | වයස අවු 16 ට අඩු කැමැත්ත නොමැතිව | 320 | 320 | 0 | 100% | 361 | 353 | 8 | 98% | 241 | 236 | 5 | 98% |
| | | වයස අවු 16 - 18 අතර | 51 | 51 | 0 | 100% | 67 | 66 | 1 | 99% | 66 | 66 | 0 | 100% |
| 5 | ව්‍යභිචාරය | | 63 | 63 | 0 | 100% | 40 | 40 | 0 | 100% | 44 | 44 | 0 | 100% |
| 6 | බරපතල තුවාල සිදු කිරීම | | 57 | 57 | 0 | 100% | 54 | 54 | 0 | 100% | 60 | 60 | 0 | 100% |
| 7 | පිහි ආදියෙන් තුවාල සිදු කිරීම | | 8 | 8 | 0 | 0% | 8 | 8 | 0 | 0% | 20 | 17 | 3 | 85% |
| 8 | අස්වාභාවික වැරදි/පුද්ගලයින් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | | 8 | 8 | 0 | 100% | 0 | 0 | 0 | 0% | 8 | 8 | 0 | 0% |
| 9 | බරපතල ලිංගික අපයෝජනය | | 605 | 605 | 0 | 100% | 616 | 613 | 3 | 100% | 572 | 564 | 8 | 99% |
| 10 | අපහරණය | | 561 | 555 | 6 | 99% | 584 | 580 | 4 | 99% | 590 | 573 | 17 | 97% |
| 11 | පැහැරගෙනයාම | | 27 | 25 | 2 | 93% | 19 | 17 | 2 | 89% | 29 | 29 | 0 | 100% |
| 12 | තැනැත්තන් වෙළඳාම (කුට්ටනය) | | 3 | 3 | 0 | 100% | 3 | 3 | 0 | 100% | 6 | 6 | 0 | 100% |
| 13 | ළමයින්ට කෲර ලෙස සැළකීම | | 97 | 97 | 0 | 100% | 123 | 123 | 0 | 100% | 165 | 164 | 1 | 99% |
| 14 | අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | | 24 | 24 | 0 | 100% | 11 | 11 | 0 | 100% | 11 | 11 | 0 | 100% |
| 15 | වෙනත් | | 6 | 6 | 0 | 100% | 7 | 7 | 0 | 100% | 11 | 11 | 0 | 100% |
| එකතුව | | | 3119 | 3103 | 16 | 99% | 3247 | 3221 | 26 | 99% | 3209 | 3157 | 52 | 98% |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

(**සැ.යු.** මෙහි "විසඳූ" යන්න මගින් පොලීසිය විසින් විමර්ශන අවසන් කළ සංඛ්‍යාව, අධිකරණයේ විභාග වන සංඛ්‍යාව සහ අධිකරණය විසින් විභාග කොට අවසන් කළ සංඛ්‍යාව යන සියල්ල අදහස් වේ. 2025 වසරේ ඉහත නිර්ණායක වලට අමතරව පොලීසිය විසින් සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇති නමුත් තවදුරටත් විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාවද විසඳූ යන්නට ඇතුළත් වේ.)

ළමයින්ට එරෙහි බල අපරාධ වල අවදානයට ලක්කළ යුතු අපරාධ කිහිපයක වාර්තාවීම් හා විසඳීම් සම්බන්ධ සංසන්දනාත්මක විග්‍රහයන් සහ අපරාධ වාර්තාවීමේ වෙනස්කම් (උච්ඡාවචනයන්) පහත ප්‍රස්ථාර මගින් විදහා දක්වා ඇත.












## 2.1.1 (ඇ) ශරීරය පිළිබඳ වැරදි

බල අපරාධ යටතේ ගැනෙන අපරාධ 26 තවදුරටත් විග්‍රහයට බඳුන් කිරීම සඳහා මෙම ශරීරය පිළිබඳ වැරදි ලෙස අපරාධ 13 ක් වෙන් කොට පහත වගුව මගින් දක්වා ඇත. පහත ප්‍රස්ථාරය මගින් මෙම අපරාධ වල සමස්ත වාර්තා වීම් හා විසඳීම් පසුගිය වසර තුනකට අදාළව සංසන්දනය කර දක්වා ඇත.

වගු අංක **06** **ශරීරය පිළිබඳ වැරදි**

| අනු අංකය | ශරීරය පිළිබඳ වැරදි | 2023.01.01 සිට 2023.12.31 | | | 2024.01.01 සිට 2024.12.31 | | | 2025.01.01 සිට 2025.12.31 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | % | වාර්තා වූ | විසඳූ | % | වාර්තා වූ | විසඳූ | % |
| 1 | අපහරණය | 573 | 503 | 88% | 598 | 517 | 86% | 618 | 539 | 87% |
| 2 | පැහැරගෙන යාම | 205 | 181 | 88% | 191 | 172 | 90% | 195 | 179 | 92% |
| 3 | බරපතල තුවාල කිරීම | 1457 | 1392 | 96% | 1348 | 1279 | 95% | 1635 | 1570 | 96% |
| 4 | අන්තරාදායක ආයුධවලින් (පිහි ආදියෙන්) තුවාල කිරීම | 2275 | 2110 | 93% | 2185 | 2045 | 94% | 2260 | 2114 | 94% |
| 5 | මනුෂ්‍ය ඝාතනය | 573 | 526 | 92% | 555 | 514 | 93% | 536 | 499 | 93% |
| 6 | මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීම | 165 | 147 | 89% | 159 | 146 | 92% | 164 | 140 | 85% |
| 7 | ස්ත්‍රී දූෂණය වයස අවු. 16 ට වැඩි | 291 | 268 | 92% | 312 | 288 | 92% | 300 | 283 | 94% |
| 8.1 | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය අවු. 16 ට අඩු කැමැත්ත ඇතිව | 1259 | 1219 | 97% | 1345 | 1298 | 97% | 1344 | 1278 | 95% |
| 8.2 | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය වයස අවු. 16 අඩු කැමැත්ත නොමැතිව | 375 | 348 | 93% | 362 | 341 | 94% | 297 | 278 | 94% |
| 9 | අස්වාභාවික වැරදි හා බරපතල ලිංගික අපයෝජනය | 675 | 637 | 94% | 675 | 645 | 96% | 646 | 609 | 94% |
| 10 | ළමුන්ට කෲර ලෙස සැලකීම | 97 | 89 | 92% | 123 | 117 | 95% | 165 | 154 | 93% |
| 11 | ළමුන්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 24 | 24 | 100% | 18 | 16 | 89% | 21 | 19 | 90% |
| 12 | කුට්ටනය කිරීම හා තැනැත්තන් වෙළඳාම | 10 | 8 | 80% | 9 | 8 | 89% | 6 | 6 | 100% |
| 13 | පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම | 188 | 181 | 96% | 349 | 343 | 98% | 254 | 252 | 99% |
| | එකතුව | 8167 | 7633 | 93% | 8229 | 7729 | 94% | 8441 | 7920 | 94% |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**




ප්‍රස්ථාරයට අනුව ශරීරය පිළිබඳ වැරදි වාර්තාවීම 2023 වර්ෂයේ 8167 සිට 2024 වසරේ 8229 ක් දක්වා 1% කින් ඉහළ ගොස් ඇති අතර, 2025 වසරේදී 8441 ක් දක්වා 3% කින් ඉහළ ගොස් ඇත.

### 2.1.1 (ඇ) දේපළ පිළිබඳ වැරදි

බල අපරාධ වගුවෙහි අංක 14 සිට 22 දක්වා වැරදි දේපළ පිළිබඳ වැරදි ලෙස බෙදා දක්වා ඇති අතර, එම වැරදි වාර්තා වීම් හා විසඳීම් පහත වගුව මගින්ද, සමස්ත වාර්තා වීම් වල ස්වභාවය පසුගිය වසර තුනකට අදාළව ප්‍රස්ථාරය මගින්ද දක්වා ඇත.

වගු අංක 07 **දේපළ පිළිබඳ වැරදි**

| අනු අංකය | දේපළ පිළිබඳ වැරදි | 2023.01.01 සිට 2023.12.31 | | | 2024.01.01 සිට 2024.12.31 | | | 2025.01.01 සිට 2025.12.31 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | % | වාර්තා වූ | විසඳූ | % | වාර්තා වූ | විසඳූ | % |
| 14 | බලෙන් ලබා ගැනීම (මුදලක්, යම් දේපලක් හෝ වටිනා ඇපයක්, වටිනා ඇපයකට හැරවිය හැකිව අත්සන් තැබූ යමක්) | 145 | 118 | 81% | 137 | 116 | 85% | 155 | 135 | 87% |
| 15 | රු.50,000/- කට වඩා වැඩි අලාභ ඇති වන පරිදි සිදු කරන අනර්ථය | 321 | 260 | 81% | 411 | 330 | 80% | 361 | 304 | 84% |
| 16 | ගිණි තැබීම හෝ පුපුරණ ද්‍රව්‍ය වලින් අනර්ථය සිදු කිරීම | 483 | 323 | 67% | 451 | 298 | 66% | 402 | 279 | 69% |
| 17 | ගෙවල් බිඳ දේපළ සොරකම් කිරීම | 12138 | 6057 | 50% | 9135 | 4371 | 48% | 9603 | 4638 | 48% |
| 18 | නීති විරෝධී රැස්වීම / කැරළි කෝලාහල | 18 | 17 | 94% | 11 | 11 | 100% | 23 | 22 | 96% |
| 19 | කොල්ලය | 3150 | 1936 | 61% | 2410 | 1609 | 67% | 2498 | 1621 | 65% |
| 20 | වංචා / සාපරාධී සාවද්‍ය පරිහරණය විශ්වාසය කඩ කිරීම රු.500,000/- ට වැඩි | 3875 | 1865 | 48% | 4767 | 2657 | 56% | 5869 | 2615 | 45% |
| 21.1 | රු.50,000/- වැඩි වටිනාකම ඇති වැවිලි ද්‍රව්‍ය | 78 | 57 | 73% | 70 | 49 | 70% | 82 | 58 | 71% |
| 21.2 | රු.50,000/- වැඩි වටිනාකම ඇති ගව සොරකම | 1682 | 1141 | 68% | 1258 | 818 | 65% | 1204 | 698 | 58% |
| 21.3 | රු.50,000/- වැඩි වටිනාකම ඇති දේපළ සොරකම | 6968 | 4202 | 60% | 5824 | 3400 | 58% | 6359 | 3756 | 59% |
| 22 | රාජ්‍ය විරෝධී අන්දමින් සිදු කරන වැරදි | 1 | 1 | 100% | 3 | 1 | 33% | 1 | 1 | 100% |
| එකතුව | | 28859 | 15977 | 55% | 24477 | 13660 | 56% | 26557 | 14127 | 53% |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**




ප්‍රස්ථාරයට අනුව දේපළ පිළිබඳ වැරදි වාර්තාවීම 2023 වර්ෂයේ 28859 සිට 2024 වසරේ 24477 ක් දක්වා 15% කින් පහළ ගොස් ඇති අතර, 2025 වසරේදී 26557 ක් දක්වා 8% කින් ඉහළ ගොස් ඇත.

### 2.1.1 (ඉ) ගොදුරු විරහිත වැරදි

මෙම කාණ්ඩය, බල අපරාධ වල අනු අංක 23 සිට 26 දක්වා කොටසට අයත් වන අතර, පහත වගුව සහ ප්‍රස්ථාරය මගින් මෙම ගොදුරු විරහිත වැරදි වල වාර්තා වීමේ සහ විසඳීමේ ස්වභාවය දක්වා ඇත.

**වගු අංක 08** **ගොදුරු විරහිත වැරදි**

| අනු අංකය | ගොදුරු විරහිත වැරදි | 2023.01.01 සිට 2023.12.31 | | | 2024.01.01 සිට 2024.12.31 | | | 2025.01.01 සිට 2025.12.31 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | % | වාර්තා වූ | විසඳූ | % | වාර්තා වූ | විසඳූ | % |
| 23 | පීඩාකාරී ආයුධ ආඥා පනත යටතේ ගැනෙන වැරදි | 143 | 134 | 94% | 133 | 132 | 99% | 97 | 95 | 98% |
| 24 | ව්‍යාජ මුදල් නෝට්ටු සන්තකය හා මුද්‍රණය | 82 | 75 | 91% | 49 | 40 | 82% | 33 | 29 | 88% |
| 25 | ස්වයංක්‍රීය හෝ රිපීටර් තුවක්කු සන්තකය | 33 | 31 | 94% | 22 | 22 | 100% | 44 | 41 | 93% |
| 26 | හෙරෝයින්, කොකේන්, මෝෆීන් කිසියම් ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම වෙළඳාම් කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම හෝ හෙරොයින් ග්‍රෑම් 05ක් හෝ ඊට වැඩි, කොකේන් ග්‍රෑම් 02ක් හෝ ඊට වැඩි, මෝෆීන් ග්‍රෑම් 03ක් හෝ ඊට වැඩි, ඔපියම් ග්‍රෑම් 500ක් හෝ ඊට වැඩි මෙත්ඇම්පිටමින් නොහොත් අයිස් ග්‍රෑම්ස් 10 ක් හෝ ඊට වැඩි සහ ගංජා කිලෝ ග්‍රෑම් 05ක් හෝ ඊට වැඩි හා හෂීස් කිලෝ ග්‍රෑම් 01ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වූ අන්තරාදායක මත් ද්‍රව්‍ය ළඟ තබා ගැනීම. | 7685 | 7665 | 100% | 6410 | 6385 | 100% | 9135 | 9059 | 99% |
| එකතුව | | 7943 | 7905 | 100% | 6614 | 6579 | 99% | 9309 | 9224 | 99% |

මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය




ප්‍රස්ථාරයට අනුව ගොදුරු විරහිත වැරදි වාර්තාවීම 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වසරේ 7943 සිට 6614 ක් දක්වා 17% කින් පහළ ගොස් ඇති අතර, 2025 වසරේදී 9309 ක් දක්වා 41% කින් ඉහළ ගොස් ඇත.

## 2.1.2 සුළු අපරාධ

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන අපරාධ අතරින් බරපතල නොවන අපරාධ සුළු අපරාධ ලෙස සඳහන් කර ඇත. ඇතැම් තැනක සුළු වැරදි ලෙසද සඳහන් වන මෙම අපරාධ පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ සහ දේපළ වලට එරෙහි සුළු අපරාධ ලෙස කොටස් දෙකකට වර්ග කොට දක්වා ඇත. පහත වගුව මගින් සුළු අපරාධ වාර්තා වීම් සහ විසඳීම් වසර 3 කට අදාළව දක්වා ඇත.

### 2.1.2 (අ) පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ

වගු අංක 09 පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ වගුව

| වරද | | 2023 | | | | 2024 | | | | 2025 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | සුළු පහරදීම් | 21667 | 11959 | 9708 | 55% | 23172 | 13380 | 9792 | 58% | 19441 | 10729 | 8712 | 55% |
| 2 | නීති විරෝධී ගබ්සා කිරීම් | 124 | 61 | 63 | 49% | 25 | 9 | 16 | 36% | 50 | 14 | 36 | 28% |
| 3 | සාපරාධී අයුතු ඇතුළුවීම/ නිවසකට අයුතු ඇතුළුවීම | 1443 | 654 | 789 | 45% | 1449 | 800 | 649 | 55% | 1193 | 633 | 560 | 53% |
| 4 | ලිංගික අපයෝජනය | 3177 | 1685 | 1492 | 53% | 4011 | 2090 | 1921 | 52% | 3917 | 2021 | 1896 | 52% |
| 5 | අයුතු අවහිරය/ අයුතු සිරකරතැබීම | 186 | 122 | 64 | 66% | 154 | 67 | 87 | 44% | 115 | 70 | 45 | 61% |
| 9 | රතු එළියට විරුද්ධව ධාවනය | 113023 | 103991 | 102,579,000.00 | 4,284,000.00 |
| 10 | පදික මාරුවේ නොනැවැත්වීම | 33107 | 31573 | 30,859,000.00 | 3,023,900.00 |
| 11 | රක්ෂණ සහතික නොමැතිව පැදවීම | 92475 | 253 | 294,500.00 | 141,301,250.00 |
| 12 | හඳුනාගැනීමේ තහඩු පිළිබඳ වැරදි | 29236 | 25814 | 25,344,900.00 | 3,942,600.00 |
| 13 | ආදායම් බලපත්‍ර නොමැතිව පැදවීම | 119201 | 99966 | 109,075,900.00 | 34,888,750.00 |
| 14 | මෝටර් වාහන නැවැත්වීමේ වැරදි | 171287 | 159266 | 148,967,800.00 | 6,478,500.00 |
| 15 | මාර්ගයේ පාවිච්චියට නුසුදුසු වාහන | 1654 | 118 | 100,500.00 | 913,000.00 |
| 16 | පොලිස් සංඥා සහ විධාන නොපිළිපැදීම | 14710 | 13269 | 24,720,506.00 | 5,668,900.00 |
| 17 | අන්තරාදායක ලෙස භාණ්ඩ පැටවීම හා ප්‍රවාහනය | 6902 | 5577 | 3,575,000.00 | 3,369,500.00 |
| 18 | වංචා සහගත ලෙස අංක තහඩු ආදායම් බලපත්‍ර හා වෙනත් ලේඛන පාවිච්චි කිරීම | 799 | 612 | 8,025,000.00 | 62,500.00 |
| 19 | වෙනත් වැරදි | 1518233 | 1188246 | 1,311,662,337.00 | 936,525,054.00 |
| | මුළු එකතුව | **3125265** | **2336024** | 2,735,452,839.00 | **5,135,359,899.00** |

මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය

## 2.5 වෙනත් මහජන සේවාවන්

ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රමුඛතම කාර්ය භාරය ඉටු කිරීමෙහිලා මහජනතාව වෙත ලබා දෙන විශේෂිත සේවාවන්ද පවතී. ඒ යටතේ මහජන පැමිණිලි ඍජුවම පොලිස් මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීමේ සේවාවන් ද, 119 හදිසි ඇමතුම් සේවාව ද, මහජනතාව වෙත නිෂ්කාශන වාර්තා නිකුත් කිරීමේ සේවාව ද, පොලිස් කටයුතු සඳහා මහජන සහය ඍජුවම ලබා ගැනීමේ ප්‍රජා පොලිස් සේවාව ද, දැක්විය හැකිය.

මීට අමතරව විවිධ විරෝධතා ව්‍යාපාර සහ මහජන කැළඹීලි පවතින අවස්ථා වල පොදු ජනතාවගේ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමේ කැරළි මර්දන සේවාවන්ද ක්‍රියාත්මක කරනු ලබයි.

### 2.5.1 මහජන පැමිණිලි විසඳීමේ විශේෂිත සේවා

මහජන පැමිණිලි විසඳීම වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් සිදු කිරීම සඳහා මහජන පැමිණිලි භාරගැනීමේ සහ විසඳීමේ සේවාවන් පළාත් මට්ටමින් සහ පොලිස් මූලස්ථානය ආශ්‍රිතව ක්‍රියාත්මක වේ. මේ තුළින් ජනතාවට සිය පැමිණිලි පොලිස්පති වරයාට හෝ වෙනත් ඉහළ පොලිස් නිලධාරියකුට යොමු කොට සහනයක් ලබා ගත හැකිය. මෙම සේවාව සඳහා ලද මහජන පැමිණිලි පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු පහත වගුව මගින් දක්වා ඇත.

වගු අංක **26** **වාර්තා වූ පැමිණිලි**

| අනු අංකය | පැමිණිලි වර්ගය | 2023 | | | | 2024 | | | | 2025 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | පොලිස්පති මහජන සහන දිනය | 245 | 20 | 225 | 8% | 1927 | 701 | 1226 | 36% | 2211 | 846 | 1365 | 38% |
| 2 | පොලිස් නිලධාරීන්ගේ සහන දිනය | 3620 | 3276 | 344 | 90% | 3500 | 2970 | 530 | 85% | 3813 | 3188 | 625 | 84% |
| 3 | "පොලිස්පතිට කියන්න" වැඩසටහන | 3869 | 1832 | 2037 | 43% | 3645 | 2225 | 1460 | 61% | 5248 | 3647 | 1601 | 69% |
| 4 | මහජන සහන මැදිරිය | 2387 | 1038 | 1349 | 43% | 2414 | 476 | 1938 | 20% | 1855 | 597 | 1258 | 32% |
| එකතුව | | 10121 | 6166 | 3955 | 61% | 11486 | 6372 | 5154 | 55% | 13127 | 8278 | 4849 | 63% |

**මූලාශ්‍රය - පොලිස් මූලස්ථානය**

(**සැ.යු.** මෙහි විසඳූ යන්න මගින් විමර්ශන අවසන් කළ සංඛ්‍යාව, අධිකරණයේ නඩු පැවරූ සංඛ්‍යාව, සමථ කළ සංඛ්‍යාව හෝ මුළුමනින්ම විසඳා අවසන් කළ සංඛ්‍යාව අදහස් වේ. පොලිස් නිලධාරීන්ගේ සහන දිනය සම්බන්ධයෙන්, විසඳූ යන්න මගින් පැමිණිලිකරුට සාධාරණ විසඳුමක් ලබා දීම අදහස් වේ)

### ♦ 119 හදිසි ඇමතුම් සේවාව

119 පොලිස් හදිසි ඇමතුම් සේවාව මහජනතාව අතර ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ සේවාවක් ලෙස දැක්විය හැකිය. මෙම සේවාව සඳහා ලැබෙන පැමිණිලි සංඛ්‍යාත්මකව ඉතා ඉහළ අගයක් ගනී. එම පැමිණිලි ලද වහාම අදාළ පොලිස් ස්ථානය වෙත බැහැර කරනු ලබන අතර, අදාළ පොලිස් ස්ථානය මගින් කඩිනමින් විමර්ශන ආරම්භ කරනු ලැබේ.

වගු අංක 27

**119 වෙත වාර්තා වූ පැමිණිලි**

| වර්ෂය | වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | බැහැර කළ පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| 2023 | 829132 | 829132 |
| 2024 | 975747 | 975747 |
| 2025 | 1074542 | 1074542 |

**මූලාශ්‍රය - පොලිස්පති අණදෙන තොරතුරු කොට්ඨාසය**

## 2.5.2 නිෂ්කාශන වාර්තා

දේශීය හා විදේශීය නිෂ්කාශන අයදුම්පත් සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම ශ්‍රී ලංකා පොලීසිය විසින් සිදු කරනු ලබන ඉතා වැදගත් කාර්යයක් ලෙස සැලකේ. 2025 වසරේ නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම සම්බන්ධ ප්‍රගතිය පහත වගුව මගින් දක්වා ඇත.

වගු අංක 28

| අයදුම්පත් වර්ගය | ලද අයදුම්පත් ප්‍රමාණය | නිකුත්කළ වාර්තා ප්‍රමාණය | විසඳීමේ ප්‍රතිශතය | නිකුත් කිරීමට ඇති වාර්තා ප්‍රමාණය | ලද මුදල (රුපියල්) |
|---|---|---|---|---|---|
| **දේශීය නිෂ්කාශන වාර්තා (මාර්ගගත)** | 171846 | 168148 | 98% | 3698 | **824,461,000.00** |
| **විදේශීය නිෂ්කාශන වාර්තා (තානාපති කාර්යාල මගින්)** | 671 | 579 | 86% | 92 | **0.00** |
| **එකතුව** | **172517** | **168727** | 98% | **3790** | **824,461,000.00** |

**මූලාශ්‍රය - පොලිස් මූලස්ථානය**

## 2.5.3 ප්‍රජා පොලිස් සේවය

ප්‍රජා පොලිස් සේවය යනු පොලීසිය හා මහජනයා අතර නව සහයෝගීතාවයක් වර්ධනය කිරීම සඳහා වන උපායමාර්ගයකි. ජනතාවට බලපාන අපරාධ, මත් උවදුර වැනි කාලීන ගැටළු හඳුනාගෙන ඒවා විසඳීම සඳහා පොලීසිය හා ප්‍රජාව එක්ව වැඩ කිරීම එමගින් අපේක්ෂිතය. මූලිකවම මෙම ක්‍රියාවලිය ප්‍රජා පොලිස් කමිටු ඔස්සේ ක්‍රියාත්මක කෙරේ. 2025 වසරේ කමිටු පැවැත්වීම පිළිබඳ තොරතුරු පහත වගුව මගින් දක්වා ඇත.

වගු අංක 29

| අනු අංකය | කොට්ඨාශ සංඛ්‍යාව | පිහිටුවා ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව | පිහිටුවා ඇති කමිටු සංඛ්‍යාව | පැවැත්විය යුතු කමිටු සංඛ්‍යාව | පවත්වා ඇති කමිටු සංඛ්‍යාව | සහභාගී වූ සාමාජික සංඛ්‍යාව | ස්ථානාධිපති සහභාගී වූ ගණන | දිස්ත්‍රික් භාර පො.අ./ස.පො.අ. සහභාගී වූ ගණන | කොට්ඨාශ භාර නිලධාරී සහභාගී වූ ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2025 වර්ෂයේ ප්‍රජා පොලිස් උපදේශන සභාව පැවැත්වීම | | | | | | | | | |
| 1 | 47 | 603 | 603 | 2409 | 243 | 2961 | 232 | 169 | - |
| 2025 වර්ෂයේ ප්‍රජා පොලිස් ස්ථානීය මහජන ආරක්ෂක කමිටු පැවැත්වීම | | | | | | | | | |
| 2 | **පොලිස්පති චක්‍රලේක 2758/2023 (II) මගින් කමිටුව විසුරුවා හැර ඇත.** | | | | | | | | |
| 2025 වර්ෂයේ මහජන ආරක්ෂක කමිටු පැවැත්වීම | | | | | | | | | |
| 3 | 47 | 603 | 603 | 56760 | 180 | 7690 | 175 | - | - |

**මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය**



පොලිස් මූලස්ථානයේ අයිස්ක්‍රීම් දන්සැල



ගංවතුර ආධාර බෙදාදීම

## 2.5.4 මහජන සාමය කළමනාකරණය

උද්ඝෝෂණ, අරගල, සත්‍යාග්‍රහ වැනි විවිධ ජන කණ්ඩායම් ඒකරාශී වන අවස්ථාවලදී එම පිරිස් ප්‍රකෝපකාරී සහ ප්‍රචණ්ඩකාරී වීමේ ඉඩකඩක් පවතී. එබඳු අවස්ථාවල මහජනතාවගේ ජීවිත හා දේපළ ආරක්‍ෂා කර ගනිමින් සාමය ආරක්‍ෂා කර ගැනීමේ වගකීම පොලීසිය සතුවේ. එබඳු අවස්ථා වල සද්භාවයෙන් කටයුතු කරමින් එම පිරිස් විසුරුවා හැරීම් සිදු කරනු ලබන අතර, 2025 වසරේ සිදු කළ විසිරුවා හැරීම් සහ එහිදී භාවිතා කළ මානව හා භෞතික සම්පත් පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

වගු අංක 30

| අනු අංකය | කාර්යය | යොදාගත් ප්‍රමාණය |
|---|---|---|
| 1 | කණ්ඩායම් යෙදවීම | 566 |
| 2 | කළහකාරී පිරිස් විසුරුවා හැරීම | නැත |
| 3 | කඳුළු වායු උණ්ඩ භාවිතය | නැත |
| 4 | කඳුළු වායුබෝම්බ භාවිතය | නැත |
| 5 | ජල ප්‍රහාරක රථ (ජල ප්‍රහාර එල්ල කර ඇති සංඛ්‍යාව) | නැත |
| 6 | මුළු ජල පරිමාව (ලීටර්) | නැත |
| 7 | ජල ප්‍රහාරක රථ රාජකාරි යෙදවීම | 226 |

මූලාශ්‍රය - මහජන සාමය කළමනාකරණය

## 2.6. පොලිස් වෛද්‍ය සේවාව

ශ්‍රී ලංකා පොලීසියේ නිලධරයන් සඳහා ඉතා ගුණාත්මක සහ ඉහළ වෛද්‍ය පහසුකම් වලින් සමන්විත පොලිස් රෝහල් පද්ධතියක් ක්‍රියාත්මක වන අතර, එමගින් පොලිස් නිලධරයන් මෙන්ම ඔවුන්ගේ පවුල් වල විශාල පිරිසකට සෙත සැලසේ.

2023 - 2025 දක්වා වසර 03 ක කාලයක් සඳහා පොලිස් රෝහල් මගින් ක්‍රියාත්මක කළ වෛද්‍ය සේවාවන් පිළිබඳ පහත වගුව මගින් තොරතුරු දක්වා ඇත.

වගු අංක 31

| අනු අංකය | රෝගී තත්ත්වය | 2023 වසරේ රෝගීන් ප්‍රමාණය | 2024 වසරේ රෝගීන් ප්‍රමාණය | 2025 වසරේ රෝගීන් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. | දියවැඩියාව සහ රුධිර පීඩනය | 5363 | 85984 | 51916 |
| 2. | හෘද රෝග | 2495 | 11842 | 11903 |
| 3. | වෙනත් රෝග(සායන රෝගීන්) | 6479 | 51914 | 82942 |
| 4. | බාහිර රෝගීන් | 9256 | 125710 | 106466 |
| 5. | නේවාසික රෝගීන් | 5891 | 6646 | 7274 |
| එකතුව | | **29484** | **282096** | **260501** |

මූලාශ්‍රය - පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසය

## 2.6.1 පොලිස් නිලධරයන්ගේ මරණ

රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා බඳවා ගනු ලබන පොලිස් නිලධරයින් සඳහා සැලකිය යුතු පිරිවැයක් රජය විසින් දරනු ලබන අතර ඔවුන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහාද විශේෂ අවධානයක් යොමු කෙරේ. මෙබඳු වාතාවරණයක් තුළ සෑම වසරකම සිදුවන පොලිස් නිලධරයන්ගේ මරණ පිළිබඳ අවධානය යොමු කිරීමේදී බෝ නොවන රෝග මගින් සිදු වන මරණ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුය. පහත වගුව මගින් පසුගිය වසර තුනක පොලිස් නිලධරයන්ගේ මරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, එමගින් පොලිස් නිලධරයන්ගේ මරණ සිදු වීමට බලපෑ හේතු පිළිබඳ සංසන්දනාත්මකව විමසා බැලිය හැකි වේ.

වගු අංක 32

| අනු අංකය | මිය යාමට හේතුව | 2023 | | 2024 | | 2025 | |
|---|---|---|---|---|---|---|---|
| | | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ |
| 1 | විවිධ අසනීප | - | 63 | 1 | 43 | 1 | 49 |
| 2 | හෘදයාබාධ | - | 79 | 1 | 71 | 2 | 69 |
| 3 | පිළිකා | 2 | 18 | - | 20 | 2 | 24 |
| 4 | වකුගඩු ආබාධ | 1 | 18 | - | 41 | 2 | 23 |
| 5 | සියදිවි නසාගැනීම් | - | 11 | - | 14 | - | 7 |
| 6 | රිය අනතුරු | 1 | 30 | 2 | 32 | 2 | 43 |
| 7 | වෙනත් | - | 19 | - | 10 | - | 13 |
| එකතුව | | 4 | 238 | 4 | 231 | 9 | 228 |

මූලාශ්‍රය - පොලිස් සුබසාධන කොට්ඨාසය

## 2.7 බඳවා ගැනීම්, උසස් කිරීම් සහ ස්ථාන මාරු කිරීම්.

පොලිස් රාජකාරි කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස ප්‍රමාණවත් මානව සම්පතක් සපයා ගැනීම සඳහා නිසි කලට බඳවාගැනීම් සිදුකරනු ලබන අතර, සේවයේ නියුතු මානව සම්පත සඳහා සේවා තෘප්තිය වර්ධනය කිරීමේ අරමුණින් සුදුසු පරිදි උසස්වීම් ක්‍රියාත්මක කෙරේ. කලින් කලට ස්ථානමාරුවීම්ද සිදු කරනු ලබන අතර, 2025 වසරට අදාළව සිදු කරන ලද බඳවා ගැනීම්, උසස් කිරීම් හා ස්ථානමාරු කිරීම් සම්බන්ධ තොරතුරු පහත වගු මගින් දක්වා ඇත.

වගු අංක 33

**බඳවා ගැනීම්**

| තනතුර | උ.පො.ප. | කා.උ.පො.ප. | පො.කො. | කා.පො.කො. | පො.කො.රි. | එකතුව |
|---|---|---|---|---|---|---|
| සාමාන්‍ය පොලිස් රාජකාරි | 0 | 0 | 480 | 0 | 130 | **610** |
| විශේෂ කාර්ය බලකාය | 0 | 0 | 225 | 0 | 0 | **225** |
| සහයක සේවා | 10 | 0 | 0 | 0 | 0 | **10** |
| **මුළු එකතුව** | **10** | **0** | **705** | **0** | **130** | **845** |

මූලාශ්‍රය - බඳවාගැනීම් කොට්ඨාශය






නවක නිලධාරීන් විසිරයෑම

වගු අංක 34

## උසස් කිරීම්

| අනු අංකය | උසස්වීම් ලබා දීම | | නිලධරයන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | කලින් දැරූ තනතුර | උසස්වීම් ලද තනතුර | සාමාන්‍ය සේවය | වි.කා. බලකාය | සහයක සේවය | එකතුව |
| 1 | ජ්‍යෙ.නි.පො.ප. | පොලිස්පති | 1 | 0 | 0 | 1 |
| 2 | නි.පො.ප. | ජ්‍යෙ.නි.පො.ප. | 2 | 0 | 0 | 2 |
| 3 | ජ්‍යෙ.පො.අ. | නි.පො.ප. | 36 | 1 | 1 | 38 |
| 4 | කා.ජ්‍යෙ.පො.අ. | කා.නි.පො.ප. | 4 | 0 | 0 | 4 |
| 5 | පො.අ. | ජ්‍යෙ.පො.අ. | 36 | 1 | 0 | 37 |
| 6 | ක.පො.අ. | කා.ජ්‍යෙ.පො.අ. | 1 | 0 | 0 | 1 |
| 7 | ස.පො.අ. | පො.අ | 24 | 1 | 0 | 25 |
| 8 | කා.ස.පො.අ. | කා.පො.අ. | 0 | 0 | 0 | 0 |
| 9 | පො.ප. /ප්‍ර.පො.ප. | ස.පො.අ. | 39 | 2 | 0 | 41 |
| 10 | කා.පො.ප /කා.ප්‍ර.පො.ප. | කා.ස.පො.අ | 3 | 0 | 0 | 3 |
| 11 | පො.ප. | ප්‍ර.පො.ප. | 142 | 11 | 1 | 154 |
| 12 | කා.පො.ප. | කා.ප්‍ර.පො.ප. | 9 | 0 | 0 | 9 |
| 13 | උ.පො.ප. | පො.ප. | 635 | 50 | 0 | 685 |
| 14 | කා.උ.පො.ප. | කා.පො.ප. | 72 | 5 | 0 | 77 |
| 15 | පො.සැ | උ.පො.ප. | 471 | 120 | 0 | 591 |
| 16 | කා.පො.සැ. | කා.උ.පො.ප. | 58 | 0 | 0 | 58 |
| 17 | පො.සැ.රි. | මහ සැරයන්/රියදුරු | 60 | 2 | 0 | 62 |
| 18 | පො.කො. | පො.සැ | 2157 | 72 | 3 | 2232 |
| 19 | කා.පො.කො. | කා.පො.සැ | 336 | 0 | 0 | 336 |
| 20 | පො.කො.රි. | පො.සැ.රි | 176 | 6 | 0 | 182 |
| එකතුව | | | 4262 | 271 | 5 | 4538 |

මූලාශ්‍රය - මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය

වගු අංක 35

**2025 වසරේ ස්ථානමාරු කිරීම්**

| අනු අංකය | නිලය | ස්ථාන මාරුවීම් | | එකතුව |
|---|---|---|---|---|
| | | නිලධාරීන් | නිලධාරිණියන් | |
| 1 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 13 | 0 | 13 |
| 2 | නියෝජ්‍ය පොලිස්පති | 52 | 4 | 56 |
| 3 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 87 | 3 | 90 |
| 4 | පොලිස් අධිකාරී | 21 | 0 | 21 |
| 5 | සහකාර පොලිස් අධිකාරී | 144 | 3 | 147 |
| 6 | ප්‍රධාන පොලිස් පරීක්ෂක | 228 | 26 | 254 |
| 7 | පොලිස් පරීක්ෂක | 301 | 33 | 334 |
| 8 | උප පොලිස් පරීක්ෂක | 701 | 104 | 805 |
| 9 | උප පොලිස් පරීක්ෂක (ප්‍රවාහන) | 3 | 0 | 3 |
| 10 | පොලිස් සැරයන් | 2825 | 153 | 2978 |
| 11 | පොලිස් කොස්තාපල් | 3615 | 674 | 4289 |
| 12 | පොලිස් සැරයන් රියදුරු | 129 | 0 | 129 |
| 13 | පොලිස් කොස්තාපල් රියදුරු | 556 | 0 | 556 |
| එකතුව | | **8675** | **1000** | **9675** |

මූලාශ්‍රය - මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය

## 2.8 භෞතික සම්පත් සංවර්ධනය.

ආයතනයක් සතු මානව සම්පත උපරිම කාර්යක්ෂම මට්ටමට ළඟා කර ගනිමින් සේවා ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා භෞතික සම්පත් අවශ්‍ය ප්‍රමාණයට සපයා ගැනීම වැදගත් සාධකයකි. ශ්‍රී ලංකා පොලීසිය මෙම අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා වාර්ෂිකව විශාල පිරිවැයක් දරමින් ගොඩනැගිලි ඉදිකිරීම් සහ අලුත්වැඩියා කිරීම් නව පොලිස් ස්ථාන, පොලිස් කොට්ඨාස, මුරකුටි ආරම්භ කිරීම, නඩත්තු කටයුතු සහ පොලිස් රාජකාරි සඳහා අවශ්‍ය අනෙකුත් භාණ්ඩ හා සේවා සපයා ගැනීම සිදු කරනු ලබයි. ඒ යටතේ භෞතික සම්පත් සංවර්ධනයට අදාළ 2025 වසරේ කාර්ය සාධනය පහත අයුරින් වේ.

### 2.8.1 ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම්.

වගු අංක 36

| අනු අංකය | ගොඩනැගිලි වර්ගය | ප්‍රමාණය | සමස්ත ව්‍යාපෘතිය සඳහා වැය වන මුදල (රු.මි.) | 2025 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | 2025.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | පොලිස් ස්ථාන ඉදිකිරීම් | 10 | 1,486.59 | 214.03 | 204.46 |
| 2 | භට නිවාස ඉදිකිරීම් | 4 | 183.30 | 18.40 | 52.21 |
| 3 | නිල නිවාස ඉදිකිරීම් | 1 | 1,213.77 | 158.00 | 167.94 |
| 4 | වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම් | 8 | 2,014.15 | 18.50 | 11.28 |
| 5 | වෙනත් ගෙවීම් | 2 | - | - | 10.25 |
| 6 | පොලිස් ස්ථාන අලුත්වැඩියා කිරීම | 12 | 718.71 | 142.40 | 138.44 |
| 7 | භට නිවාස අලුත්වැඩියා කිරීම | 3 | 39.82 | 10.42 | 9.79 |
| 8 | නිල නිවාස අලුත් වැඩියා කිරීම. | 92 | 639.65 | 225.08 | 151.36 |

| අනු අංකය | ගොඩනැගිලි වර්ගය | ප්‍රමාණය | සමස්ත ව්‍යාපෘතිය සඳහා වැය වන මුදල (රු.මි.) | 2025 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | 2025.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | වෙනත් අලුත්වැඩියා කිරීම් | 95 | 2,908.28 | 292.10 | 305.25 |
| 9 | ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සංවර්ධනය | 2 | 333.27 | 23.00 | 13.75 |
| 10 | පොලිස් විද්‍යාලය සංවර්ධනය | 1 | 484.30 | 80.00 | 79.53 |
| එකතුව | | **265** | **10,059.10** | **1,181.93** | **1,181.52** |

**මූලාශ්‍රය - ගොඩනැගිලි කොට්ඨාසය**

## 2.8.2 පොලිස් ස්ථාන, පොලිස් කොට්ඨාස හා මුරකුටි ආරම්භ කිරීම.

2025 වසර තුළ ආරම්භ කරන ලද පොලිස් ස්ථාන, පොලිස් ක්‍රියාකාරී කොට්ඨාස, පොලිස් ප්‍රාදේශීය කොට්ඨාස සහ පොලිස් මුරකුටි සංඛ්‍යාව වගු අංක 37 මගින් දක්වා ඇති අතර, 2025.12.31 දිනට සමස්ත පොලිස් ස්ථාන, පොලිස් කොට්ඨාස, දිස්ත්‍රික්ක හා මුරකුටි සංඛ්‍යාවද එමගින් දක්වා ඇත.

**වගු අංක 37**

| | පොලිස් ස්ථාන | ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස | ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස | සහකාර පොලිස් අධිකාරී දිස්ත්‍රික්ක | පොලිස් මුරකුටි |
|---|---|---|---|---|---|
| 2025 වර්ෂය තුල ආරම්භ කළ සංඛ්‍යාව | 1 | 10 | 2 | 3 | 0 |
| **2025.12.31 දිනට මුළු සංඛ්‍යාව** | 608 | 77 | 47 | 199 | 277 |
| ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත සංඛ්‍යාව | 91 | 3 | 0 | 0 | 77 |
| * බී.එම්.අයි.සී.එච්. පොලිස් ස්ථානය තාවකාලිකව වසා ඇති අතර, ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත පොලිස් ස්ථාන සහ මුරකුටි සඳහා අනුමැතිය ලැබී ඇත. | | | | | |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

වගු අංක 38 ♦ **පොලිස් ස්ථාන ශ්‍රේණිගත කිරීම්.**

| | **2025.12.31 දිනට දිවයිනේ සියලු පොලිස් ස්ථාන පහත පරිදි ශ්‍රේණිගත කොට ඇත** | |
|---|---|---|
| අනු අංකය | ශ්‍රේණිය | පොලිස් ස්ථාන ගණන |
| 1 | A 1 අධි ශ්‍රේණිය | 0 |
| 2 | A1 | 82 |
| 3 | A2 | 103 |
| 4 | A3 | 142 |
| 5 | B | 152 |
| 6 | C | 75 |
| 7 | D | 54 |
| එකතුව | | **608** |

මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය

## 2.8.3 ශ්‍රී ලංකා පොලීසිය සතු වාහන.

2025 වසරේ ශ්‍රී ලංකා පොලිසිය වෙත මිලදී ගත් රථ වාහන නොමැති අතර, 2025.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසිය සතුව පවතින සමස්ත වාහන සංඛ්‍යාව සහ වාහන අලුත්වැඩියා කිරීම් පිළිබඳ තොරතුරු පහත වගු මගින් දක්වා ඇත.

වගු අංක 39

| අලුත්වැඩියාවේ ස්වභාවය | ජීප් රථ | කැබ් රථ | කාර් රථ | ට්‍රක් රථ | බස් රථ | ත්‍රීරෝද රථ | යතුරු පැදි | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන අලුත්වැඩියාවන් | 425 | 257 | 405 | 87 | 76 | 47 | 327 | 83 | 1707 |
| සුළු අලුත්වැඩියාවන් | 6407 | 4169 | 5616 | 412 | 424 | 2960 | 8245 | 11006 | 39239 |
| සේවා කිරීම් | 1439 | 971 | 1344 | 112 | 178 | 1718 | 4570 | 321 | 10653 |
| එකතුව | 8271 | 5397 | 7365 | 611 | 678 | 4725 | 13142 | 11410 | **51599** |
| ජංගම සේවා | 503 | | | | | | | | |

මූලාශ්‍රය - ප්‍රවාහන කොට්ඨාසය

වගු අංක 40

## 2025.12.31 දිනට ශ්‍රී ලංකා පොලිසිය සතු වාහන

| අනු අංකය | වාහන වර්ගය | පොලිස්පති යටතේ ලියාපදිංචි කළ වාහන | අණදෙන නිලධාරී විශේෂ කාර්ය බළකාය යටතේ ලියාපදිංචි කළ වාහන | එකතුව |
|---|---|---|---|---|
| 1 | ජීප් රථ | 1866 | 2 | **1868** |
| 2 | කාර් රථ | 701 | - | **701** |
| 3 | ගුවන්විදුලි කාර් රථ | 114 | - | **114** |
| 4 | සින්ගල් කැබ් රථ | 693 | 1 | **694** |
| 5 | ඩබල් කැබ් රථ | 117 | 3 | **120** |
| 6 | වෑන් රථ | 80 | 8 | **88** |
| 7 | ශිලන් රථ | 52 | - | **52** |
| 8 | ට්‍රක් රථ | 127 | 19 | **146** |
| 9 | ඩීමෝ බට්ටා රථ | 4 | - | **4** |
| 10 | බස් රථ | 151 | - | **151** |
| 11 | ජලබවුසර් රථ | 60 | 3 | **63** |
| 12 | ටැක්ටර් රථ | 112 | 19 | **131** |
| 13 | අත්ටැක්ටර් රථ | 10 | - | **10** |
| 14 | ගලි බවුසර් රථ | 13 | 2 | **15** |
| 15 | ත්‍රී රෝද රථ | 2346 | 7 | **2353** |
| 16 | යතුරු පැදි | 3986 | 117 | **4103** |
| 17 | අසුන් ප්‍රවාහන ට්‍රක් රථ | 5 | - | **5** |
| 18 | නිල සුනඛ රථ | 14 | - | **14** |
| 19 | ජල ප්‍රහාරක රථ | 15 | - | **15** |
| 20 | යුධ රථ | 1 | - | **1** |
| 21 | ආපදා රථ | 7 | - | **7** |
| 22 | යුනිකෝන් රථ | 5 | 1 | **6** |
| 23 | බූම්ට්‍රක් රථ | 3 | - | **3** |
| 24 | බෝට්ටු | 29 | - | **29** |
| 25 | බැකෝ/ බුල්ඩෝසර්/කැටපිලර් | 6 | 3 | **9** |
| 26 | ෆෝක් ලිපිට් රථ | 10 | 1 | **11** |
| 27 | බීච් රෝවර් රථ | 5 | - | **5** |
| 28 | ජංගම වැඩ රථ | 4 | - | **4** |
| 29 | ජංගම විවේක රථ | 1 | - | **1** |
| 30 | ටැක්ටර් ටේලර් | 132 | - | **132** |
| 31 | ටැක්ටර් ටේලර් බවුසර් රථ | 80 | - | **80** |
| 32 | ටැක්ටර් ගලි රථ | 5 | - | **5** |
| 33 | ගිනි නිවන රථ | 1 | - | **1** |
| 34 | ටිපර් රථ | 1 | - | **1** |
| 35 | ජංගම සෝදිසි රථ | 2 | - | **2** |
| 36 | ගල් රෝල | 1 | - | **1** |
| 37 | කැරියර් රථ | 1 | - | **1** |
| 38 | දියගොඩ රථ | - | 2 | **2** |
| 39 | බාධක | - | - | **0** |
| එකතුව | | 10760 | 188 | **10948** |

මූලාශ්‍රය - ප්‍රවාහන කොට්ඨාසය

### 2.8.4 වෙනත් භෞතික සම්පත්.

අපරාධ විමර්ශනය, රථ වාහන පාලනය, පුහුණු කටයුතු සහ පෙර ගමන් රාජකාරී ඇතුළු විවිධ උත්සව අවස්ථා සඳහා යොදාගනු ලබන නිල සුනඛයින් සහ අශ්වයින්ද ශ්‍රී ලංකා පොලීසිය සතු ඉතා වැදගත් භෞතික සම්පත් වේ. ඔවුන්ගේ සේවාව ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය විශාල පිරිවැයක් දරනු ලබන අතර, 2025.12.31 දිනට මෙම වත්කම් සම්බන්ධ තොරතුරු පහත වගු මගින් දක්වා ඇත.

වගු අංක **41** **2025.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසිය සතු නිල සුනඛයින් සම්බන්ධ තොරතුරු**

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය | සුනඛයින්ගේ මුල් වටිනාකම අනුව මුළු වටිනාකම රු. | 2025-12-15 දිනට තක්සේරු කරන ලද වටිනාකම අනුව මුළු වටිනාකම රු. |
|---|---|---|---|---|
| 1 | විදේශයෙන් ආනයනය කරන ලද සුනඛයින් | 50 | 85,316,371.44 | 84,967,778.40 |
| 2 | දැනට සිටින පරිත්‍යාග ලද සුනඛයින් | 111 | 3,785,000.00 | 24,321,150.00 |
| 3 | අභිජනනය කර ලබාගත් සුනඛයින් ප්‍රමාණය | 108 | 33,630,000.00 | 45,247,700.00 |
| 4 | දේශීයව මිල දී ගත් සුනඛයින් | 7 | 105,000.00 | 540,600.00 |
| 5 | දැනට සිටින නිල සුනඛයින් සංඛ්‍යාව | 276 | 122,836,371.44 | 155,077,228.40 |

**මූලාශ්‍රය - නිල සුනඛ කොට්ඨාසය**

වගු අංක **42** **2025.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසිය සතු අශ්වයින් සම්බන්ධ තොරතුරු**

| අශ්වයින් ප්‍රමාණය | අශ්වයින්ගේ වටිනාකම රු. |
|---|---|
| 33 | 110,923,033.00 |

**මූලාශ්‍රය - අශ්වාරෝහක කොට්ඨාසය**

### 2.8.5 ඉඩම් සහ ගොඩනැගිලි පරිහරණය.

ශ්‍රී ලංකා පොලීසිය, පොලිස් ස්ථාන, පොලිස් කාර්යාල, භට නිවාස, නිල නිවාස සහ අනෙකුත් විවිධ අවශ්‍යතා සඳහා භාවිතා කරනු ලබන ගොඩනැගිලි වල අයිතියේ ස්වභාවය සහ කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිලි සඳහා ගෙවනු ලබන මාසික සහ වාර්ෂික මුදල් ප්‍රමාණය පිළිබඳ තොරතුරු වගු අංක 43 මගින් දක්වා ඇත.

වගු අංක **43** ශ්‍රී ලංකා පොලීසිය සතු සහ කුලී පදනම මත ලබාගෙන ඇති ඉඩම් සහ ගොඩනැගිලි

| **2025.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසිය සතු ඉඩම් ප්‍රමාණය** | | | | **2025.12.31** වන දිනට ශ්‍රී ලංකා පොලීසිය සතු කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි ප්‍රමාණය | | කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි සඳහා **2025** වර්ෂය තුළ ගෙවා ඇති මුදල් ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ථානය | ඉඩම් ප්‍රමාණය | | | | | ගොඩනැගිලි ලබාගෙන ඇති කාර්යය | ප්‍රමාණය | මාසිකව ගෙවනු ලබන කුලී මුදල් ප්‍රමාණය (රු.) | වාර්ෂිකව ගෙවන ලබන කුලී මුදල් ප්‍රමාණය (රු.) |
| | අක්කර | රූඩ් | පර්චස් | | | | | | |
| පොලිස් ස්ථාන - 457 | 20 | 2 | 12.8 | පොලිස් කාර්යාල | 77 | පොලිස් කාර්යාල | 73 | 25,728,434.08 | 308,741,208.96 |
| පොලිස් කාර්යාල | 16 | - | 26.88 | පොලිස් ස්ථාන | 121 | පොලිස් ස්ථාන | 110 | 8,991,920.00 | 107,903,040.00 |
| මුරපොල | - | 3 | 24.54 | පොලිස් මුරපොල | 14 | පොලිස් මුරපොල | 8 | 97,222.50 | 1,166,670.00 |
| නිල නිවාස | 3 | 1 | 20 | නිල නිවාස හා භට නිවාස | 104 | නිල නිවාස හා භට නිවාස | 89 | 3,597,077.25 | 43,164,927.00 |
| | - | - | - | ගබඩා වෙනත් | 9 | - | - | - | - |
| **එකතුව -** | **41** | - | **4.22** | මුළු එකතුව | **325** | මුළු එකතුව | **280** | **38,414,653.83** | **460,975,845.96** |

**මූලාශ්‍රය - දේපළ කළමනාකරණ කොට්ඨාසය**

## 2.8.6 භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ ප්‍රගතිය.

පොලිස් රාජකාරි යටතට ගැනෙන සියලුම කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටු කර ගැනීම සඳහා ඉවහල් වන භාණ්ඩ හා සේවාවන් රාශියක් ශ්‍රී ලංකා පොලීසිය විසින් සෑම වසරකම සපයා ගනු ලැබේ. නිලධරයින් බඳවාගැනීමේ සිට ඔවුන් පුහුණු කිරීම, ඔවුන් සේවයේ යෙදවීම මෙන්ම අපරාධ විමර්ශන, කැරලි මර්දන, මත්ද්‍රව්‍ය නිවාරණ ආදී සියලුම පොලිස් කාර්යයන් සඳහා අවශ්‍ය කරනු ලබන භාණ්ඩ හා සේවා මේ යටතේ සපයා ගනු ලැබේ. ශ්‍රී ලංකා පොලීසිය 2025 වසරේ භාණ්ඩ හා සේවා සපයා ගැනීම පිළිබඳ තොරතුරු පහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක **44**

| අනු අං. | වැඩසටහන / ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති/ කාර්යයන් | **2025 වර්ෂයේ පළමු කාර්තුව අවසානයේ වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)** | **2025 වර්ෂයේ (2025.12.31) ITMis අනුවවෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.)** | **වියදම (රු.මි.) (2025.12.31)** | **අතැති බිල් (රු.මි.)** | **මේ වන විට ප්‍රගතිය (%) (අංක II) හි සඳහන් ප්‍රතිපාදන අනුව (2025.12.31)** |
|---|---|---|---|---|---|---|---|
| | | | **(I)** | **(II)** | **(III)** | **(IV)** | **(V)** |
| | | පුනරාවර්තන වියදම් | | | | | |
| 1 | 1201 | ලිපි ද්‍රව්‍ය | 0.90 | 1.19 | 1.19 | - | 100% |
| එකතුව | | | **0.90** | **1.19** | **1.19** | - | 100% |
| 2 | 1203-(1) | සත්ත්ව ආහාර | 200.00 | 74.00 | 74.00 | - | 100% |

| අනු අං. | වැඩසටහන / ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති/ කාර්යයන් | 2025 වර්ෂයේ පළමු කාර්තුව අවසානයේ වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | 2025 වර්ෂයේ (2025.12.31) ITMis අනුවවෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) (2025.12.31) | අතැති බිල් (රු.මි.) | මේ වන විට ප්‍රගතිය (%) (අංක II) හි සඳහන් ප්‍රතිපාදන අනුව (2025.12.31) |
|---|---|---|---|---|---|---|---|
| 3 | 1203-(2) | නිල ඇඳුම් | 4,600.00 | 2,188.00 | 2,188.00 | - | 100% |
| **එකතුව** | | | **4,800.00** | **2,262.00** | **2,262.00** | - | 100% |
| 4 | 1205-(5) | ගබඩා උපකරණ | 396.00 | 593.00 | 79.00 | - | 14% |
| 5 | 1205-(6) | උණ්ඩ | 234.00 | 250.00 | 102.00 | | 41% |
| 6 | 1205-(7) | ඇඟිලි සටහන් ද්‍රව්‍ය | 10.00 | 20.00 | | | - |
| 7 | 1205-(8) | ඡායාරූප ද්‍රව්‍ය / SOCO ද්‍රව්‍ය | 90.00 | 30.00 | | - | - |
| **එකතුව** | | | **730.00** | **893.00** | **181.00** | - | 21% |
| 8 | 1409-(138) | යන්ත්‍ර හා කාර්යාල උපකරණ සේවා කිරීම | 0.31 | 0.31 | 0.31 | - | 100% |
| 9 | 1409-(140) | පුවත්පත් දැන්වීම් පල කිරීම / ප්‍රසම්පාදන කමිටු සඳහා | 7.52 | 7.46 | 7.46 | - | 100% |
| **එකතුව** | | | **7.83** | **7.77** | **7.77** | - | 100% |
| **පුනරාවර්තන වියදම් එකතුව** | | | **5,538.73** | **3,163.96** | **2,451.96** | - | **78%** |
| | | **ප්‍රාග්ධන වියදම්** | | | | | |
| 10 | 2102-(1) | ගෘහ උපකරණ | 25.00 | 1.00 | | - | - |
| 11 | 2102-(3) | සුබ සාධන | 25.00 | 1.00 | | - | - |
| 12 | 2102-(4) | කාර්යාල උපකරණ | 50.00 | 19.00 | 18.00 | - | 95% |
| 13 | 2102-(5) | විදුලි උපකරණ | 100.00 | 71.00 | 70.00 | - | 98% |
| 14 | 2102-(6) | පරිගණක | 300.00 | 38.00 | 37.00 | - | 97% |
| **එකතුව** | | | **500.00** | **130.00** | **125.00** | - | **96%** |
| **15** | 2103-(1) | අවි | 5.00 | | | | - |
| **16** | 2103-(3) | ඡායාරූප / SOCO උපකරණ | 50.00 | 41.00 | **39.00** | | - |
| **17** | 2103-(4) | රථවාහන | 5.00 | | | - | - |
| 18 | 2103-(4) | ඇඟිලි සටහන් උපකරණ | 5.00 | | | - | - |
| 19 | 2103-(6) | තූර්ය වාදන උපකරණ | 5.00 | | | - | - |
| 20 | 2103-(7) | කැරළි මර්දන උපකරණ | 5.00 | | | - | - |
| 21 | 2103-(8) | අශ්වයින් සඳහා උපකරණ | 5.00 | | | - | - |
| 22 | 2103-(9) | නිල සුනඛයින් සඳහා උපකරණ | 5.00 | | | - | - |
| 23 | 2103-(17) | වෙනත් උපකරණ | 235.00 | 216.00 | 214.00 | - | 99% |
| **එකතුව** | | | **320.00** | **257.00** | **253.00** | - | 98% |
| 24 | 2106 | මෘදුකාංග සංවර්ධනය | 1,000.00 | 25.00 | 23.00 | - | 90% |
| **එකතුව** | | | **1,000.00** | **25.00** | **23.00** | - | 90% |
| 25 | 12-2509 | අශ්වයින් මිලදී ගැනීම | 100.00 | - | - | - | - |
| **එකතුව** | | | 100.00 | - | - | - | - |
| **ප්‍රාග්ධන වියදම් එකතුව** | | | **1,920.00** | **412.00** | **401.00** | - | **97%** |
| **මුළු එකතුව** | | | **7,458.73** | **3,575.96** | **2,852.96** | - | **80%** |

**මූලාශ්‍රය - සැපයුම් කොට්ඨාසය**

## 2.9 ශ්‍රී ලංකා පොලීසියේ ඉදිරි ඉලක්ක.

ශ්‍රී ලංකා පොලීසිය සිය කාර්ය භාරයන් ඉදිරියේදී වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටු කිරීම සඳහා ඉලක්කගත ව්‍යාපෘති හා වැඩසටහන්, අපරාධ මර්දනය, මත් උවදුර මැඩලීම නව තාක්ෂණික උපාය මාර්ග භාවිතය, රිය අනතුරු අවම කිරීම, භෞතික හා මානව සම්පත් සංවර්ධනය යන අංශ යටතේ පහත අයුරින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

### 2.9.1 අපරාධ විමර්ශනය හා මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ ඉදිරි ඉලක්ක.

I. නොවිසඳුනු අපරාධ විසඳීම සඳහා ස්වංක්‍රීය ඇඟිලි සටහන් හඳුනාගැනීමේ පද්ධතිය තවදුරටත් ව්‍යාප්ත කරමින් අපරාධකරුවන්ගේ වාර්තා සහ ඇඟිලි සටහන් සහිත දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.

II. අපරාධ ස්ථාන පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ලෙස අතුල් පතුල් සටහන් හඳුනාගැනීම සඳහා මෘදුකාංගයක් නිර්මාණය කිරීම සහ අතුල් පතුල් සටහන් ඩිජිටල් කැමරා මඟින් ඡායාරූප ගත කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිපාදන ලබා ගැනීමට අදාළව මූලික කටයුතු ක්‍රියාවට නැංවීම.

III. දැනට පවතින පැරණි අපරාධ හෝරා හා සිතියම් නවීකරණය කරන ලද පිටපතකට වැඩිදියුණු කිරීම තුළින් දිවයිනේ අපරාධ මර්දන කටයුතු වේගවත් කිරීම.

IV. අපරාධ ස්ථාන පරීක්ෂණය සඳහා වන නව තාක්ෂණික දැනුම නිලධාරීන් වෙත ලබා දීම සඳහා දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා පැවැත්වීම.

V. දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ආවේක්ෂණ කටයුතු නූතන තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ සිදු කරමින් ඔවුන් නැවත අපරාධ කිරීමේ ප්‍රවණතාව අවම මට්ටමකට ගෙන ඒම.

VI. සංවිධානාත්මක අපරාධ විමර්ශන කටයුතු සාර්ථකව සිදු කිරීම සඳහා ඒ හා සම්බන්ධ දත්ත විශ්ලේෂණ කටයුතු නවීන තාක්ෂණය භාවිතයෙන් සිදු කිරීම.

VII. 118 මඟින් ලබාගන්නා මහජන පැමිණිලි දැනට දුරකථන මඟින් පොලිස් ස්ථාන හා කාර්යාල වෙත විමර්ශනය සඳහා යොමු කරන අතර, ඉදිරි වර්ෂය තුළදී එම පැමිණිළි www.pubsec.118.gov.lk දරණ සබැඳිය මඟින් අදාළ පොලිස් ස්ථාන වෙත යොමු කිරීමට හැකි වන පරිදි පද්ධතිය වැඩිදියුණු කිරීම.

VIII. ළමයින් හා කාන්තාවන්ට සිදු වන අපරාධ හා හිංසන ක්‍රියා පිළිබඳ පැමිණිලි විමර්ශනය හා අධිකරණ ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම සම්බන්ධ සමස්ත ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා කටයුතු සකස් කිරීම.

IX. 109 විශේෂ මෙහෙයුම් මැදිරිය වෙත යොමු වන තොරතුරු සඳහා ක්ෂණික පියවර ගැනීම තුළින් ළමා හා කාන්තා හිංසනය අවම කිරීමට කටයුතු කිරීම.

X. වින්දිත, අනාරක්ෂිත, සැකකාර ළමුන් පසු විපරම් කිරීම සඳහා කටයුතු කිරීම මෙන්ම වීදි ළමුන්, සිඟමනේ යෙදෙන ළමුන් හා අනාරක්ෂිත ළමුන් භාරයට ගැනීම තුළින් ළමා හිංසනය අවම කිරීමට කටයුතු කිරීම.

XI. පොදු ප්‍රවාහන සේවයේ දී කාන්තාවන්ට සිදු වන හිංසනය අවම කිරීම සඳහා ක්ෂණික වැටලීම් සිදු කිරීම.

XII. අන්තර්ජාලය තුළින් සිදු වන ළමා ලිංගික සූරා කෑම් පිළිබඳ විමර්ශන කටයුතු සිදු කිරීමට NCMEC CMT භාවිතා කිරීම.

XIII. අන්තර්ජාල හා පරිගණක අපරාධ මඟින් ප්‍රජාව ආරක්ෂා කිරීම හා ඔවුන් දැනුවත් කිරීම සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

XIV. ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් සහ පොලිස් ස්ථාන වලින් පොදු මහජනතාවගේ ජන ජීවිතයට බලපාන්නා වූ අපරාධ සහ සමාජීය ගැටළු අවම කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති සකස් කර ක්‍රියාත්මක කිරීම.

### 2.9.2 රිය අනතුරු වැළැක්වීම සම්බන්ධ ඉදිරි ඉලක්ක.

I. අධිවේගී මාර්ග ආශ්‍රිත රිය අනතුරු අවම කිරීම සඳහා පොලිස් ජංගම සංචාර හා යතුරු පැදි සංචාර විධිමත්ව ක්‍රියාත්මක කිරීම.

II. අධිවේගී මාර්ගය ආශ්‍රිත රිය අනතුරු සිදු වීමේ වැඩි සම්භාවිතාවක් ඇති ධාවන වේලාවන් හා කාලගුණික විපර්යාසයන් සිදු වන අවස්ථාවන් මෙන්ම අනෙකුත් විශේෂ කරුණු පිළිබඳ රියදුරන් දැනුවත් කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතය මෙන්ම අධිවේගී මාර්ග පිවිසුම් දොරටු නිලධාරීන් ඒ සඳහා දායක කර ගැනීම.

III. රිය අනතුරු දත්ත උපයෝගී කර ගනිමින් විද්‍යාත්මක ප්‍රවේශයන් ඔස්සේ විශ්ලේෂණාත්මකව රිය අනතුරු බහුල ප්‍රදේශ හඳුනාගෙන අනතුරට හේතු වූ කරුණු සඳහා පිළියම් යෙදීමේ ක්‍රමවේදය වේගවත් කිරීම සඳහා රිය අනතුරු දත්ත කළමනාකරණ පද්ධතිය පුළුල් කිරීම.

IV. රිය අනතුරු සඳහා බලපාන වාහන පරීක්ෂා කර තහනම් නියෝග නිකුත් කිරීමේ මෙහෙයුම් තව දුරටත් ව්‍යාප්ත කිරීම.

V. මාර්ග තදබදය අවම කිරීම සඳහා රථ වාහන ධාවනය පිළිබඳව සහ මාර්ග වල භෞතික ස්වභාවය පිළිබඳව තව දුරටත් පුළුල් ලෙස අධ්‍යනය කර කෙටි කාලීන හා දිගු කාලීන විසඳුම් ඉදිරිපත් කිරීම.

VI. රිය අනතුරු වැළැක්වීම සඳහා නව තාක්ෂණික උපාය මාර්ග භාවිතය සඳහා අවශ්‍ය දැනුම හා තාක්ෂණික මෙවලම් භාවිතය ප්‍රවර්ධනය කිරීම.

VII. සමාජයේ සෑම ස්ථරයක්ම නියෝජනය වන පරිදි දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම තුළින් රිය අනතුරු අවම කර ගැනීමට පියවර ගැනීම.

VIII. මත්ද්‍රව්‍ය ලබාගෙන රිය පදවන රියදුරන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය උපකරණ දිවයිනේ සියලුම පළාත් සහ කොට්ඨාස වෙත ලබා දීම සහ එම උපකරණ භාවිතය පිළිබඳ නිලධාරීන් පුහුණු කිරීම.

IX. සෑම පොලිස් ස්ථානයකටම Video සහිත නවීන වේග මාපක යන්ත්‍ර ලබා දීම මගින් වේග සීමා පිළිබඳ ඉතා නිවැරදි තොරතුරු ලබා ගැනීම.

X. රථවාහන වැරදි සඳහා දඩමුදල් ගෙවීම දුරකථනය මගින් සිදු කිරීමේ පහසුකම ලබා දීම මගින් එම ක්‍රියාවලිය පහසු කිරීම.

XI. මාර්ගවල රාජකාරි කරනු ලබන සෑම නිලධාරියෙකුටම නිළ ඇඳුමේ පැළඳිය හැකි කැමරාවක් ලබා දීම.

### 2.9.3 මානව සම්පත් සංවර්ධනය සම්බන්ධ ඉදිරි ඉලක්ක.

I. එක්සත් ජාතීන්ගේ සාම සාධක පොලිස් බලමුළු රාජකාරි සඳහා විශේෂ කාර්ය බලකා නිලධාරීන් යොමු කිරීම.

II. ලෝකයේ පවතින නවීන පොලිස් ක්‍රම පිළිබඳව ශ්‍රී ලංකා පොලීසියේ නිලධරයන්ට දැනුම ලබා දීම සඳහා දෙස් විදෙස් පාඨමාලා වෙත ඔවුන් යොමු කිරීම.

III. පොලිස් නිලධරයන්ගේ පරිගණක දැනුම ඉහළ දැමීම සඳහා විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන මගින් අවශ්‍ය විෂය දැනුම ලබා දීම.

IV. වර්තමාන සමාජයට ගැළපෙන න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලත් දක්ෂ පොලිස් නිලධරයෙකු පොලිස් රාජකාරී සඳහා යොමු වන බවට සහතික වනු පිණිස දැනට පොලිස් අභ්‍යාස ආයතනය, පොලිස් විද්‍යාල සහ සේවස්ථ පුහුණු ආයතන මඟින් සිදු කරනු ලබන පුහුණු පාඨමාලා වැඩිදියුණු කිරීම.

V. ප්‍රජා පොලිස් සංකල්පය ක්‍රියාත්මක කිරීමෙහි නියුතු නිලධරයන්ගේ දැනුම කුසලතා වර්ධනය සඳහා පාඨමාලා, වැඩමුළු ක්‍රියාත්මක කිරීම.

VI. නව බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුගමනය කරමින් නිසි කලට බඳවාගැනීම් හා උසස් කිරීම් සිදු කර පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම.

VII. ඉදිරියේදී සිදු කිරීමට නියමිත බඳවාගැනීම් පහත පරිදි ක්‍රියාත්මක කෙරේ.

වගු අංක **45**

| අනු අංකය | නිලය | බඳවා ගැනීමට නියමිත අංශ | බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව | | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | | | 2025 | 2026 යෝජිත | |
| 1 | උප පොලිස් පරීක්ෂක | සාමාන්‍ය පොලීසිය | | 300 | උ.පො.ප. 200, පො.කො. 1300 දෙනෙකු බඳවා ගැනීමට පසුබිම් පරීක්ෂණ ආරම්භකර ඇත. සාමාන්‍ය පොලිස් සේවයේ හා විශේෂ කාර්ය බලකායේ ඉතිරි සියලුම තනතුරු සඳහා අයදුම්පත් කැඳවා පලකිරීම සඳහා ගැසට්පත්‍ර කෙටුම්පත් කර අවසන් කර ඇත. |
| 2 | කාන්තා උප පොලිස් පරීක්ෂක | | | 50 | |
| 3 | පොලිස් කොස්තාපල් | | | 2150 | |
| 4 | කාන්තා පොලිස් කොස්තාපල් | | | 1000 | |
| 5 | පොලිස් කොස්තාපල් රියදුරු | | | 250 | |
| 6 | උප පොලිස් පරීක්ෂක | විශේෂ කාර්ය බලකාය | | 50 | |
| 7 | පොලිස් කොස්තාපල් | | | 320 | |
| 8 | කාන්තා පොලිස් කොස්තාපල් | | | 80 | |
| 9 | පොලිස් කොස්තාපල් රියදුරු | | | 50 | |

මූලාශ්‍රය - බඳවාගැනීම් කොට්ඨාසය

* 2024.03.28 දිනැති රජයේ ගැසට් නිවේදන අංක 2378 ට අදාළව 2024 වර්ෂයේ බඳවාගැනීම් සිදුකිරීමෙන් පසුව ප්‍රමුඛතාලත් ඉතිරි අයදුම්කරුවන් අතරින්, 2025 වර්ෂයට අදාළ බඳවාගැනීම් සිදු කිරීම සඳහා රාජ්‍ය කළමනාකරණ සේවා අනුමැතිය ලැබී ඇති උ.පො.ප. පො.කො. පො.කො.රි. යන තනතුරුවලට බඳවාගැනීමට අනුමැතිය ලබා ගැනීමට මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත.

VIII. නිලධරයන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය වර්ධනය කිරීම සඳහා විවිධ සායන පැවැත්වීම සහ භෝජනාගාරවල සෞඛ්‍යාරක්ෂිත ආහාර වට්ටෝරු සකස් කිරීම තුළින් බෝ නොවන රෝග වලින් මුදවා ගැනීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම.

IX. මාස 06 කට වරක් සෑම නිලධරයෙක්ම වෛද්‍ය පරීක්ෂණයක් සඳහා යොමු කිරීමට කටයුතු කිරීම තුළින් ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ නිවැරදිව හඳුනාගෙන අවශ්‍ය ඉදිරි පියවර ගැනීම.

X. මානව සම්පත් සංවර්ධන සැලැස්මට අනුගත වෙමින් සෑම නිලධාරියෙකුටම ධාරිතා සංවර්ධනය සඳහා පැය 12 ක අවම පුහුණුවක් ලබා දීම.

### 2.9.4 භෞතික සම්පත් සංවර්ධන ඉලක්ක.

I. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රයෝජනය සඳහා අධික වැය බරක් දරමින් කුලී පදනම මත ලබාගෙන තිබූ පුද්ගලික පාර්ශවයන් සතු ගොඩනැගිලි කිහිපයක් තුළ ස්ථාපිත කර තිබූ කොට්ඨාස එම ගොඩනැගිලි වලින් ඉවත් කර රජයේ වියදම් අවම කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

II. පොලිස් ප්‍රවාහන කොට්ඨාසයේ කටයුතු තවදුරටත් පුළුල් කිරීම සඳහා ප්‍රවාහන උප ඒකක ස්ථාපිත කිරීම.

III. පොලිස් ප්‍රවාහන පද්ධතින් පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම සඳහා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය හා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා සංගමයේ සම්බන්ධීකරණය යටතේ රථවාහන ලබා ගැනීම.

IV. විදේශීය නිල සුනඛයින්ගෙන් තෝරාගත් සුනඛයින් මඟින් අභිජනනය සඳහා සුනඛයින් වෙන් කර ඵලදායී අන්දමින් පැටවුන් බිහිකර කොට්ඨාසයේ අභිවෘද්ධිය වෙනුවෙන් යොදා ගැනීම.

V. දැනට ස්ථාපිත කර ඇති පර්යේෂණ හා විශ්ලේෂණ ඒකකය වැඩි දියුණු කර පර්යේෂණ විශ්ලේෂණ හා සංවර්ධන ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.

VI. නියෝජ්‍ය පොලිස්පති බල ප්‍රදේශ, පරිපාලන දිසත්‍රික්කවල මායිම් වලට සමපාත වන පරිදි සීමා නිර්ණය කර අවසන් කිරීම.

VII. සහකාර පොලිස් අධිකාරී දිස්ත්‍රික්ක සීමා නිර්ණය කර ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශ කිරීම.

VIII. ශ්‍රී ලංකා පොලීසියේ ඉතිහාසයට අයත් වැදගත් අංග විදහා දක්වන ඡායාරූප ගැලරියක් ආරම්භ කිරීම.

IX. සිදු කිරීමට නියමිත ඉදිකිරීම් සහ අලුත්වැඩියා කිරීම් පහත පරිදි වේ.

වගු අංක **46** **සිදු කිරීමට නියමිත ඉදිකිරීම් ව්‍යාපෘති**

| අනු අංකය | ගොඩනැගිලි වර්ගය | ප්‍රමාණය | සමස්ත ව්‍යාපෘතිය සඳහා වැය වන මුදල (රු.මි.) | 2025 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | පොලිස් ස්ථාන ඉදි කිරීම් | 9 | 1,616.86 | 170.00 |
| 2 | භට නිවාස ඉදි කිරීම් | 2 | 180.60 | 47.50 |
| 3 | නිල නිවාස ඉදි කිරීම් | 1 | 1,213.77 | 20.00 |
| 4 | වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම් | 14 | 2,445.50 | 202.75 |
| 5 | පොලිස් ස්ථාන අලුත්වැඩියා කිරීම | 12 | 657.66 | 130.00 |
| 6 | භට නිවාස අලුත්වැඩියා කිරීම | 5 | 132.88 | 31.66 |
| 7 | නිල නිවාස අලුත් වැඩියා කිරීම. | 98 | 1,043.32 | 322.16 |
| 8 | වෙනත් අලුත්වැඩියා කිරීම් | 89 | 3,047.48 | 371.18 |
| 9 | ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සංවර්ධනය | 1 | 1,185.13 | 100.00 |
| 10 | පොලිස් විද්‍යාලය සංවර්ධනය | 1 | 484.30 | 100.00 |
| **එකතුව** | | **232** | **12007.5** | **1495.25** |

**මූලාශ්‍රය - ගොඩනැගිලි කොට්ඨාසය**

X. ස්ථාපිත කිරීමට නියමිත පොලිස් ස්ථාන, මුරකුටි, ප්‍රාදේශීය සහ ක්‍රියාකාරී කොට්ඨාස පහත පරිදි වේ.

වගු අංක **47** **යෝජිත පොලිස් ස්ථාන, මුරකුටි, ප්‍රාදේශීය සහ ක්‍රියාකාරී කොට්ඨාස**

| අනු අංකය | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | පොලිස් ස්ථාන | 608 |
| 2 | පොලිස් මුරපොල | 277 |
| 3 | ප්‍රාදේශීය කොට්ඨාස | 47 |
| 4 | ක්‍රියාකාරී කොට්ඨාස | 77 |
| **එකතුව** | | **1009** |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

## 2.9.5 නව තාක්ෂණය භාවිත කිරීමේ ඉදිරි ඉලක්ක.

I. සයිබර් ආරක්ෂණ හා විවෘත මූලාශ්‍ර විශ්ලේෂණ ඒකකයක් ආරම්භ කිරීම.
II. ඇඟිලි, අතුල් පතුල් සටහන් ඩිජිටල් මාධ්‍ය ඔස්සේ ඡායාරූපගත කිරීම මඟින් එම ක්ෂේත්‍රය තවදුරටත් දියුණු මට්ටමට ගෙන ඒම සහ ඒ තුළින් අපරාධ විමර්ශන කටයුතු වේගවත් කිරීම.
III. රථවාහන වැරදි අවම කිරීම සඳහා CCTV තාක්ෂණය ඔස්සේ නිරීක්ෂණය කර දඩ පත්‍රිකා ලබා දීම.

IV. නවීන තාක්ෂණයෙන් යුත් වීඩියෝ පහසුකම් සහිත TRU CAM වේග මාපක යන්ත්‍ර සෑම පොලිස් ස්ථානයකටම ලබා දීම.

V. රථවාහන වැරදි සඳහා ක්ෂණික දඩ මුදල් අයකර ගැනීම හා රියදුරු අකුසලතා ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා නව තාක්ෂණික ක්‍රමවේදයක් සකස් කිරීම.

VI. ශ්‍රී ලංකාවේ රථවාහන අනතුරු සංඛ්‍යා දත්ත පවත්වාගෙන යාම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රධානයක් ලෙස ශ්‍රී ලංකා පොලීසිය වෙත ලැබුණු, (SLADMS) මෘදුකාංගය සහ දත්ත සුරකුම් පද්ධතිය භාවිතා කිරීම මඟින් රථවාහන වැරදි අවම කිරීමට ක්‍රමවේද සැකසීම.

VII. මත්පැන් ගෙන රිය පදවන රියදුරන් හඳුනාගැනීම සඳහා දැනට භාවිතා කරනු ලබන ඇල්කොලයිසර් නළ වලට අමතරව ඇල්කොවයිසර් යන්ත්‍ර භාවිතය ප්‍රවර්ධනය කිරීම.

VIII. Google සමාගම, TikTok Low Enforcement Portal සමඟ එක්වී ළමා අපයෝජන වැළැක්වීම සඳහා කටයුතු කිරීම.

IX. කාලය හා ශ්‍රමය කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගැනීම සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ සියල්ල අන්තර්ජාලය ඔස්සේ TEAM, ZOOM තාක්ෂණය භාවිතයෙන් සිදු කිරීම දැනට ආරම්භ කර ඇති අතර ඉදිරියේ දී මෙම තාක්ෂණය භාවිතය තව දුරටත් පුළුල්ව ක්‍රියාත්මක කිරීම.

X. විශාල වාර්තා ප්‍රමාණයක් දෛනිකව කැඳවනු ලබන ආයතනයක් ලෙස ඒවා Google forms, Microsoft forms වැනි තාක්ෂණික ක්‍රම භාවිතයෙන් කැඳවීම තුළින් කාලය හා ශ්‍රමය ඉතිරි කර ගැනීම.

XI. වෙබ් පාදක පරිගණක පද්ධති හා Cloud base තාක්ෂණය තුළින් ගොනු, ලේඛන ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන අති විශාල දත්ත ප්‍රමාණය පරිගණක වැඩසටහන් වලට ඇතුළත් කර ඉතා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සහ භෞතික ලිපි ලේඛන රහිත කාර්යාල පරිසරයක් නිර්මාණය කිරීම.

XII. Microsoft 365 ගිණුම් භාවිතය පිළිබඳ පොලිස් නිලධාරීන් පුහුණු කිරීම තුළින් මහජනතාව වෙත ලබා දෙන සේවාව කාර්යක්ෂම කිරීම.

XIII. දිවයින පුරා පිහිටුවා ඇති අපරාධ ස්ථාන පරීක්ෂණාගාර දැනට ජාලගත කර ඇති අතර, ඒ හා සම්බන්ධ ලිපි ලේඛන කටයුතු සම්පූර්ණයෙන්ම විද්‍යුත් තැපෑල මඟින් සිදු කිරීම.

XIV. සී.සී.ටී.වී ඩ්‍රෝන කැමරා ඇතුළු නවීන තාක්ෂණික පහසුකම් සහිත ජංගම රථ ලබාගෙන රථවාහන සහ අනෙකුත් ආවේක්ෂණ රාජකාරී සඳහා යෙදවීම.

XV. මහජන කැළඹීම්, උද්ඝෝෂණ ආදී අවස්ථා පිළිබඳ මැනවින් අධ්‍යයනය කර අවශ්‍යය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නවීන ඩ්‍රෝන කැමරා තාක්ෂණය පුළුල් ලෙස උපයෝගී කර ගැනීම.

XVI. පොලිස් ස්ථාන හා විවිධ විමර්ශන ඒකක මඟින් සිදු කරනු ලබන අපරාධ විමර්ශන කටයුතු පහසුවෙන් කළමණාකරණය කර ගැනීම සඳහා පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම.

XVII. තාක්ෂණය මත පදනම් වූ අපරාධ විමර්ශනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන නිලධරයන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කිරීම.

XVIII. ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය පරිගණක පද්ධති පොලිස් නිලධරයන් ලවාම සැකසීම සඳහා අවශ්‍ය උසස් තාක්ෂණික දැනුම ලබා දීම.

ප්‍රියන්ත වීරසූරිය
පොලිස්පති

ප්‍රියන්ත වීරසූරිය
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 02

# පරිච්ඡේදය 03

# වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 | | සටහන | තත්‍ය 2025 | තත්‍ය 2024 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 127,835,578,000 | 120,104,698,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 808,138,185 | 466,598,315 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 1,042,048,908 | 895,187,583 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **129,685,765,094** | **121,466,483,898** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **129,685,765,094** | **121,466,483,898** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | - | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **129,685,765,094** | **121,466,483,898** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 84,435,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 82,686,026,050 | 100,372,885,765 | |
| 47,780,000,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 40,611,554,904 | 16,107,997,111 | ඒසීඒ-2(ii) |
| 702,169,716 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 424,238,586 | 293,593,456 | |
| - | පොළී ගෙවීම් | 8 | | 241,378,301 | |
| 2,830,284 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 2,830,284 | 839,469 | |
| **132,920,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **123,724,649,825** | **117,016,694,102** | |
| | **මූලධන වියදම්** | | | | |
| 3,790,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 3,543,781,093 | 1,867,928,861 | |
| 4,770,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 3,269,149,909 | 2,003,084,126 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 200,000,000 | හැකියා වර්ධනය | 14 | 186,142,763 | 117,555,397 | |
| 620,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | - | 75,291,527 | |
| **9,380,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **6,999,073,765** | **4,063,859,911** | |
| | තැන්පතු ගෙවීම් | | 638,757,096 | 461,870,476 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 1,946,118,739 | 1,338,326,534 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 2,584,875,835 | **1,800,197,010** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 133,308,599,425 | **122,880,751,022** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (3,622,834,331) | **(1,414,267,124)** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (3,622,834,331) | (1,414,267,124) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | | ඒසීඒ-3 |
| | | | (3,622,834,331) | **(1,414,267,124)** | |

## 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| | | | ඒසීඒ -පී |
| **2025 දෙසැම්බර් 31 දිනට** | | | |
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය** | | | |
| | | තත්‍ය | |
| | සටහන | **2025** | **2024** |
| | | රු. | රු. |
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ -6 | 172,586,367,028 | 112,404,526,604 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ -5 | 2,167,077,174 | 1,263,007,342 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ -3 | - | - |
| **මුළු වත්කම්** | | **174,753,444,202** | **113,667,533,946** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 1,757,437,088 | 1,022,754,706 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 172,586,367,028 | 112,404,526,604 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ -5(බී)** | | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ -4 | 409,640,086 | 240,252,636 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ -3 | - | - |
| **මුළු වගකීම්** | | **174,753,444,202** | **113,667,533,946** |

පිටු අංක 01 සිට 25 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 26 සිට 126 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තරගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදි මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසදීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : ඩී.ඩබ්ලිව්.ආර්.බී.සෙනෙවිරත්න
තනතුර : ලේකම් මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
දිනය : 2026.02. 27

ගණන්දීමේ නිලධාරී
නම : ප්‍රියන්ත වීරසූරිය
තනතුර : පොලිස්පති
දිනය : 2026.02. 05

ප්‍රියන්ත වීරසූරිය
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 02

ප්‍රධාන ගණකාධිකාරී
නම : ඒ.එල්.ඒ.සී. පෙරේරා
දිනය : 2026.02. 25

## 3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | සත්‍ය | |
|---|---|---|
| | | සංශෝධිත |
| | 2025 | 2024 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | රු. | රු. |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | | |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | - | 4,079,163,159 |
| අත්තිකාරම් අයකර ගැනීම් | - | 120,104,698,000 |
| තැන්පතු ලැබීම් | 1,037,156,412 | 899,177,715 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | 127,835,578,000 | 466,598,315 |
| | **128,872,734,412** | **125,549,637,189** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | |
| සහනාධාර සහ මාරුකිරීම් | (122,291,368,689) | 116,979,811,111 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම , මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය | - | 241,378,301 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | - | |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 4,797,483,175 |
| අත්තිකාරම් ගෙවීම් | | - |
| තැන්පතු ගෙවීම් | 1,951,141,043 | 1,341,004,347 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | - | 461,870,476 |
| | **(120,340,227,647)** | **123,821,547,410** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | |
| | **249,212,962,059** | **1,728,089,780** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | | |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | - | 1,728,089,780 |
| | - | **1,728,089,780** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | | |
| | - | **(1,728,089,780)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | **249,212,962,059** | **(0)** |
| දේශීය ණය ගැනීම් | | |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | |
| | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | | |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **249,212,962,059** | **(0)** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **(249,212,962,059)** | - |
| | - | - |

## 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

2025.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය ප්‍රකාශන සකස් කොට ජාතික විගණන කාර්යාලය වෙත 2026 පෙබරවාරි මස 28 දින භාර දී ඇත. එම වාර්තාව තුල සියලු මූල්‍ය ප්‍රකාශ සටහන් ඇතුළත් කර ඇත.

## 3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

වගු අංක 48

**රු.,000**

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුදල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම ඇස්තමේන්තුවේ % ලෙස |
| 2002.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | **119,000** | **119,000** | **153,078** | **129%** |
| 2002.02.99 | පොලිසිය - අනෙකුත් | **30,000** | **30,000** | **67,681** | **226%** |
| 2003.99.00 | අනෙකුත් ලැබීම් | **125,000** | **125,000** | **203,321** | **163%** |
| 2003.02.99 | විකුණුම් සහ ගාස්තු | **800,000** | **800,000** | **1,259,702** | **157%** |
| 2004.01.00 | සමාජ රක්‍ෂණ දායක මුදල් | | | **3,734,954** | |

**මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පරිගණක ඇස්තමේන්තු**

## 3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

**වගු අංක 49**

රු.000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | තත්‍ය වියදම | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | **136,100,000** | **132,920,000** | **123,724,650** | **93%** |
| ප්‍රාග්ධන වියදම් | **8,200,000** | **9,380,000** | **6,999,074** | **75%** |

**මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පරිගණක ඇස්තමේන්තු**

**3.8** මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වගු අංක 50

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | රු. 000 |
| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
| | | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| 1 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | ඉන්ධන බිල්පත් ගෙවීම | 767,778 | 767,778 | 767,778 | 100% |
| 2 | ශ්‍රී ලංකා රේගුව | රේගු ගාස්තු ගෙවීම | 144,490 | 144,490 | 144,490 | 100% |
| 3 | රජයේ කර්මාන්ත ශාලා | යතුරුලියන අලුත්වැඩියා | 6,409 | 6,409 | 6,409 | 100% |
| 4 | ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රවාහන දීමනා ඉන්දන දිමනා | 70,468 | 70,468 | 70,468 | 100% |
| 5 | විදේශ කටයුතු අමාත්‍යාංශය | ජාත්‍යාන්තර පොලිස් ආයතනයේ සාමාජික ගාස්තු | 27,499 | 27,499 | 27,499 | 100% |
| 6 | දුම්රිය දෙපාර්තමේන්තුව | නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු | 107,502 | 107,502 | 107,502 | 100% |
| 7 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියා | 582,255 | 582,255 | 582,255 | 100% |
| 8 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | රජයේ මුද්‍රණ සඳහා ගෙවීම් | 36 | 36 | 36 | 100% |
| 9 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | ඩී. එන්. ඒ විශ්ලේෂණ වාර්තා සඳහා ගෙවීම | 32,378 | 32,378 | 32,378 | 100% |
| 10 | සෞඛ්‍ය අමාත්‍යාංශය | වෛද්‍ය වැටුප් හා දීමනා ගෙවීම් කටයුතු, දුරකථන බිල්පත් | 86,246 | 86,246 | 86,246 | 100% |

මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පරිගණක ඇස්තමේන්තු

## 3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වගු අංක **51**

| | | | | | රු. 000 |
|---|---|---|---|---|---|
| වත්කම් කේතය | කේත විස්තරය | **2025.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **2025.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම. |
| **9151** | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | **57,790,578** | | |
| **9152** | යන්ත්‍රෝපකරණ | | **38,550,696** | | |
| **9153** | ඉඩම් | | **73,182,743** | | |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | | **150,305** | | |
| **9154** | ජීව විද්‍යාත්මක වත්කම් | | **-** | | |
| **9160** | කෙරීගෙන යන වැඩ | | **2,913,044** | | |
| **9180** | බදු දෙන ලද වත්කම් | | **-** | | |

මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී දෙපළ කළමනාකරණ කොට්ඨාසය

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | JLO/D/POL/FR/2025 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2026 ජූනි 12 දින |

පොලිස්පති
ශ්‍රී ලංකා පොලිසිය

**ශීර්ෂය 225 - ශ්‍රී ලංකා පොලිසියේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 225 - ශ්‍රී ලංකා පොලිසියේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලිසිය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත්කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ශ්‍රී ලංකා පොලිසියේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ශ්‍රී ලංකා පොලිසියේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා පොලිසිය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලිසිය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන

ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමෙ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් යටතේ රු.112,404,526,604ක දේපළ පිරියත උපකරණ සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.150,785,673,063ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක දේපළ පිරියත උපකරණවල ශේෂය රු.38,381,146,459කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.266,000,261ක් වටිනා අශ්වයින් 33ක් හා සුනඛයින් 276ක් ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත සහ උපකරණ ශේෂය තුළ ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන ඇමුණුම (vii) අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වවුචරයක් අස්ථානගත නොවූ ලෙස සඳහන්කර තිබුණ ද, ගොඩනැගිලි කොට්ඨාශයට අයත් 2025 මැයි 24 දිනැති අංක 269/25 දරන රු.23,399,337ක් වටිනා ගෙවීම් වවුචරයේ මුල් පිටපත අස්ථාන ගත වී තිබුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 02ක් සඳහා මු.රෙ. 66 මගින් සියයට 98ක් සහ සියයට සියය ඉක්මවා ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණු අතර, වැය විෂයන් 05ක් සඳහා මු.රෙ. 66 මගින් සියයට 26 සිට 100ක් දක්වා ප්‍රතිපාදන ඉවත් කර තිබුණි. තව ද, එක් වැය විෂයකට සියයට 47ක් පරිපූරක මගින් ප්‍රතිපාදන ඉවත්කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී සුනඛයින් මිලදීගැනීම සඳහා වෙන්කරන ලද රු.මිලියන 100ක් සහ මෘදුකාංග සංවර්ධනය සඳහා මූලික ඇස්තමේන්තුව මගින් වෙන්කර ගෙන තිබුණු රු. මිලියන 1,000ක මුදලින් මු.රෙ. 66 මගින් රු. මිලියන 920ක් එනම් මූලික ප්‍රතිපාදනයෙන් සියයට 92ක් අදාළ කාර්යය සිදුනොකර සම්පූර්ණ ප්‍රතිපාදනයම මු.රෙ. 66 මගින් වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබුණු අතර ඉතිරි රු. මිලියන 80න් රු. මිලියන 56ක් එනම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 71ක් ඉතිරි වී තිබුණි.

(ඇ) 2021 සිට 2025 දක්වා වූ කාලසීමාව තුළ ඉන්දියානු ණය වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කරන ලද රු. මිලියන 620, අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු වාහන මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ දී මු.රෙ. 66 මගින් මාරුකර තිබුණු රු. මිලියන 1,200 සහ මෘදුකාංග නඩත්තුව සඳහා වෙන්කර තිබුණු රු. මිලියන 75ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු වියදමක් සමාලෝචිත වර්ෂය තුළ දී සිදුකර නොතිබුණි.

### 3.2 බැරකම් හා බැඳීම්වලට එළැඹීම

සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් බැරකම්වලට බැඳීම් ප්‍රකාශනයේ මු.රෙ. 94(2) අනුව පුනරාවර්තන වියදම් වැය විෂයයන් සඳහා බැරකම්වලට බැඳීම් ලෙස රු.64,576,555ක් ද, මු.රෙ. 94(3) අනුව වාර්ෂික පුනරාවර්තන නොවන වියදම් වැය විෂයයන් සඳහා බැරකම්වලට බැඳීම් ලෙස රු.78,889,580ක් ද දක්වා තිබුණ ද, අදාළ බැරකම්වලට බැඳීම් භාණ්ඩාගාරයට ඉදිරිපත්කර නොතිබුණි.

### 3.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 136, 137, 138 හා 139 | වාහන අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට පෙර, භාණ්ඩ මිලදීගැනීමේ ඇණවුම් ඉදිරිපත් කිරීමට පෙර සහ වාහන අලුත්වැඩියා සඳහා මුදල් ගෙවීමේ දී ඊට අදාළ තත්ත්ව පරික්ෂණ වාර්තා ලබා නොගෙන එකතු වටිනාකම රු.5,082,851ක් වූ චෙක්පත් නිකුත්කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2022 ජුලි 08 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 2 වන ඡේදය | ළමා හා කාන්තා කටයුතු කොට්ඨාසයේ NCMAC මධ්‍යස්ථානයට සමාලෝචිත වර්ෂය තුළ දී රු.21,751,919ක් වූ කාර්යාල උපකරණ සහ පරිගණක ආදිය ආධාර ලෙස ලබා දී තිබුණ ද, එම වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | නව පොලිස් මූලස්ථානයේ වාහන නැවැත්වීමේ ප්‍රදේශය සහ ඇතුල්වීමේ දොරටු අවට ප්‍රදේශයේ වර්ග මීටර් 3,700ක් කාපට් (Asphalt Concrete) යොදා සංවර්ධනය කිරීම සඳහා 2024 මැයි රු.14,451,137ක වැටබදු (VAT) රහිත ඇස්තමේන්තු 2ක් සකස්කර තිබුණු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති ක්‍රමවේදයන් අනුගමනය කිරීමකින් තොරව ප්‍රසම්පාදන ලිපිගොනුවේ සඳහන් දිනයන්ට පෙර සංවර්ධන කටයුතු සිදුකර ඊට පසු ප්‍රසම්පාදන ලිපිගොනුව පිළියෙලකර තිබුණි. |

### 3.4 තැන්පතු

(අ) මු.රෙ. 571(2) ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු මු.රෙ. 570 පරිදි හැකි ඉක්මනින් ආපසු ගෙවීම හෝ අදාළ ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැරකළ යුතු වුව ද, තැන්පතු ගිණුම් 4ක වසර 2ක් ඉක්ම වූ තැන්පතු රු.35,729,564ක් නියාදනය කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ දී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු.45,837,000ක පරිත්‍යාග මුදල වියදම් කිරීමෙන් අනතුරුව ඉතිරිව පවතින රු.11,503,192ක මුදලක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් තාවකාලිකව රඳවාගැනීමේ තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) තෙවන පාර්ශවයක් වෙත නැවත ගෙවීම් කිරීම සඳහා තැන්පත් ගිණුමේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන රාජසන්තක කර තිබූ රු.4,945,656ක මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රඳවා තබාගෙන තිබුණි.

(ඇ) පොලිස් ත්‍යාග අරමුදල විසින් සිදුකරනු ලබන ඉදිකිරීම්වලට අදාළ කොන්ත්‍රාත් රඳවීම් (Retention) රු.4,600,112ක් තැන්පතු ගිණුම් ගිණුම් ගතව තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

ශ්‍රී ලංකාවේ නීතිය හා සාමය පවත්වාගෙන යාම සඳහා ප්‍රධාන වගකීම දරන ශ්‍රී ලංකා පොලිසිය "සුරක්ෂිත හා සාමකාමී සමාජයක් නිර්මාණය කිරීම" යන දැක්ම යටතේ ක්‍රියාත්මක වන අතර, නීතිය ක්‍රියාත්මක කිරීම, අපරාධ වැළැක්වීම, මහජන ආරක්ෂාව තහවුරු කිරීම සහ සමාජයේ සාමය පවත්වා ගැනීම යන

මූලික මෙහෙවරයන් ඉටුකිරීම සඳහා වන ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන කාර්යයන් ඉටුකිරීමේ කාර්ය සාධනය පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) **බල අපරාධ වාර්තා වීම**

(i) මහජනතාවගේ සුරක්ෂිතභාවය සඳහා සෘජුවම බලපාන දරුණු ගණයේ අපරාධ හෙවත් ග්‍රහණ අපරාධ ලෙස ද හඳුන්වනු ලබන බල අපරාධ ප්‍රධාන කාණ්ඩ 26 අතරින් සමලෝචිත වර්ෂයේ දී අපහරණය, බරපතල තුවාල සිදුකිරීම, ගෙවල් බිඳීම, රු.500,000කට වඩා වටිනාකමින් යුතු සාපරාධී සාවද්‍ය පරිහරණය හෝ සාපරාධී විශ්වාසය කඩකිරීම හා වංචා කිරීම, ළමුන්ට කෘර ලෙස සැලකීම සහ මනුෂ්‍ය ඝාතනය යන බල අපරාධ පිළිවෙළින් 618, 1635, 9603, 5869, 165 සහ 536ක් ලෙසට වාර්තා වී තිබුණි.

(ii) කාන්තාවන්ට එරෙහිව සිදුවී තිබෙන බල අපරාධ කාණ්ඩ 14ක් අතරින් සමාලෝචිත වර්ෂය තුළ මිනීමැරීම, ස්ත්‍රී දූෂණය, බරපතල තුවාල සිදුකිරීම සහ බරපතල ලෙස ලිංගික අපයෝජනය කිරීම යන බල අපරාධ 2020 සිට 2025 දක්වා වූ කාලපරිච්ඡේදයේ පිළිවෙලින් 508, 411, 459, 589, 567 සහ 577ක් වශයෙන් වාර්තා වී තිබුණි.

(iii) ළමයින්ට එරෙහිව සිදුවී තිබෙන බල අපරාධ කාණ්ඩ 15ක් සඳහා සමාලෝචිත වර්ෂයේ පැමිණිලි 3,209ක් වාර්තා වී තිබූ අතර මිනීමැරීම, ස්ත්‍රී දූෂණය (16ට අඩු කැමැත්ත ඇතිව), ස්ත්‍රී දූෂණය (16ට අඩු කැමැත්ත නැතිව), බරපතල ලෙස ලිංගික අපයෝජනය සහ අපහරණය කිරීම යන බල අපරාධ 2021 සිට 2025 දක්වා වූ කාලපරිච්ඡේදයේ පිළිවෙලින් 2875, 2821, 2764, 2907ක් සහ 2778ක් ලෙස වාර්තා වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ දී දේපළ පිළිබඳ වැරදි 26,557ක් වාර්තා වී ඉන් පැමිණිලි 14,127ක් විසඳා ඇත. ඒ අනුව පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය සියයට 53ක අවම මට්ටමක පැවතුණි.

(ආ) **මත්ද්‍රව්‍ය අපරාධ වාර්තා වීම**

(i) අත්අඩංගුවට ගනු ලබන නිද්‍රාජනක ද්‍රව්‍ය වන ගංජා, අබිං, හෂිෂ්, හෙරොයින්, මොෆින්, කොකේන්, අයිස්, බාබුල්, මාවා, මත්පෙති, මත් මුද්දර සහ වේදනා නාශක පෙති වැනි සිද්ධීන් සඳහා 2022,2023,2024, හා 2025 වර්ෂවල පිළිවෙලින් නඩු 142,632 ක් 175,781ක් 222,888ක් හා 303,560ක් පැවරීමට කටයුතුකර තිබුණු අතර, 2024 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වාර්තා වූ සිද්ධීන් ගණන 80,775කින් හෙවත් සියයට 36කින් ඉහළ ගොස් තිබුණි.

(ii) පොලිස්පති චක්‍රලේඛ අංක 2766/2024 පරිදි දිවයිනේ පිහිටි පාසල් 10,701ම ආවරණය වන පරිදි පොලිස් ස්ථාන බල ප්‍රදේශ මට්ටමින් පවුර සංසද ස්ථාපිත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට පාසල් 5,202 එනම් සියයට 49ක පමණක් පවුර සංසද පිහිටුවා තිබුණු අතර වාර්ෂිකව පවුර සංසද රැස්වීම 128,412ක් පැවැත්විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ දී රැස්වීම 15,968ක් එනම් සියයට 12ක් පමණක් පවත්වා තිබුණි.

(ඇ) **රිය අනතුරු වාර්තාවීම**

සමාලෝචිත වර්ෂයේ වාර්තා වූ 2,549ක මාරක රිය අනතුරු හේතුවෙන් 2,721ක් මියගොස් 7,890ක් බරපතල තුවාල ලබා තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මාරක රිය අනතුරු, බරපතල තුවාල අනතුරු හා අනතුරු මගින් මියගිය සංඛ්‍යාව පිළිවෙලින් සියයට 12, 17ක් හා 14ක් ලෙස වැඩි වී තිබුණි. ඒ අනුව වාහනවල ගමන් කරන මගීන්ගේ සහ මහා මාර්ගවල ගමන් කරන පදිකයින්ගේ ජීවිතවල සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) **මහජන පැමිණිලි විසඳීමෙ විශේෂිත සේවා**

සමාලෝචිත වර්ෂයේ දි "පොලිස්පති මහජන සහන දිනය", "පොලිස්පතිට කියන්න වැඩසටහන" සහ "මහජන සහන මැදිරිය" යන විශේෂිත සේවා යටතේ පැමිණිලි 9,314ක් වර්තා වි ඇති අතර, ඉන් පැමිණිලි 4,465ක් පමණක් විසදා තිබුණි.

(ඉ) **ප්‍රජා පොලිස් කමිටු සහ මහජන ආරක්ෂක කමිටු පැවැත්වීම**

(i) පොලිසිය හා ප්‍රජාව අතර පුළුල් සම්බන්ධතාවයක් ගොඩනගා ගනිමින් අපරාධ නිවාරණය හා සමාජ විරෝධි ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා ප්‍රජාවගේ පුළුල් සහභාගිත්වයක් ලබා ගැනිම තුළින් සාමකාමී සමාජ පරිසරයක් ඇතිකිරිමෙ මූලික අරමුණින් ප්‍රජා පොලිස් කමිටු සහ මහජන ආරක්ෂක කමිටු ස්ථාපිතකර ඇති අතර, සමාලෝචිත වර්ෂයේ දි පැවැත්විය යුතු ප්‍රජා පොලිස් කමිටු සංඛ්‍යාව 42,576ක් වුවත්, පවත්වා තිබුණු කමිටු සංඛ්‍යාව 37,037ක් වූ අතර, පැවැත්විය යුතු මහජන ආරක්ෂක කමිටු සංඛ්‍යාව 84,750ක් වුවත්, පවත්වා තිබුණු කමිටු සංඛ්‍යාව 65,186ක් වි තිබුණි.

(ii) කිලිනොච්චිය පොලිස් ස්ථානයේ ප්‍රජා පොලිස් ඒකකය විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් සලකා බැලිමෙ දි 2025 ජනවාරි සිට අගෝස්තු දක්වා වූකාලපරිච්ඡේදය තුළ පවත්වන ලද රැස්විම් ගණන, සංචාර ගණන, පාසල් දේශන ගණන හා අපරාධ පිළිබඳ දැනුවත් කිරිම් ගණන ඉකුත් වර්ෂයේ ඒම කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයකින් අඩු වි ඇති අතර එය පිළිවෙලින් සියයට 42ක්, සියයට 77ක්, සියයට 46ක් හා සියයට 42ක් වූ අතර මුළු සංචාර, දේශන හා දැනුවත් කිරිම් රැස්විම ගණන 4,307කින් එනම් සියයට 74කින් අඩු වි තිබුණි.

(ඊ) **පොලිස් නිශ්කාෂණ වාර්තා නිකුත්කිරිම**

කිලිනොච්චිය පොලිස් කොට්ඨාශයට සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ පොලිස් නිශ්කාෂණ වාර්තා ලබාගැනිම සඳහා ඉල්ලිම් 477ක් ලැබි තිබූ අතර, ඉන් ඉල්ලිම් 215ක් විමර්ශන කටයුතු අවසන්කර නොතිබුණි. ඒ අනුව සමස්තයක් ලෙස විමර්ශන අවසන් කිරිමෙ ප්‍රගතිය සියයට 55 ක අවම ප්‍රතිශතයක්ව පැවතුණි.

### 4.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 4,159ක් වූ කණිෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන්ගේ විවාහක නිල නිවාස ඉදිකිරීම, රථ වාහන මූලස්ථානය ඉදිකිරීම, වැලිගම, කොල්ලුපිටිය, මල්ලාවි සහ මුලතිව් පොලිස් ස්ථානය ඉදිකිරීම හා නාරාහේන්පිට පොලිස් ස්ථානවල වැඩ අවසන් කිරීම යන ප්‍රමාද වූ ව්‍යාපෘති 07 සඳහා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 334ක ප්‍රතිපාදන සලසාදී තිබුණ ද, වියදම රු. මිලියන 323ක් විය. රථවාහන මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණු අතර, ප්‍රමාද වූ මෙම ව්‍යාපෘති 07හි වර්තමාන ප්‍රගතිය ද මන්දගාමීව පැවතීම නිසා ව්‍යාපෘති ආරම්භක අරමුණු ඉටුවීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි.

(ආ) ජීවමාන වීඩියෝ දර්ශන ලබාගනිමින් ආවේක්ෂණ කටයුතු සිදුකිරීම, මාර්ග නීති උල්ලංඝණය කිරීම නිරීක්ෂණය කිරීම සහ කොළඹ නගරයේ රථ වාහන ගමනාගමනය පාලනය කිරීම, කොළඹ නගරයට පැමිණෙන සහ කොළඹ නගරයේ ජීවත්වන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම ආදී වූ සුවිශේෂ කාර්යභාරයන් ඉටුකිරීමේ අරමුණින් කොළඹ නගරයේ ප්‍රධාන ස්ථාන 33ක කැමරා 108ක් ස්ථාපිතකර තිබුණ ද, 2024 අගෝස්තු වන විට ඉන් ස්ථාන 06ක් සම්පූර්ණයෙන් ද ඇතුළුව ස්ථාන 23ක කැමරා 37ක් අක්‍රිය වී තිබුණි. කැමරා පද්ධතිය ආරම්භ කරන කාලය වන විට පරිගණක මෙහෙයුම් පද්ධතිය (OS) ලෙස භාවිතා කරන ලද Windows XP යෙදුම භාවිතා කරමින් මෙහෙයුම් කටයුතු ආරම්භකර තිබුණු අතර, 2014 වර්ෂයෙන් පසු මයිකොසොෆ්ට් ආයතනය Windows XP සඳහා ලබාදෙන පහසුකම් නවතා දමා තිබුණි. නවීන සී.සී.ටී.වී. පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 11.18ක් වෙන්කර තිබුණ ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

උසස් පුහුණු පොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් විසින් ඉංගිරිය නිමලගම ග්‍රාම නිලධාරී වසමේ සොයිසාවත්ත නැමති ඉඩමෙන් අක්කර 12යි රූඩ 02 පර්චස් 18.7 ක භූමි ප්‍රමාණයක් ශ්‍රී ලංකා පොලීසිය වෙත වෙන්කර දී තිබුණු අතර, යෝජිත ඉදිකිරීම සඳහා රු.8,895,273ක වියදමක් දරමින් ගොඩනැගිලි තුනක් ඉදිකිරීම ආරම්භකර තිබුණි. 2024 පෙබරවාරි 21 දින ඉඩම් පැවරුම් පත්‍රය අනුව නියත වශයෙන් අක්කර 04 රූඩ 02 පර්චස් 7.2ක ඉඩම් ප්‍රමාණයක් පමණක් ශ්‍රී ලංකා පොලීසියට පවරා දී තිබුණ ද පවරාගැනීමේ අරමුණ වෙනුවෙන් ඉඩම යොදවා නොතිබුණි.

## 4.2 ප්‍රසම්පාදනයන්

### (අ) පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලයන් සඳහා පික් කැප් 75,000ක් මිලදීගැනීම

පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලයන් සඳහා පික් කැප් 75,000ක් එක්සත් ජනපද ඩොලර් 414,000 (CIF) වටිනාකමකට (රු.93,455,119 බදු සහ සියලු දේශීය වියදම් ඇතුළත්ව) සැපයීම සඳහා 2010 වර්ෂයේ දී ආරක්ෂක අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි. ශ්‍රී ලංකා පොලීසිය විසින් 2011 පෙබරවාරි 11 දින මෙම සැපයුම් පිරිනමා ඇති අතර, 2011 මාර්තු 15 දින සැපයුම්කරු හා ශ්‍රී ලංකා පොලීසිය අතර ප්‍රසම්පාදන ගිවිසුමට එළැඹ තිබුණු අතර, 2011 අගෝස්තු 30 දින සැපයුම් ගිවිසුම අවසන් කිරීමට කටයුතු කරන බව සැපයුම්කාර ආයතනයට දැනුම් දී තිබුණි. සැපයුම්කාර ආයතනය විසින් එම ප්‍රසම්පාදනය අවලංගු කිරීම නීති විරෝධී බව සඳහන් කරමින් පොලීසියට විරුද්ධව බේරුම්කරණය සඳහා යොමුවී තිබුණු අතර, 2023 වර්ෂය දක්වාම බේරුම්කරණ තීරණය ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම හේතුවෙන් 2023 ජනවාරි 26 දක්වා වූ

කාලසීමාව සඳහා සැපයුම්කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු, ප්‍රමාදවීම මත පොලිය හා විදේශ විනිමය අනුපාත වැඩිවීමේ අවාසිය ද ශ්‍රී ලංකා පොලිසියට දැරීමට සිදුවී තිබුණු අතර, ඒ සඳහා රු.289,138,812ක් ගෙවා තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනය ප්‍රතික්ෂේප කිරීමට ඉදිරිපත් කරන ලද හේතු සාධක බේරුම්කරණයේ දී තහවුරු කිරීමට අපොහොසත්වීමත්, බේරුම්කරණ අභියාචනයක් ඉදිරිපත්කළ නොහැකිව තිබිය දී එසේ කිරීමට උත්සහ කිරීමත් හේතුවෙන් රු.93,455,119ක් වූ ආරම්භක පිරිවැය ඇස්තමේන්තුව රු.289,138,812ක් දක්වා වර්ධනය වී ගෙවා තිබුණි. මෙ අනුව රු.195,683,693ක් වැඩිපුර මුදලක් ගෙවීමට සිදුවී තිබුණු අතර, නිෂ්පාදනය කර වසර 12කට අධික කාලයක් ගත වී ලබාගෙන තිබුණු පික් කැප් තොගය භාවිතා කිරීමට නුසුදුසු තත්ත්වයෙන් පැවතුණි.

(ආ) **හබරාදූව "නිල සෙවන" නිවාස සංකීර්ණය**

හබරාදූව "නිල සෙවන" යෝජනා ක්‍රමයෙන් නිවසක් රු. මිලියන 3.8 බැගින් රු. මිලියන 729.6කට නිවාස 192ක් මිලදීගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළැඹ තිබුණි. 2019 අප්‍රේල් 02 දින වන විට රු. මිලියන 500ක අත්තිකාරම් ගෙවා තිබුණු අතර, මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූ රාජ්‍ය සේවකයන් හට නිවාස ලබාදීම වුවත්, සමාලෝචිත වර්ෂයේ විගණන පරීක්ෂණය සිදුකරන විටත් මෙම ව්‍යාපෘතියෙන් කිසිදු නිවසක් පොලිස් නිලධාරින් හට පදිංචිය සඳහා ලබාදීමට නොහැකි වී තිබුණි. 2025 ජනවාරි වන විටත් මෙම නිවාස පවරාගැනීම අවසන්ව නොතිබුණු අතර, ගෙවන ලද රු. මිලියන 500ට නිවාස 128ක් පමණක් පවරාගැනීමට යෝජනා වී තිබුණ ද, ඒ සඳහා අවසන් එකඟතාවක් ඇතිවී නොතිබූ අතර, එම නිවාස ඒකක 128 සඳහා රු.500,000,000ක් ගෙවා තිබීම නිසා රු.13,600,000ක රජයට අයත් මුදලක් බාහිර පාර්ශවයක තුළ වසර 06කට වැඩි කාලයක් රඳවා තැබීමට ඉඩ හැර තිබීම මගින් රජයට පාඩුවක් වී තිබුණි.

(ඇ) **පොලිස් අශ්වාරෝහක කොට්ඨාශයේ අශ්වයින් සඳහා අවශ්‍ය විටමින් වර්ග මිලදීගැනීම**

පොලිස් අශ්වාරෝහක කොට්ඨාශයේ අශ්වයින් 36ක් සඳහා අවශ්‍ය විටමින් වර්ග මිලදි ගැනීම, ප්‍රසම්පාදන කාලසටහන අනුව දළ ඇස්තමේන්තු සකස්කර අනුමැතියට යොමු කිරීමේ දින සිට ගෙවීම් සිදුකිරීම දක්වා මාස 08කට අඩු කාලයක් තුළ දී සැලසුම්කර තිබුණු නමුත්, නියමිත පරිදි ක්‍රියාත්මක නොවී 2025 මාර්තු 19 දින දක්වා දීර්ඝ වී තිබුණි. ඒ අනුව අශ්වයින්ට ලබාදිය යුතු විටමින් මාස 06කට අධික කාලයක් නියමිත පරිදි ලබා දී නොතිබුණු අතර, පැවති විටමින් ප්‍රමාණය එම කාලසීමාව තුළ සමානුපාතිකව අඩුකරමින් අශ්වයින්ට ලබා දී තිබුණි.

## 4.3 වත්කම් කළමනාකරණය

(අ) 2006 වර්ෂයේ දී ඉදිකිරීම් කටයුතු ආරම්භකර තිබූ කොළඹ නාගරික රථවාහන කොට්ඨාශයේ නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2024 ඔක්තෝබර් වන විට රු.237,731,881ක මුදලක් කොන්ත්‍රාත්කරුට සහ රු.8,797,704ක් උපදේශන සේවා ආයතනයට ගෙවා තිබුණු අතර, එය එකඟ වූ වටිනාකමින් සියයට 61ක් පමණ වන නමුත් ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 46ක් පමණ විය. නමුත් 2021 වර්ෂයේ සිට ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණු අතර, වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුවක් ප්‍රකාරව ඉදිකිරීම් සමාගම ඇවරකර තිබීම හේතුවෙන් විධිමත් පරිදි ඉදිකිරීම් නොකිරීමේ වගකීම කොන්ත්‍රාත්කරුට පැවරිය නොහැකි වී තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා පොලිසිය සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබාගැනීම**

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් වන විට පොලිස් කාර්යාල 77ක්, පොලිස් ස්ථාන 121ක්, පොලිස් මුරපොල 14ක්, නිලනිවාස සහ හට නිවාස 104ක්, ගබඩා 04ක් සහ වෙනත් කාර්යයන් සඳහා ගොඩනැගිලි 05ක් ලෙස ගොඩනැගිලි 325ක් කුලී ගෙවීමේ පදනමට ලබාගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා ගොඩනැගිලි කුලිය ලෙස රු.546,481,390ක් ගෙවා තිබුණි. ඒ තුළ වර්ෂයකට රු.10,000,000 ඉක්ම වූ කුලියක් ගෙවමින් පොලිස් කාර්යාල පවත්වාගෙන යාමට ගොඩනැගිලි 10ක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.269,174,724ක් ගෙවා තිබුණි.

(ii) ගුන්ඩ්පාස් පොලිස් ස්ථාන පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා රු.4,272,000ක් ගෙවමින් කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගෙන තිබුණු අතර, එම පොලිස් ස්ථානය 1931 වර්ෂයට පෙර සිටම කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව වර්ෂ 100කට ආසන්න කාලයක් කුලී පදනම මත රැඳී සිටිය ද සුදුසු ස්ථානයක ශ්‍රී ලංකා පොලිසිය සඳහාම ගොඩනැගිල්ලක් ඉදිකර මෙම පොලිස් ස්ථානය ඒ තුළ ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි.

(iii) පොලිස් ස්ථාන, පොලිස් කොට්ඨාශ කාර්යාල, පොලිස් මුරපොල, නිලනිවාස, හට නිවාස (බැරැක්ක) හා ගබඩා සහ අනෙකුත් කාර්යයන් සඳහා 2023, 2024 හා 2025 වර්ෂයන්වල දී පිළිවෙලින් ගොඩනැගිලි 325ක්, 331ක් හා 325ක් ලෙස පිළිවෙලින් රු. මිලියන 659, රු. මිලියන 738ක් හා රු. මිලියන 546ක් ගෙවමින් ගොඩනැගිලි කුලියට ලබාගෙන තිබුණි. විධිමත් දීර්ඝ කාලීන සැලසුමකට අනුව ගොඩනැගිලි අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ප්‍රමුඛතා ලැයිස්තුවකට අනුව ඉදිකිරීම් සිදුකර නොතිබූ බව හා ආරම්භ කරන ලද ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ අතරමග නවතා දමා තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. මේ අනුව ගොඩනැගිලි අවශ්‍යතාවය සපුරා ගැනීම කෙරෙහි කළමනාකාරිත්වයේ අවධානය යොමුවීම අඩුවීම හේතුවෙන් වාර්ෂිකව ඉතා විශාල කුලී මුදලක් දැරීමට සිදු වී තිබුණි.

(iv) මු.රෙ. 835(2) (ඉ)හි ගොඩනැගිලි කුලියට ගැනීම් බදුකාලය වසර තුනට නොවැඩි විය යුතු නමුත් වසර තුන ඉක්මවූ කාලය වසර 06 සිට වසර 38ක දක්වා කාලයක් සඳහා ගොඩනැගිලි 11ක් කුලියට ලබාගෙන තිබුණි.

## 4.4 අනාර්ථික ගනුදෙනු

නව පොලිස් මූලස්ථානයේ වාහන නැවැත්වීමේ ප්‍රදේශය සහ ඇතුළුවීමේ දොරටු අවට ප්‍රදේශ කාපට් (Asphalt Concrete) යොදා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

(i) නව පොලිස් මූලස්ථානයේ වාහන නැවැත්වීමේ ප්‍රදේශය සහ ඇතුල්වීමේ දොරටු අවට ප්‍රදේශයේ වර්ගමීටර් 990ක් කාපට් (Asphalt Concrete) යොදා සංවර්ධනය කිරීම සඳහා ඉදිකිරීම් ලිපිගොනු අංක LA/B7/21/24 යටතේ රු.6,796,387ක වැට් (VAT) බදු රහිත ඇස්තමේන්තුවක් 2024 මැයි 21 දින සහ ඉදිකිරීම් ලිපිගොනු අංක LA/B7/20/24 යටතේ වර්ගමීටර් 2710ක් සඳහා රු.7,654,750ක වැට් (VAT) බදු රහිත ඇස්තමේන්තුවක් 2024 මැයි 24 දින සකස්කර තිබුණු අතර, අදාළ වපසරිය සමන්විත වන භූමි ප්‍රමාණයන් මැනීම සිදුකරන ලද මිනුම් පත්‍රවල දළ සටහනක් ලිපිගොනුව තුළ හෝ ක්ෂේත්‍රය පරීක්ෂා කළ නිලධාරින්ගේ දෛනික වාර්තා තුළ ඇතුළත්ව නොතිබුණි. ඇස්තමේන්තුව 1ට අනුව වර්ග මීටර් 990ක වපසරියක ඇතිරීම සඳහා

10

කාපට (Asphalt Wearing Cause) මෙට්‍රික් ටොන් 130ක් වැඩිපුර අවශ්‍ය වන බව දක්වා ඒ සඳහා රු.3,042,000කුත්, ඇස්තමේන්තුව 2ට අනුව වර්ග මීටර් 2,710ක ප්‍රමාණයක ඇතිරීමට කාපට (Asphalt Wearing Cause) මෙට්‍රික් ටොන් 72ක් වැඩිපුර අවශ්‍ය වන බව දක්වා ඒ සඳහා රු.1,836,702කුත් ලෙස කාපට මෙට්‍රික් ටොන් 202ක් සඳහා රු.4,878,702ක් වැඩිපුර ඇස්තමේන්තු කර තිබුණි.

(ii) ඉදිකිරීම් ලිපිගොනු අංක LA/B7/21/24 යටතේ කාපට මෙට්‍රික් ටොන් 130.62ක් සඳහා රු.3,396,120ක් සහ ඉදිකිරීම් ලිපිගොනු අංක LA/B7/20/24 යටතේ කාපට මෙට්‍රික් ටොන් 6.48ක් සඳහා රු.168,480ක් ලෙස මුළු ඉදිකිරීම් කාර්යයේ දී කාපට මෙට්‍රික් ටොන් 137.10ක් සඳහා රු.3,564,600ක් වැඩිපුර ගෙවා තිබුණි.

### 4.5 කළමනාකරණ දුර්වලතා

(අ) මූල්‍ය ප්‍රකාශනවල "පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශය" තුළ ඇතුළත්කර තිබුණු පිස්තෝල ගිනිඅවි 05ක්, T56 වර්ගයේ ස්වයංක්‍රීය ගිනිඅවි 08ක්, SLR වර්ගයේ ගිනිඅවි 07ක් හා ගිනිඅවි, උණ්ඩ හා උපාංග අස්ථානගතවීමේ සිද්ධි 25ක් සහ අත්විලංගු අස්ථානගතවීම් 2කට අදාළ අලාභය රු.321,521ක් වූ වූ අතර, පොලිසිය සතු ගිනිඅවි, පතොරම් සහ අත්විලංගු අස්ථානගතවීම මහජන ආරක්ෂාවට දැඩි බලපෑමක් වී තිබුණි.

(ආ) **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් අයකිරීම**

(i) වැඩ තහනම් කර ඇති නිලධාරීන් 376 දෙනෙකුගෙන් රු.14,690,051ක් අත්තිකාරම් "බී" ගිණුමට අදාළ ණය ශේෂයන් අයවීමට තිබුණි. එමෙන්ම මෙම ණය ශේෂ අතුරින් වසර 10ට වැඩි කාලයක සිට වැඩ තහනම් කර තිබෙන නිලධාරීන් 11දෙනෙකුගේ දේපළ ණය වශයෙන් රු.2,608,493ක ණය මුදලක් අයවීමට තිබුණ ද, නිලධාරීන්ගේ සේවා තත්ත්වය නිවැරදිව හඳුනාගෙන ණය මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියා මාර්ගගෙන නොතිබුණි.

(ii) වැඩ තහනම් කර තිබෙන බව සඳහන් නිලධාරීන් 376දෙනා අතරින් නිලධාරීන් 28දෙනෙකු 2025 දෙසැම්බර් 31 දින වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම යන වයස ඉක්මවා තිබූ නමුත් මෙම නිලධාරීන් 28දෙනාගෙන් අයවිය යුතු රු.1,752,169ක් අයකර ගැනීමට අවශ්‍ය පියවරගෙන නොතිබුණි.

(iii) අභ්‍යන්තර මාරුකිරීම් ගිණුම්ගත කිරීමේ දී සිදුවූ අතපසුවීම් ලෙස දක්වා තිබූ තොරතුරු අනුව 2012 වර්ෂයට පෙර කාලපරිච්ඡේදවල දී අභ්‍යන්තර මාරුවීම් සිදු කිරීමේ දී සිදු වූ වෙනස්කම් හේතුවෙන් එකතු වූ වටිනාකම රු.10,548,237ක් වූ නමුත් මෙම ශේෂය සමාලෝචිත වර්ෂය වන තෙක් නිවැරදි කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) **මත්පැන් පානය පරීක්ෂා කිරීමේ ස්වසන නල (Breathalyser) පරීක්ෂාව**

1979 අංක 31 දරන මෝටර් රථ ප්‍රවාහන පනතේ 154(1C)(ඉ) වගන්තිය ප්‍රකාරව මෝටර් රථයක රියදුරෙකු මත්පැන් පානය කර ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා හුස්ම ගැනීමේ පරීක්ෂණයට භාජනය කළ යුතු බව දක්වා තිබූ නමුත්, 2025 නොවැම්බර් 30 දිනට සමස්ත පොලිස් ස්ථාන 632න් ස්වසන නල එකක් හෝ නොතිබූ පොලිස් ස්ථාන 498ක් පැවති අතර, එදිනට පොලිස් ස්ථාන 132 භාවිතයට ගත නොහැකි ස්වසන නල 974ක් පමණ පැවතුණි.

## 05. මානව සම්පත් කළමනාකරණය

(අ) පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 60,000ක් වුව ද, සමාලෝචිත වර්ෂය අවසානයේ තථ්‍ය සංඛ්‍යාව 27,523ක් පමණක් වීම මත පුරප්පාඩු 32,477ක් පැවතුණි. අනුමත සංඛ්‍යාව නොසලකා උසස්වීම ලබාදීමෙන් අතිරික්ත වූ පොලිස් සැරයන් තනතුරු 10,280ක සැලකිල්ලට ගැනීමෙන් පසු ද කොස්තාපල් තනතුරේ පුරප්පාඩු 22,197ක් එනම් අනුමත සංඛ්‍යාවෙන් සියයට 37ක් වීම ශ්‍රී ලංකා පොලිසියේ අත්‍යාවශ්‍ය මහජන සේවාවන් ඉටුකිරීමේ දී බාධාවක් වී තිබුණි.

(ආ) කාන්තා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර සියයට සියයක්ම (100%) පුරප්පාඩු වී තිබීම, කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුරු 13න් 07ක් එනම් සියයට 54 පුරප්පාඩුවීම, කාන්තා පොලිස් අධිකාරි තනතුරු 04ම එනම් සියයට 100ක් පුරප්පාඩුවීම, ඇතුළු ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාන්තා පොලිස් නිලධාරිනියන්ගේ අනුමත තනතුරු 38න් 14 ක් එනම් සියයට 36ක් පුරප්පාඩු වී තිබීම හේතුවෙන් ද්විතියික හා තෘතියික මට්ටමේ නිලධාරිනියන්ට නායකත්වය දීමට හා මෙහෙයවීමට අවශ්‍ය ජ්‍යෙෂ්ඨ නිලධාරිනියන් නොමැති බව හා ද්විතියික මට්ටමට අයත් කාන්තා පොලිස් කොස්තාපල් තනතුරු 10,000න් 4,570ක් එනම් සියයට 46ක් පුරප්පාඩුවීම හේතුවෙන් සමස්තයක් ලෙස කාන්තා නිලධාරිනියන් තුළින් ශ්‍රී ලංකා පොලිසිය ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ, විශේෂයෙන්ම ලාංකික කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් ඉටු කිරීමට අපේක්ෂිත අත්‍යාවශ්‍ය මහජන සේවාවන් කාර්යක්ෂමව ඉටුකිරීම කෙරෙහි අයහපත් ආකාරයට බලපා තිබුණි.

(ඇ) පුරප්පාඩු වූ එක් එක් තනතුර සඳහා අනුමත උපරිම සේවක සංඛ්‍යාව දක්වා බඳවා ගැනීමෙන් පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වුව ද, අතිරික්තව බඳවාගන්නා ලද තනතුරු ද ඇතුළුව තනතුරු 18,878දෙනෙකුට දරන්නාට පුද්ගලික වන සේ උසස්වීම් ලබා දී තිබීම හේතුවෙන් පුරප්පාඩු වූ තනතුරු 45,879න් තනතුරු 27,001කට පමණ නව බඳවාගැනීම සීමාකිරීමට සිදුවී තිබූ අතර තනතුරු 18,878දෙනෙකු සඳහා එනම් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 18ක් බඳවාගැනීමට නොහැකි වී තිබුණි.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

12

# පරිච්ඡේදය 04

## කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වගු අංක 52 **ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% 90% | 75% - 89% | 50% - 74% |
| අපරාධ විසඳීමේ ප්‍රතිශතය | | √ | |
| විශේෂ කාර්ය බලකාය දායකත්වය සැපයූ වැටලීම් ගණන | √ | | |
| ක්‍රියාකාරී මහජන ආරක්ෂක කමිටු හා ක්‍රියාත්මක කළ දැනුවත් කිරීම් වැඩසටහන් ගණන | | | √ |

මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය

# පරිච්ඡේදය 05

# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

වගු අංක **53**

**2030 වර්ෂය වන විට රාජකාරි මඟින් සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක**

| අනු අංකය | තිරසර සංවර්ධන අරමුණු | අදාළ වන තිරසර සංවර්ධන ඉලක්කය | තිරසර සංවර්ධන දර්ශකය | 2030 වසර වන විට අපේක්ෂිත ඉලක්කය | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 0%-49% | 50% - 74% | 75% - 00% | |
| 1 | 03. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසක ම සිටින සියල්ලන්ගේ ම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම | 3.6.2030 වන විට මහාමාර්ගවල සිදු වන අනතුරු හේතුවෙන් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව | 3.6.1. පසුගිය මාස 12ක කාල සීමාව තුළ මාර්ග අනතුරු හේතුවෙන් සිදු වන මරණ සංඛ්‍යාව (අනුපාතය) | 2030 වර්ෂය වන විට පාදක වර්ෂයෙන් (2015) 20% ක් අඩු කිරීම" (10.74 ජනගහනය 100000 සඳහා) (13.43-10.744) 13.43 | √ | | | |
| 2 | 08. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම | 8.7. බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත් ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලු ම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම. | 8.7.1 අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදා ගෙන ඇති සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ සහ වයස අනුව | (ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන සමීක්ෂණ මඟින් ලබා ගත් දත්ත මත කම්කරු දෙපාර්තමේන්තුව මඟින් නිර්ණය කළ යුතු ව ඇත. මේ වන විට තිරසර සංවර්ධන සභාව ලබා දී ඇති අගය 0 වේ) | √ | | | තවද මෙම ඉලක්කයට අදාළව පරිපාලන දත්ත (අපරාධ චෝදනා මත නඩු පැවරූ සිදුවීම් සංඛ්‍යාව) පමණක් ලබා දීමේ හැකියාවක් පවතී. |

| 2030 වර්ෂය වන විට රාජකාරි මඟින් සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | තිරසර සංවර්ධන අරමුණු | අදාළ වන තිරසර සංවර්ධන ඉලක්කය | තිරසර සංවර්ධන දර්ශකය | 2030 වසර වන විට අපේක්ෂිත ඉලක්කය | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | | |
| | | | | | 0%-49% | 50% - 74% | 75% - 00% | වෙනත් |
| 3 | 11. නගර සහ මිනිස් ජනාවාස ඇතුළත් ආරක්ෂිත ඔරොත්තු දෙන සහ තිරසර කිරීම | 11.7. 2030 වන විට විශේෂයෙන්ම කාන්තාවන්ට සහ ළමුන්ට, වයස්ගත පුද්ගලයින්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ආරක්ෂාකාරී වන, සියලු දෙනාට ම එක්ව සලකන සහ පහසුවෙන් පිවිසිය හැකි පොදු හරිත අවකාශයන් ලබා දීම | 11.7.2. පෙර මාස 12 තුළ ලිංගිකත්වය, වයස, ආබාධිත තත්වය සහ සිදු වූ ස්ථානය අනුව ශාරීරික හෝ ලිංගික හිරිහැර වලට ගොදුරු වූවන්ගේ අනුපාතය | මේ පිළිබඳ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන සමීක්ෂණයකින් ඇගයීමෙන් අනතුරුව වර්තමාන ස්වභාව හඳුනා ගැනීමෙන් අනතුරුව මෙහි ඉලක්ක නිර්ණය කළ හැක. | | | | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව |
| 4 | 16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී, වග වීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම | 16.1 සියලු ම ස්ථානයන් හි සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයෙන් සහ ඒ ආශ්‍රිත මරණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම. | 16.1.1. පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති රටේ ජනගහනයෙන් පුද්ගලයන් 100000කට චේතනාන්විත මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය හා වයස අනුව | 2030 වර්ෂය වන විට පාදක වර්ෂයෙන් (2015) 33% කින් අඩු කිරීම. 100000 කය 1.5 දක්වා අඩු කිරීම | | | | |
| 5 | | | 16.1.2 ජනගහනයෙන් පුද්ගලයන් 100000කට වාර්තා වී ඇති ගැටුම් හා සම්බන්ධ හේතු නිසා සිදු වන මරණ සංඛ්‍යාව, (ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ හේතුව අනුව | 2030 වර්ෂය වන විට මරණ සංඛ්‍යාව 0 බවට පත් කිරීම (100%ක්) | | | | මේ වන විට දත්ත වාර්තා කැඳවා ඇති අතර ඒ අනුව ලබා දීමට කටයුතු කරමි. |

| 2030 වර්ෂය වන විට රාජකාරි මඟින් සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | තිරසර සංවර්ධන අරමුණු | අදාළ වන තිරසර සංවර්ධන ඉලක්කය | තිරසර සංවර්ධන දර්ශකය | 2030 වසර වන විට අපේක්ෂිත ඉලක්කය | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | | |
| | | | | | 0%-49% | 50% - 74% | 75% - 00% | වෙනත් |
| 6 | | | 16.1.3 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති කායික, මානසික හෝ ලිංගික හිංසනයට ගොදුරු වූ වින්දිතයන්ගේ සංඛ්‍යාව, ශ්‍රී ලංකාවේ ජනගහනයට අනුපාතය | 2030 වර්ෂය වන විට පාදක වර්ෂයෙන් (2015) 45% කින් අඩු කිරීම ජනගහන 100,000 18කි.32.6 - 18/32.6 | | | | දත්ත වාර්තා කැඳවා මේ වන විට ගණනය කරමින් පවතී |
| 7 | | | 16.1.4 අඳුර වැටීමෙන් පසුව තමන් ජීවත් වන ප්‍රදේශයේ වටා තනිව ම ඇවිදීම ආරක්ෂිත යැයි හැඟෙන සංඛ්‍යාව, ශ්‍රී ලංකාවේ ජනගහනයට අනුපාතය | මේ පිළිබඳ ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන සමීක්ෂණයකින් ඇගයීමෙන් අනතුරුව වර්තමාන ස්වභාව හඳුනා ගැනීමෙන් අනතුරුව මෙහි ඉලක්කය නිර්ණය කළ හැක. | | | | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව |
| 8 | | 16.2 ළමුන් කෲර වධහිංසා කිරීම්වලට සහ අපයෝජනයට, සූරාකෑමට, කුට්ටනයට සහ සියලු ම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට ලක් වීම අවසන් කිරීම | 16.2.1 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති භාරකරුවන්/රැකවලුන් /මෙහෙකරුවන් අතින් කායික දඬුවම් හෝ මානසික ප්‍රචණ්ඩත්වය අත්විඳීමට සිදු වූ වයස අවුරුදු 1-17 දක්වා වන ළමුන්ගේ සංඛ්‍යාව (ආසන්න දර්ශකය: ළමුන්ට එරෙහිව සිදු කරන අපරාධ සංඛ්‍යාව | 2030 වර්ෂය වන විට පදනම් වර්ෂයෙන්(2015) 25% අඩු කිරීම 3932-2949/3932 ආසන්න දර්ශකයකි. ශ්‍රී ලංකා පොලිසිය මඟින් පරිපාලන දත්ත ලබා දේ. | √ | | | |

| 2030 වර්ෂය වන විට රාජකාරි මඟින් සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | තිරසර සංවර්ධන අරමුණු | අදාළ වන තිරසර සංවර්ධන ඉලක්කය | තිරසර සංවර්ධන දර්ශකය | 2030 වසර වන විට අපේක්ෂිත ඉලක්කය | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | | |
| | | | | | 0%-49% | 50% - 74% | 75% - 00% | වෙනත් |
| 9 | | | 16.2.2 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති ජනගහනයේ පුද්ගලයන් 100000 ක් අතරින් මිනිස් ජාවාරමෙහි ගොදුරු බවට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය හා වයස සහ අපයෝජනයේ ස්වරූපය අනුව | 2030 වර්ෂය වන විට මිනිස් ජාවාරම්වලට ගොදුරු වන්නන් සංඛ්‍යාව 0 කිරීම (100%) | √ | | | |
| 10 | | | 16.2.3 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති වයස අවු 18 වන විට ලිංගික හිංසනය අත්විඳ ඇති වයස අවුරුදු 18-29 වයස් කාණ්ඩයේ තරුණ කාන්තාවන් සහ පිරිමින්ගේ සංඛ්‍යාව (ජනගහනයට අනුපාතය) | මේ පිළිබඳ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් සමීක්ෂණයක් සිදු කිරීමෙන් මෙහි වර්තමාන තත්වය ඇගයීමකට ලක් කර අනතුරුව ඉලක්ක අගය නිර්ණය කළ හැකි ය. | | | | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව |
| 11 | | 16.3 සියලු ම දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම සහ ජාතික සහ අන්තර්ජාතික මටට්මින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම | 16.3.3 ශ්‍රී ලංකා පොලිසියට වාර්තා වන පැමිණිලි සංඛ්‍යාව (ආසන්න දර්ශකයකි) | ශ්‍රී ලංකා පොලිසිය මඟින් පරිපාලන දත්ත ලබා දීම පමණක් සිදු කරන අතර මෙම දර්ශකයෙහි අගය අධිකරණ අමාත්‍යාංශය ලබා දේ. | | | | වගකීම අධිකරණ අමාත්‍යාංශය සතු වන අතර පරිපාලන දත්ත ශ්‍රී ලංකා පොලිසිය මඟින් ලබා දේ. එම අගය පුද්ගලයින් 100,000කට පැමිණිලි 4,194කි. |

| 2030 වර්ෂය වන විට රාජකාරි මඟින් සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | තිරසර සංවර්ධන අරමුණු | අදාළ වන තිරසර සංවර්ධන ඉලක්කය | තිරසර සංවර්ධන දර්ශකය | 2030 වසර වන විට අපේක්ෂිත ඉලක්කය | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | | |
| | | | | | 0%-49% | 50% - 74% | 75% - 00% | වෙනත් |
| 12 | | 16.4 2030 වන විට නීති විරෝධී මූල්‍ය සහ ආයුධ ප්‍රවාහයන් කැපී පෙනෙන ලෙස අඩු කිරීම, සොරකම් කරන ලද වත්කම් නැවත ලබා ගැනීම ශක්තිමත් කිරීම සහ සියලු ම ආකාරයේ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීම | 16.4.1 අභ්‍යන්තර සහ බාහිර නීති විරෝධී මූල්‍ය ප්‍රවාහවල මුළු වටිනාකම (වත්මන් එක්සත් ජනපද ඩොලර් වලින්) | ශ්‍රී ලංකා පොලිසියෙන් මෙතෙක් දත්ත ලබා දී නොමැති අතර මෙම දර්ශකය සඳහා ඉලක්ක අගයන් ලබා දීම සම්බන්ධයෙන් මහ බැංකුව හා ආදායම් බදු දෙපාර්තමේන්තුව එක්ව සිදු කළ යුතු කළ යුතු ව ඇත | | | | මහ බැංකුව හා ආදායම් බදු දෙපාර්තමේන්තුව අගයන් සකස් කිරීම ප්‍රායෝගික නොවේ. |
| 13 | | | 16.4.2 පසුගිය මාස 12ක කාලය තුළ වාර්තා වී ඇති ජාත්‍යන්තර ප්‍රමිතිය / ක්‍රියාදාමයට අනුකූලව නිසි බලධාරියෙකු විසින් නීති විරෝධී සම්භවය හෝ පසුබිම සොයා ගැනීම හෝ ස්ථාපිත කර ඇති අත් අඩංගුවට ගත්, සොයා ගත් හෝ භාර දුන් ආයුධවලට අදාළ සිද්ධි සංඛ්‍යාව හා එයට අදාළ ආයුධ සංඛ්‍යාව | 2030 සඳහා අපේක්ෂිත අගයන් සකස් කර නොමැත තත්කාලයේ දිවයින තුළ තිබෙන නීති විරෝධි අවි පිළිබඳ ප්‍රායෝගිකව දැන ගැනීමට නොහැක. | | | | (තත්කාලයේ දිවයින තුළ තිබෙන නීති විරෝධි අවි පිළිබඳ ප්‍රායෝගිකව දැන ගැනීමට නොහැකිය) |
| 14 | | 16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොර තුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම | 16.10.1 පසුගිය මාස 12 තුළ වාර්තා වී ඇති මාධ්‍යවේදීන්, මාධ්‍යවේදි ආශ්‍රිතයන්, වෘත්තීය සමිති සාමාජිකයින් සහ මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින්නන් ඝාතනය කිරීම, පැහැර ගෙන යාම, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම, අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම සහ වධහිංසා පැමිණවීම් පිළිබඳ සත්‍යාපිත සිද්ධීන් සංඛ්‍යාව | 2030 වර්ෂය වන විට 0 දක්වා අඩු කර ගැනීම (100%) | | | | මෙම ඉලක්කයට අදාළව මාධ්‍යවේදීන් සම්බන්ධව පමණක් සංඛ්‍යා දත්ත පමණක් ගණනය කර ඇත. |

| 2030 වර්ෂය වන විට රාජකාරි මඟින් සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අනු අංක ය | තිරසර සංවර්ධන අරමුණු | අදාළ වන තිරසර සංවර්ධන ඉලක්කය | තිරසර සංවර්ධන දර්ශකය | 2030 වසර වන විට අපේක්ෂිත ඉලක්කය | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | | |
| | | | | | 0%-49% | 50% - 74% | 75% - 00% | වෙනත් |
| 15 | | | 16.10.1.a. ලිංගිකත්වය වයස් කාණ්ඩය අනුව අපයෝජනය වන ආකාරය හෝ අපයෝජන අපරාධකරුවන්ගේ ස්වභාවය | ළමාරක්ෂක අධිකාරිය මඟින් ප්‍රධාන වශයෙන් දත්ත ලබා දීම සිදු ව ඇත. මේ සඳහා ඉලක්ක අගය ළමාරක්ෂක අධිකාරිය නිර්ණය කල යුතුව ඇත. | | | | ළමාරක්ෂක අධිකාරිය |

# පරිච්ඡේදය 06

## මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

වගු අංක 54 **2025.12.31** දිනට සාමාන්‍ය පොලිස් සේවයේ සේවක සංඛ්‍යාව

| A | B | C | D | E<br>B - C = E | F<br>B - C - D= F |
|---|---|---|---|---|---|
| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
| | | අනුමත සංඛ්‍යාව තුළ | අධිසේවක පදනම මත | | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 745 | 512 | | 233 | 0 |
| තෘතියික මට්ටම | 3811 | 2436 | 1616 | 1375 | - |
| ද්විතික මට්ටම | 97544 | 53273 | 17262 | 44271 | - |
| ප්‍රාථමික මට්ටම | 0 | 0 | 0 | 0 | - |
| එකතුව | **102100** | **56221** | **18878** | **45879** | **0** |
| | **102100** | **75099** | | **27001** | |

* තෘතීයික සහ ද්විතීක මට්ටමේ තනතුරුවලට අදාලව පුරප්පාඩු ගණනය කිරීමේදී දරන්නාට පුද්ගලික වන සේ උසස් කර ඇති නිලධරයන් සංඛ්‍යාව ඉවත් කර පුරප්පාඩු ගණනය කර ඇත.

සැ.යු :- තෘතීයික සහ ද්විතීක මට්ටමේ තනතුරුවලට **2019.01.01, 2019.07.01, 2020.01.01** හා **2020.02.08** දිනට එක් එක් තනතුරේ අනුමත සංඛ්‍යාව නොසලකා දරන්නාට පුද්ගලික වන සේ උසස්වීම් ලබා දී ඇත. එබැවින් ශ්‍රී ලංකා පොලිසියේ සියලුම තනතුරුවල අනුමත සංඛ්‍යාව **102100** වන හෙයින් අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි අවසන් පුරප්පාඩු **27001** ක සංඛ්‍යාවට පමණක් නව බඳවා ගැනීම් ලෙස සිදු කල යුතුවේ.

* පුරප්පාඩු ගණනය කල යුතුව ඇති බැවින්, සේවය අතහැර ගොස් සිටින සංඛ්‍යාව සමඟ තථ්‍ය සේවක සංඛ්‍යාව ගණනය කර ඇත.

| **2025.12.31** දිනට සේවක සංඛ්‍යාව - පොලිස් ආරක්ෂක සහයක | | | | | |
|---|---|---|---|---|---|
| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
| ප්‍රාථමික මට්ටම | **0** | **68** | **0** | **-** | **-** |

* මෙහි ප්‍රාථමික මට්ටමට ගණනය කර ඇත්තේ පොලිස් ආරක්ෂක සහයක නිලධරයන් වේ.

මූලාශ්‍රය - මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය

වගු අංක 55

## 2025.12.31 දිනට සහයක සේවයේ සේවක සංඛ්‍යාව

| A | B | C | | D<br>B-C=D | E |
|---|---|---|---|---|---|
| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
| | | නිත්‍ය සේවයේ සංඛ්‍යාව | උපසේවා පදනමින් බඳවා ගෙන සිටින සංඛ්‍යාව | | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 204 | 7 | 46 | 151 | - |
| තෘතියික මට්ටම | 582 | 247 | 19 | 316 | - |
| ද්විතික මට්ටම | 2038 | 824 | 5 | 1209 | - |
| ප්‍රාථමික මට්ටම | - | - | - | - | - |
| **එකතුව** | **2824** | **1078** | **70** | **1676** | **0** |

*** පුරප්පාඩු ගණනය කල යුතුව ඇති බැවින්, සේවය අතහැර ගොස් සිටින සංඛ්‍යාව සමඟ තථ්‍ය සේවක සංඛ්‍යාව ගණනය කර ඇත.**

මූලාශ්‍රය - මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය

වගු අංක 56

## 2025.12.31 දිනට විශේෂ කාර්ය බලකායේ සේවක සංඛ්‍යාව

| A | B | C | D | E<br>B-C=E | F<br>B-C-D=F |
|---|---|---|---|---|---|
| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
| | | අනුමත සංඛ්‍යාව තුල | දරන්නාට පුද්ගලික වන සේ | | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 70 | 37 | - | 33 | - |
| තෘතියික මට්ටම | 346 | 241 | 126 | 105 | 21 |
| ද්විතික මට්ටම | 10329 | 6500 | 702 | 3829 | - |
| ප්‍රාථමික මට්ටම | - | - | - | - | - |
| එකතුව | **10745** | **6778** | **828** | **3967** | **21** |
| | **10745** | **7606** | | **3139** | |

*** තෘතීයික මට්ටමේ සහ ද්විතීක මට්ටමේ තනතුරුවලට අදාලව පුරප්පාඩු ගණනය කිරීමේදී දරන්නාට පුද්ගලික වන සේ උසස් කර ඇති නිලධාරීන් ඉවත් කර ගණනය කර ඇත.**

**සැ.යු :- තෘතීයික සහ ද්විතීක මට්ටමේ තනතුරුවලට 2019.01.01, 2019.07.01 හා 2020.01.01 හා 2020.02.08 දිනට එක් එක් තනතුරේ අනුමත සංඛ්‍යාව නොසලකා දරන්නාට පුද්ගලික වන සේ උසස්වීම් ලබා දී ඇත. එබැවින් විශේෂ කාර්ය බලකායේ සියලුම තනතුරුවල අනුමත සංඛ්‍යාව 10745 වන හෙයින් අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි අවසන් පුරප්පාඩු 3139 ක සංඛ්‍යාවට පමණක් නව බඳවා ගැනීම් ලෙස සිදු කල යුතුවේ.**

*** පුරප්පාඩු ගණනය කල යුතුව ඇති බැවින්, සේවය අතහැර ගොස් සිටින සංඛ්‍යාව සමඟ තථ්‍ය සේවක සංඛ්‍යාව ගණනය කර ඇත.**

මූලාශ්‍රය - මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය

වගු අංක 57

## ශ්‍රී ලංකා පොලීසියේ සිවිල් කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය / පන්තිය | සේවා මට්ටම | 2025.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව | 2025.12.31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන) | ශ්‍රී ලං.ප.සේ. | I | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| 2 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. | I | ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 8 | 10 |
| 3 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ. | I | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| 4 | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන) | ශ්‍රී ලං.ප.සේ. | II/III | ජ්‍යෙෂ්ඨ මට්ටම | 2 | 0 | 2 |
| 5 | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) | ශ්‍රී ලං.ක්‍ර.ස.සේ. | II/III | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| 6 | ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. | III | ජ්‍යෙෂ්ඨ මට්ටම | 48 | 52 | -4 |
| 7 | සිවිල් ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ. | III | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| 8 | වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලං.වෛ.සේ. | II | ජ්‍යෙෂ්ඨ මට්ටම | 2 | 0 | 2 |
| 9 | අපරාධ විද්‍යාඥ | දෙපාර්තමේන්තුගත | - | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| 10 | පර්යේෂණ නිලධාරී | දෙපාර්තමේන්තුගත | - | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 1 |
| 11 | පරිපාලන නිලධාරී | ක.සේ.නි.සේ. | අධිශ්‍රේණිය | තෘතීයික මට්ටම | 12 | 9 | 3 |
| 12 | භාෂා පරිවර්තක | භා.ප.සේ. | II/I | තෘතීයික මට්ටම | 6 | 5 | 1 |
| 13 | සංවර්ධන සහකාර | දෙපාර්තමේන්තුගත | - | ද්විතීයික මට්ටම | 117 | 87 | 0 |
| 14 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ. | III | ද්විතීයික මට්ටම | 533 | 223 | 310 |
| 15 | ප්‍රවෘත්ති සංස්කාරක | දෙපාර්තමේන්තුගත | - | ද්විතීයික මට්ටම | 2 | 1 | 1 |
| 16 | කළමනාකරණ සේවා නිලධාරී | ක.සේ.නි.සේ. | III/II/I | ද්විතීයික මට්ටම | 1703 | 1482 | 221 |
| 19 | සිවිල් සහයක | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ද්විතීයික මට්ටම | 228 | 228 | 0 |
| 20 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී ලං.තො.තා.සේ. | III | ද්විතීයික මට්ටම | 3 | 2 | 1 |
| 21 | කාර්යාල සේවක | කා.සේ.සේ. | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 2072 | 1875 | 197 |
| 25 | ස්ථාන කම්කරු | දෙපාර්තමේන්තුගත | - | ප්‍රාථමික මට්ටම | 332 | 332 | 0 |
| 26 | අස්ගොව් | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 55 | 41 | 14 |
| 27 | අලි බලන්නා | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 2 | 2 | 0 |
| 28 | උපස්ථායක / උපස්ථායිකා | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 183 | 133 | 50 |
| 29 | පොලිස් ආරක්ෂක සහායක | දෙපාර්තමේන්තුගත | - | ප්‍රාථමික මට්ටම | 68 | 68 | 0 |
| 30 | අරක්කැමි | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 1169 | 721 | 448 |
| 31 | මුළුතැන්ගෙයි සහායක | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 1169 | 885 | 284 |
| 32 | විදුලි කාර්මික (මෝටර් රථ) | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 42 | 0 | 42 |
| 33 | මෝටර් කාර්මික | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 210 | 0 | 210 |
| 34 | පෑස්සුම් කාර්මික | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 22 | 0 | 22 |
| 35 | ඉංජෙක්ටර් පොම්ප කාර්මික | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 10 | 0 | 10 |
| 36 | බැටරි කාර්මික | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 12 | 0 | 12 |
| 37 | සේවා කාර්මික | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 32 | 0 | 32 |
| 38 | පින්තාරු කාර්මික | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 22 | 0 | 22 |
| 39 | යතුරුපැදි කාර්මික | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 40 | 0 | 40 |
| 40 | ටින්කර් කාර්මික | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 70 | 0 | 70 |
| 41 | දුරකථන හා අභ්‍යන්තර පද්ධති අලුත්වැඩියාකරු | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 10 | 0 | 10 |
| 42 | ගෑස් වෑල්ඩින්කරු | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 2 | 0 | 2 |
| 43 | පින්තාරුකරු | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 34 | 0 | 34 |
| 44 | වඩු කාර්මික | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 344 | 0 | 344 |
| 45 | පෙදරේරු | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 344 | 0 | 344 |
| 46 | විදුලි කාර්මික (ගෘහස්ථ) | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 225 | 0 | 225 |
| 47 | ජලනල කාර්මික | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 182 | 0 | 182 |
| 48 | කරණවෑමි | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 503 | 26 | 477 |
| 49 | උද්‍යාන පාලක | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 27 | 21 | 6 |
| 50 | වේටර් | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 217 | 0 | 217 |
| 51 | ටයර්මාරු කරන්නා | දෙපාර්තමේන්තුගත | III/II/I/SP | ප්‍රාථමික මට්ටම | 12 | 0 | 12 |
| 52 | අනියම් / තාවකාලික කම්කරු | දෙපාර්තමේන්තුගත | - | ප්‍රාථමික මට්ටම | - | 0 | 0 |
| එකතුව | | | | | 10090 | 6206 | 3854 |

**මූලාශ්‍රය - අධ්‍යක්ෂ සිවිල් පරිපාලන**

## 6.2 ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය.

ශ්‍රී ලංකා පොලිස් සේවයේ මානව සම්පත් හිඟයක් පවතින අතර, එය ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රමුඛ කාර්යයන් වන අපරාධ මැඩලීම, සමාජ සාමය පවත්වා ගැනීම, නීතිය ක්‍රියාත්මක කිරීම ඇතුළු අනෙකුත් කාර්ය භාරයන් කෙරෙහි සෘජු බලපෑමක් එල්ල කරනු ලබයි.

2025.12.31 දින වන විට ශ්‍රී ලංකා පොලීසියේ සාමාන්‍ය පොලිස් සේවයේ සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩු **27001** ක් පැවති අතර, පොලිස් විශේෂ කාර්ය බලකායෙහි පුරප්පාඩු 3967 ක්ද, පොලිස් සහයක සේවයෙහි පුරප්පාඩු 1676 ක්ද පැවතුණි. මීට අමතරව සිවිල් කාර්ය මණ්ඩලයට අයත් දෙපාර්තමේන්තුගත සහ දෙපාර්තමේන්තුගත නොවන තනතුරු වල පුරප්පාඩු 3854 ක්ද පැවතුනි. මෙම මානව සම්පත් හිඟය හේතුවෙන් ඇතිවිය හැකි පහත සඳහන් තත්ත්වයන් ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය සාධනය උදෙසා අහිතකර ලෙස බලපෑ හැකිය.

I. නිලධාරී ඌනතාවය මත මහජනතාවට සපයනු ලබන සේවාවන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායීත්වය හීන වීම.

II. එක් නිලධරයකුට ඉටුකිරීමට සිදුවන රාජකාරී ප්‍රමාණය ඉහළ යාම සහ රාජකාරියෙහි යෙදීමට සිදුවන කාලය දීර්ඝ වීම මත රැකියා තෘප්තිය පහළ යාම.

III. රාජකාරි අධික වීම නිසා ඇතිවිය හැකි ශාරීරික හා මානසික පීඩනය හේතුවෙන් නිලධරයන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍ය තත්ත්වය බිඳවැටීම මත අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වීමෙන් සේවා ඵලදායීත්වය හීන වීම.

IV. සමස්තයක් ලෙස ඉහත දක්වන ලද තත්ත්වයන් සමාජගත වීම මත අළුතින් සේවයට එක් වීමට අපේක්ෂා කරනු ලබන පිරිස් අධෛර්යවත් වීම සහ සේවා තෘප්තිය හීන වීම මත දැනටමත් පොලිස් සේවයේ නිරත නිලධරයන් සේවය හැරයාමේ ඉඩකඩක් පැවතීම.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

වගු අංක **58** **පොලිස් විදුහල මගින් සිදු කරන ලද පුහුණු වැඩ සටහන්**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (මාස) | සමස්ත ආයෝජනය (රු. 000) | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබාගත් දැනුම. |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ආධුනික නිලධරයන්ගේ මූලික පුහුණු පාඨමාලාව | 1354 | මාස 09<br>මාස 07<br>මාස 06<br>මාස 03 | 20,945,065.00 | | දේශීය | මූලික පුහුණුව |
| ධාරිතා සංවර්ධන පාඨමාලා | 291 | මාස 01 | | | දේශීය | ලබා ඇති දැනුම වැඩි දියුණු කරමින් නිලධාරින්ගේ ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරිම |
| තනතුරට හැඩගැස්වීමේ පාඨමාලා | 741 | මාස 03<br>සති 03<br>සති 01<br>දින 03 | 614,460.00 | | දේශීය | නව තනතුරට ගැලපෙන සේ අවශ්‍යා දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම |
| ඉංග්‍රීසි පාඨමාලා | 378 | මාස 03 | - | - | දේශීය | නිලධාරින්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීම. |
| ද්‍රවිඩ භාෂා පුහුණු පාඨමාලා | 134 | මාස 02 | | | | නිලධාරින්ගේ ද්‍රවිඩ දැනුම වර්ධනය කිරීම. |
| පරිගණක පුහුණු පාඨමාලා | 269 | සති 03 | | | දේශීය | නිලධාරින්ගේ පරිගණක දැනුම වර්ධනය කිරීම. |
| වන සටන් පුහුණු පාඨමාලා | 410 | සති 03 | 3,107,800.00 | | | මූලික අවි හා වන සටන් පුහුණුව ලබාදීම |
| සොකෝ පාඨමාලාව | 28 | සති 22 | 480,000.00 | | | NVQ LEVEL 05 මට්ටමේ දැනුම ලබා දීම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබාගත් දැනුම. |
|---|---|---|---|---|---|---|
| | | (මාස) | (රු. 000) | | | |
| | | | දේශීය | විදේශීය | | |
| මූලික බුද්ධි පුහුණු පාඨමාලාව | 137 | දින 02 දින 03 | - | - | දේශීය | විශේෂ කාර්‍යාංශය අනුයුක්ත නිළධාරින්ගේ දැණුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම |
| නායකත්ව පුහුණු පාඨමාලාව | 204 | දින 01 දින 03 | - | - | දේශීය | නායකත්වය වර්ධනය කිරීම |
| විශේෂ ආරක්ෂක දිසාවේ සිට ස්ථාන මාරු ලබා පිටව ගිය නිලධාරින් සඳහා වන පාඨමාලාව | 832 | සති 02 සති 03 | - | - | දේශීය | ප්‍රායෝගික දැනුම ලබා දීම |
| ප්‍රභූ ආරක්ෂක පාඨමාලාව | 137 | දින 02 දින 03 | | | දේශීය | තම තනතුරට ගැලපෙන සේ අවශ්‍ය දැනුම හා කුසලතා වැඩිදියුණු කර පොලිස් රාජකාරි සඳහා බුද්ධිමත් හා කාර්ය ශුර පොලිස් නිලධාරීන් යොමු කිරීම |
| ආධුනික උ.පො.ප පුහුණු පාඨමාලාව | 1 | මාස 08 | 1,059,524.70 | | දේශීය | මූලික පුහුණුව |
| කණිෂ්ඨ ශ්‍රේණියේ නිලධාරින් සඳහා පුහුණු පාඨමාලාව | 336 | සති 03 | | | | නිලධාරින්ගේ දැනුම වර්ධනය කිරීම. |
| පරික්ෂක ශ්‍රේණියේ නිලධාරින් සඳහා පුහුණු පාඨමාලාව | 115 | සති 04 | | | | නිලධාරින්ගේ දැනුම වර්ධනය කිරීම. |

වගු අංක 59

## කටාන පොලිස් අභ්‍යාස ආයතනය මගින් සිදු කරන ලද පුහුණු වැඩ සටහන්

| අ.අ | පාඨමාලාවේ නම | පවත්වා ඇති පාඨමාලා ගණන | ඉලක්කගත පාඨමාලාලාභීන් සංඛ්‍යාව | පුහුණු කර ඇති පාඨමාලාලාභීන් සංඛ්‍යාව | පුහුණුව ලබමින් සිටින නිලධරයන් සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) |
|---|---|---|---|---|---|---|---|
| 1 | පොලිස් විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 2 | 100 | 0 | 94 | වසර 02 (සති අන්ත) | දේශීය |
| 2 | ප්‍රජා උපදේශන මනෝ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2 | 100 | 38 | 50 | වසර 01 (සති අන්ත) | දේශීය |
| 3 | විවිධ පැමිණිලි විමර්ශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 1 | 50 | 26 | 0 | සති 16 | දේශීය |
| 4 | අපරාධ විමර්ශන ඩිප්ලෝමා පාඨමාලාව | 1 | 50 | 39 | 0 | සති 16 | දේශීය |
| 5 | අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරි ඩිප්ලෝමා පාඨමාලාව | 1 | 28 | 28 | 0 | සති 22 | දේශීය |
| 6 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම්කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 1 | 40 | 34 | 0 | සති 16 | දේශීය |
| 7 | සහකාර පොලිස් අධිකාරිවරුන් සඳහා වන තනතුරට හැඩගැස්වීමේ පාඨමාලාව | 1 | 42 | 42 | 0 | සති 06 | දේශීය |
| 8 | පොලිස් අධිකාරීවරුන් සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් පුහුණු පාඨමාලාව | 1 | 18 | 17 | 0 | සති 06 | දේශීය |
| 9 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් පුහුණු පාඨමාලාව | 2 | 55 | 51 | 0 | සති 04 | දේශීය |
| 10 | මූලික පොලිස් රාජකාරි පිළිබඳ පුහුණු පාඨමාලාව | 3 | 225 | 115 | 0 | සති 03 | දේශීය |
| 11 | මානව ගරුත්වය හා විවිධත්වය පිළිබඳ පුහුණු කරන්නන් පුහුණු කිරීමේ පාඨමාලාව | 4 | 80 | 78 | 0 | සති 01 | දේශීය |
| 12 | මූලික පරිගණක පුහුණු පාඨමාලාව | 20 | 620 | 548 | 0 | සති 03 | දේශීය |
| 13 | ප්‍රජා උපදේශන මනෝ විද්‍යාව පිළිබඳ පුහුණු පාඨමාලාව | 10 | 400 | 393 | 0 | සති 02 | දේශීය |
| 14 | ප්‍රජා පොලිස්කරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | 8 | 320 | 258 | 0 | සති 02 | දේශීය |

| අ.අ | පාඨමාලාවේ නම | පවත්වා ඇති පාඨමාලා ගණන | ඉලක්කගත පාඨමාලාලාභීන් සංඛ්‍යාව | පුහුණු කර ඇති පාඨමාලාලාභීන් සංඛ්‍යාව | පුහුණුව ලබමින් සිටින නිලධරයන් සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) |
|---|---|---|---|---|---|---|---|
| 15 | පරිගණක අපරාධ විමර්ශනය පිළිබඳ පුහුණු පාඨමාලාව | 3 | 120 | 87 | 0 | සති 03 | දේශීය |
| 16 | ප්‍රතිත්‍රස්තවාදය හා ව්‍යවහාරික බුද්ධි පිළිබඳ පුහුණු පාඨමාලාව | 9 | 360 | 358 | 0 | සති 02 | දේශීය |
| 17 | නඩු මෙහයවීම පිළිබඳ පුහුණු පාඨමාලාව | 14 | 560 | 415 | 0 | සති 03 | දේශීය |
| 18 | අවි ගබඩා කළමනාකරණ පිළිබඳ පුහුණු පාඨමාලාව | 1 | 58 | 0 | 58 | සති 04 | දේශීය |
| 19 | පරිසර නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව | 7 | 280 | 222 | 0 | සති 02 | දේශීය |
| 20 | ව්‍යෝහාරික විද්‍යාව හා අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පුහුණු පාඨමාලාව | 3 | 120 | 93 | 0 | සති 02 | දේශීය |
| 21 | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | 8 | 320 | 286 | 0 | සති 02 | දේශීය |
| 22 | මානව හිමිකම් පිළිබඳ පුහුණු පාඨමාලාව | 9 | 360 | 289 | 0 | සති 02 | දේශීය |
| 23 | මිනිස් වෙළෙඳාම් හා මිනිස් ජාවාරම් විමර්ශනය පිළිබඳ පුහුණු පාඨමාලාව | 9 | 360 | 334 | 0 | සති 02 | දේශීය |
| 24 | විවිධ පැමිණිලි විමර්ශනය පිළිබඳ පුහුණු පාඨමාලාව | 9 | 360 | 313 | 0 | සති 02 | දේශීය |
| 25 | පොලිස් පරිපාලනය පිළිබඳ පුහුණු පාඨමාලාව | 9 | 360 | 420 | 0 | සති 02 | දේශීය |
| 26 | ප්‍රසම්පාදනය ක්‍රියාවලිය පිළිබඳ පුහුණු පාඨමාලාව | 11 | 440 | 432 | 0 | සති 02 | දේශීය |
| 27 | ප්‍රසම්පාදන කළමනාකරණ පුහුණු පාඨමාලාව (රාජ්‍ය නිවේදිත නිලධරයන් සඳහා) | 17 | 605 | 360 | 0 | සති 01 | දේශීය |
| 28 | මහජන සාමය කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | 2 | 60 | 50 | 0 | සති 03 | දේශීය |
| 29 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ මූලික පුහුණු පාඨමාලාව | 15 | 600 | 430 | 0 | සති 01 | දේශීය |

| අ.අ | පාඨමාලාවේ නම | පවත්වා ඇති පාඨමාලා ගණන | ඉලක්කගත පාඨමාලාලාභීන් සංඛ්‍යාව | පුහුණු කර ඇති පාඨමාලාලාභීන් සංඛ්‍යාව | පුහුණුව ලබමින් සිටින නිලධරයන් සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) |
|---|---|---|---|---|---|---|---|
| 30 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුහුණු පාඨමාලාව | 4 | 160 | 135 | 0 | සති 02 | දේශීය |
| 31 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ අන්තර් මාධ්‍ය පාඨමාලාව | 4 | 160 | 115 | 0 | සති 03 | දේශීය |
| 32 | විශේෂ අවශ්‍යතා පිළිබඳ සන්නිවේදන පුහුණු පාඨමාලාව | 3 | 120 | 99 | 0 | සති 02 | දේශීය |
| 33 | රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂාව පිළිබඳ පුහුණු පාඨමාලාව | 2 | 80 | 67 | 0 | සති 01 | දේශීය |
| 34 | පොලිස් කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | 4 | 160 | 140 | 0 | සති 02 | දේශීය |
| 35 | පුහුණු කරන්නන් පුහුණු කිරීමේ පාඨමාලාව | 10 | 300 | 289 | 0 | සති 02 | දේශීය |
| 36 | මුදල් විශුද්ධිකරණය වැළැක්වීම පිළිබඳ පුහුණු පාඨමාලාව | 2 | 90 | 84 | 0 | සති 02 | දේශීය |
| 37 | ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව | 4 | 560 | 498 | 0 | සති 12 | දේශීය |
| 38 | රාජ්‍ය භාෂා ප්‍රවීණතා දෙමළ භාෂා පාඨමාලාව ( පැය 200) | 4 | 400 | 290 | 101 | පැය 200 | දේශීය |
| 39 | රාජ්‍ය භාෂා ප්‍රවීණතා දෙමළ භාෂා පාඨමාලාව ( පැය 150) | 54 | 3950 | 3435 | 0 | පැය 150 | දේශීය |
| 40 | රාජ්‍ය භාෂා ප්‍රවීණතා දෙමළ භාෂා පාඨමාලාව ( පැය 100) | 6 | 600 | 227 | 194 | පැය 100 | දේශීය |
| 41 | රාජ්‍ය භාෂා ප්‍රවීණතා ද්විතීයික මට්ටම පැය 150ක සිංහල භාෂා පුහුණු පාඨමාලාව | 7 | 350 | 341 | 0 | පැය 150 | දේශීය |
| 42 | මූලික අරාබි භාෂා පුහුණු පාඨමාලාව | 2 | 60 | 24 | 29 | දින 32 | දේශීය |
| 43 | රුසියානු භාෂා උසස් පුහුණු පාඨමාලාව | 1 | 20 | 19 | 0 | දින 24 | දේශීය |
| 44 | මූලික රුසියානු භාෂා පුහුණු පාඨමාලාව | 2 | 40 | 19 | 17 | දින 24 | දේශීය |
| 45 | මූලික චීන භාෂා පුහුණු පාඨමාලාව | 1 | 26 | 24 | 0 | දින 32 | දේශීය |
| 46 | චීන භාෂා පුහුණු පාඨමාලාව(දෙවන අදියර) | 1 | 33 | 28 | 0 | දින 32 | දේශීය |

| අ.අ | පාඨමාලාවේ නම | පවත්වා ඇති පාඨමාලා ගණන | ඉලක්කගත පාඨමාලාලාභීන් සංඛ්‍යාව | පුහුණු කර ඇති පාඨමාලාලාභීන් සංඛ්‍යාව | පුහුණුව ලබමින් සිටින නිලධරයන් සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) |
|---|---|---|---|---|---|---|---|
| 47 | චීන භාෂා පුහුණු පාඨමාලාව(තෙවන අදියර) | 1 | 23 | 23 | 0 | දින 32 | දේශීය |
| 48 | කොරියානු භාෂා සහතිකපත් පාඨමාලාව (පළමු අදියර) | 1 | 30 | 21 | 0 | දින 40 | දේශීය |
| 49 | කොරියානු භාෂා සහතිකපත් පාඨමාලාව (දෙවන අදියර) | 2 | 52 | 38 | 0 | දින 40 | දේශීය |
| 50 | කොරියානු භාෂා උසස් සහතිකපත් පාඨමාලාව (දෙවන අදියර) | 1 | 12 | 12 | 11 | දින 40 | දේශීය |
| | එකතුව | **299** | **14317** | **11684** | **554** | | |

**මූලාශ්‍රය - ජාතික පොලිස් අභ්‍යාස ආයතනය**

වගු අංක **60** **පරිගණක පුහුණු මධ්‍යස්ථානය මගින් සිදු කරන ලද පුහුණු වැඩසටහන්**

| අනු අංකය | | ප්‍ර.පො.ප. | කා.ප්‍ර.පො.ප. | පො.ප. | කා.පො.ප. | උ.පො.ප. | කාර්/කා.උ.පො.ප. | කා.උ.පො.ප. | මහ සැරයන් | පො.සැ. | කාර්/ම.සැ. | කා.පො.සැ. | පො.කො. | කා.පො.කො. | පො.කො.රි. | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | කාණ්ඩ අංක 01 | 1 | - | 1 | - | 1 | - | 1 | - | 19 | - | 2 | 39 | 10 | - | **74** |
| 2 | කාණ්ඩ අංක 02 | - | - | - | - | 1 | - | 1 | - | 6 | - | 2 | 52 | 14 | - | **76** |
| 3 | කාණ්ඩ අංක 03 | - | - | - | - | - | - | 1 | - | 14 | - | 1 | 44 | 16 | - | **76** |
| 4 | කාණ්ඩ අංක 04 | 1 | - | 1 | - | 1 | - | - | - | 8 | - | 1 | 46 | 17 | - | **75** |
| 5 | කාණ්ඩ අංක 05 | 2 | - | - | 1 | 2 | - | - | - | 7 | - | 2 | 39 | 19 | - | **72** |
| 6 | කාණ්ඩ අංක 06 | 1 | - | - | 1 | 2 | - | - | - | 12 | - | 1 | 40 | 18 | - | **75** |
| 7 | කාණ්ඩ අංක 07 | - | - | - | - | 3 | - | - | - | 16 | - | 2 | 49 | 6 | - | **76** |
| 8 | කාණ්ඩ අංක 08 | 1 | - | 1 | 2 | 3 | - | 2 | - | 13 | - | - | 43 | 10 | 1 | **76** |
| 9 | කාණ්ඩ අංක 09 | 2 | - | 2 | - | 3 | - | 1 | - | 14 | - | 3 | 40 | 8 | 1 | **74** |
| 10 | කාණ්ඩ අංක 10 | 1 | - | 1 | 1 | 2 | - | 1 | - | 15 | - | 2 | 36 | 14 | - | **73** |
| එකතුව | | 9 | 0 | 6 | 5 | 18 | 0 | 7 | 0 | 124 | 0 | 16 | 428 | 132 | 2 | **747** |

**මූලාශ්‍රය - තොරතුරු තාක්ෂණ කොට්ඨාසය**

- ආයතනයේ කාර්ය සාධනය සඳහා පුහුණු වැඩසටහන් වල දායකත්වය

ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය භාරය සාර්ථකව ඉටු කිරීම තුළින් එහි කාර්ය සාධනය ඉහළ නංවා ගැනීම සඳහා අවශ්‍ය න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම නිලධරයන්ට ලබා දීම පුහුණු වැඩසටහන් මගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව 98000 කට ආසන්න මානව සම්පත සඳහා විධිමත් පුහුණුවක් ශ්‍රී ලංකා පොලීසිය සතු පොලිස් විද්‍යාල, පොලිස් අභ්‍යාස ආයතන සහ සේවස්ථ පුහුණු ඒකක මගින් ලබාදෙනු ලබන අතර, නව තාක්ෂණික දැනුම, භාෂා දැනුම මෙන්ම නීතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තුළින් අපරාධ මැඩලීම සහ සමාජ සුරක්ෂිතභාවය ගොඩනැගීමට මෙම පුහුණු වැඩසටහන් මගින් ප්‍රබල දායකත්වයක් සපයනු ලබයි.

එමෙන්ම නිරවුල්ව රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය මානසික මට්ටම වර්ධනය කිරීම සඳහා අදාළ වන පාඨමාලා ද පුහුණු වැඩසටහන් වලට ඇතුළත් වේ. ඊට අමතරව සමාජ විද්‍යාත්මක දැනුම ලබා දීම තුළින් ද සමාජය පිළිබඳව නිලධරයන්ගේ දැනුම සහ ආකල්ප ඉහළ නැංවීමද ආයතනයේ කාර්ය සාධනය සඳහා ඉවහල් වේ.

# පරිච්ඡේදය 07

## 7.1 අනුකූලතා වාර්තාව

වගු අංක 61

| අනු අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | අනුකූල වේ | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල වේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.6 | වෙනත් | අනුකූල වේ | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA 1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | ශ්‍රී ලංකා පොලීසියේ සෑම කාර්තුවක් සඳහාම අභ්‍යන්තර විගණන විමසුම් 90 ත් 100 ත් අතර, ප්‍රමාණයක් නිකුත් කරන අතර, ඒ සඳහා අංශ කිහිපයකින් පිළිතුරු ගෙන්වා ගත යුතු බැවින් පිළිතුරු ලබා දීමේ ප්‍රමාදයක් පවතී. | විගණන විමසුම් ඉදිරිපත් කිරීම හා පිළිතුරු ගෙන්වා ගැනීම විද්‍යුත් ලිපිනයන් ඔස්සේ සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, නියමිත දිනට පිළිතුරු වාර්තා කරන ලෙස දැනුම් දී ඇත. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03 ක් 2025 වර්ෂය තුළ පවත්වන ලදී. | DMA චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නියමිතව ඇත. |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01-2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | ශ්‍රී ලංකා පොලීසියේ 85000 ක පමණ කාර්යය මණ්ඩලයක් සේවයේ නියුක්තව ඇති අතර, එම නිලධාරීන් අතරින් වැඩ තහනම් වීම, සේවය අතහැර යාම, සේවයෙන් පහ කිරීම වැනි හේතු නිසා මෙම ණය ශේෂයන් පවතී. | දීර්ඝ කාලයක සිට පවතින අයකර ගැනීමට නොහැකි ණය ශේෂයන් අයකරගැනීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවා ඇති ණය අයකරගැනීමේ කමිටු ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත. |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වු තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබු ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට මහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනිමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරිම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන්කර තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

**මූලාශ්‍රය- ප්‍රධාන අභ්‍යන්තර විගණක**